
# අක්ෂිය

2017 ජූලි 23 වන ඉරිදා | පළමු කාණ්ඩය-පළමු කලාපය | මිල - රු. 20

අනාගතයේ සිදුවන දේ ගැන අප දන්නවානම්, එය පැහැදිලි නම් මිනිසෙකුට ලිවීමට උත්තේජනයක් ඇතිවිය හැකි ද? ඔබ ඔබේ ඉදිරිය ගැන නොදන්නාතාක් කල් ඒ නොදත්-කම හමුවේ ලිවීමට ඇතිවන පෙළඹවීම මැඩගත නොහැක්කකි.

මිචෙල් ෆූකෝ



# දුම නැති දුම්කොළ නිෂ්පාදන තහනම්

නලිනිකා ලක්ෂාණි

දුම රහිත දුම්කොළ නිෂ්පාදන පසුගිය 19 වන දා සිට නිෂ්පාදනය කිරීම, ආනයනය හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම සපුරා තහනම් කිරීමට ජාතික දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ අධිකාරිය තීරණය කර තිබේ. මේ අනුව දුම්කොළ අඩංගු 'බුලත්විට' හැදීමත් විකිණීමත්, දුම් රහිත දුම්කොළ හා පුවක් භාවිතයෙන් නිපදවා ඇති මාවා, ගුට්කා, පාම්පරාග්, හාන්ස්, බාබුල් සහ බීඩා යනාදිය අලෙවිය නිෂ්පාදනය හා ගෙන්වීම 19 දා සිට තහනම් කර ඇත. ජාතික දුම්කොළ සහ මද්‍යසාර අධිකාරියේ සභාපති වෛද්‍ය පාලිත අබේකෝන් මහතා මේ බව ප්‍රකාශ කළේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ පසුගිය (18) දා පැවැති මාධ්‍ය හමුවේදී ය. ඒ අනුව 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතේ තහනම් දුම්කොළ පිළිබඳ 2016 අංක 01 දරන නියෝගය දැඩිව ක්‍රියාත්මක වන වේ.

බුලත්විට විකිණීම මෙන් ම දුම්කොළ සහිත 'බුලත්විට විකිණීමට තිබේ' යනුවෙන් සඳහන් දැන්වීමක් පවා ප්‍රදර්ශනය එම නියෝග අනුව තහනම් බව අධිකාරිය පවසයි. දුම රහිත දුම්කොළ අඩංගු ඉහත ද්‍රව්‍ය අලෙවි කරන්නන් අල්ලා නීතිය හමුවට ඉදිරිපත් කිරීම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට, ආහාර පරීක්ෂකයන්ට, සුරාබදු නිලධාරීන්ට සහ පොලිස් නිලධාරීන්ට බලය ලබා දී ඇත.

ජනතාව මුඛ පිළිකාවෙන් බේරා ගැනීම මෙන් ම දුම් රහිත දුම්කොළ හා සම්බන්ධ පිළිකා නිසා වසරකට සිදුවන දහසකට අධික මරණ සංඛ්‍යාව වළකා ගැනීම හා වසරකට වැය වන රුපියල් බිලියන 05ක වියදම අවම කර ගැනීම ද මේ පියවර ගැනීමේ අරමුණු අතර වේ.

## ඉන්දියාවේ නව ජනාධිපති රාම් නාත් කෝවින්ද්



මධූෂා ශෙහානි

71 හැවිරිදි රාම් නාත් කෝවින්ද් ඉන්දියාවේ 14 වැනි ජනාධිපතිවරයා ලෙස තේරී පත්ව ඇත. ඉකුත් 17 වන දා ඉන්දීය ජනාධිපතිවරණ ඡන්ද විමසීම පැවැත්වූ අතර මේ මස 25 වැනිදා ඔහු රාෂ්ට්‍රපති භවන්හිදී දිවුරුම් දීමට නියමිතයි. බිහාර් ප්‍රාන්තයේ හිටපු ආණ්ඩුකාරවරයෙකු වූ භාරතීය ජනතා පක්ෂයේ රාම්නාත් කෝවින්ද් ඡන්ද සටනේ එක් ප්‍රධාන චරිතයක් විය. ඔහුගේ ප්‍රතිවාදී අපේක්ෂිකාව වී ඇත්තේ ලෝක සභාවේ හිටපු කථානායිකාවක වන ඉන්දීය කොංග්‍රස් පක්ෂයේ මීරා කුමාර් ය.

1945 වසරේ ඔක්තෝබර් මස 01 වැනිදා උපන් රාම්නාත් කෝවින්ද් එරට ජනාධිපති ධූරය හොබවන දෙවැනි "දලිත්" පුරවැසියායි. වත්මන් ජනපති ප්‍රනාබ් මුඛර්ජිගේ ධූර කාලය මේ මස 25 වනදායින් අවසන් වේ

## උපාධිධාරීන් රාජ්‍ය සේවයට කැබිනට් අනුමැතිය හිමිවේ

නිමේෂා ගමගේ

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලැබීමෙන් පසු හඳුනාගත් පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට නියමිත ය.

ඒ ඒ අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවලට වසරක පුහුණු කාලයකට යටත්ව දිස්ත්‍රික් පදනම මත එම උපාධිධාරීන් බඳවා ගැනීමට සියලු කටයුතු සූදානම් කර ඇත. දත්ත හා තොරතුරු රැස් කිරීම, වාර්තා සකස් කිරීම ආදී කාර්යයන් සඳහා උපාධිධාරීන්ගේ සේවය අවශ්‍ය වී ඇති බව කැබිනට් මණ්ඩලය තීරණය කර ඇති බව වාර්තා වේ.

## කට්ටිගෙ ජවුසම

**නිල් සහ කොළ**

සිල්පර කොටන් තලාගෙන
සමාන්තරව ගමන්කරන
පීලි දෙකකට
එක්ව ගමන් කිරීම
ෆැන්ටසියකි

## රාජිතගේ ෆයිල් ඇරෙයි දූෂණ විමර්ශනය වැසෙයි

ඉෂාරා ගුණතිලක

වංචාව දූෂණය නැති කරනවා යැයි පොරොන්දු දෙමින් බලයට පත් වූ ආණ්ඩුව දූෂණ විමර්ශන ලේකම් කාර්යාලය වසා දමා මේ කරමින් සිටින්නේ තවත් හොරු රකින එක යැයි පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ කාර්යාලයේ දී (12) පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී පැවසීය. එහි දී ඔහු මෙසේ ද පැවසීය.

''මේ ආණ්ඩුව බලයට පත් වෙන්න කලින් දුන්න ප්‍රධාන ම පොරොන්දුව තමයි රටේ වංචාව දූෂණය නැති කරනවා කියන එක. දින 100 ප්‍රතිපත්තිය තුළත් මැතිවරණ වේදිකාවලත් ඔවුන් එහෙම කිව්වා. ජනතා බලපෑම නිසා ම 2015.02.19 වෙනකොට ආණ්ඩුව දූෂණ විරෝධී ලේකම් කාර්යාලයත්, FCID එකත් පිහිටවනවා.

මේ දූෂණ විමර්ශන ලේකම් කාර්යාලයේ මූලික කාර්ය වුණේ පහුගිය කාලේ සිද්ධ වුණු දූෂණ ගැන පැමිණිලි කරන්න ජනතාවට පුළුවන් වීමයි. එහෙම භාරගන්න පැමිණිලි මූලික විමර්ශනවලට භාජනය කරලා අදාළ අංශවලට යොමු කළේ අග්‍රාමාත්‍ය කාර්යාලය හරහා. දූෂණ විරෝධී ලේකම් කාර්යාලයට ලැබෙන පැමිණිලි වර්ගීකරණය කරනවා. බොහෝ පැමිණිලි අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමටත්, FCID යත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත්, අදාළ අමාත්‍යංශවලටත් යොමු කරනවා. මේ වෙද්දී පැමිණිලි 1148ක් ප්‍රධාන ආයතන වෙත යොමු කරලා තියෙනවා. FCID යත් පොලීසියට ඒ පැමිණිලිවලින් 32 ක් යොමු කළා.

2 පිටුවට

## සුපිරි පක්ෂය ගැන ජනපති හෙළිදරව්ව

නිමේෂා ගමගේ

වෘත්තීයවේදීන්, අධ්‍යාපනඥයින් සහ කෝටිපති තරුණ ව්‍යාපාරික පිරිසක් ඇතුළු රටේ බුද්ධිමතුන්ගේ එකතුවකින් අලුත් දේශපාලන පක්ෂයක් පිහිටුවීමට මේ දිනවල සාකච්ඡා පැවැත්වෙමින් තිබෙන බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඉකුත්දා පැවති ශ්‍රී.ල.නි.ප. මාසික මධ්‍යම කාරක සභා රැස්වීමේ දී අනාවරණය කොට තිබේ.

ජනාධිපතිවරයා මේ පිළිබඳ අනාවරණය කර ඇත්තේ ශ්‍රී.ල.නි.ප.යේ ඇමතිවරුන් ආණ්ඩුවෙන් ඉවත් වන බව දක්වමින් ඩුලිප් විජේසේකර, ජෝන් සෙනවිරත්න ඇතුළු කීපදෙනෙක් දැක්වූ අදහස්වලට පිළිතුරු දෙමිනි.



## රටෙන් භාගෙකට ඩෙංගු

ඉෂාරා ගුණතිලක

**වසරේ ගෙවී ගිය කාලය තුළ ඩෙංගු උණ රෝගීන් 95000ක් පමණ වාර්තා වී ඇති බවත් එසේ වුවත් ඩෙංගු මරණ සංඛ්‍යාව 0.03% දක්වා පහළ ගොස් ඇති බව ජාතික ඩෙංගු මර්දන ඒකකයේ ජාතික සම්බන්ධීකාරක විශේෂඥ වෛද්‍ය හසිත තිසේරා මහතා පැවසී ය.**

මේ වන විට රට පුරා දිස්ත්‍රික්ක 12කට තදින් ම ඩෙංගු රෝගය බලපෑම් කරලා තිබෙනවා. මේක ඩෙංගු අධි වසංගත තත්වයක් විදිහට සලකන්න පුළුවන්. ඩෙංගු වෛරස තත්වය වෙනස් වීමත් ඒ වගේ ම කඩින් කඩ ඇතිවුණ වැසි තත්වයත් මේකට හේතුවක්. කොහොම වුණත් වාර්තා වෙන ඩෙංගු රෝගීන් වැඩි වුවත් මරණ සංඛ්‍යාවේ අඩු වීමක් තියෙනවා. මේ වන විට බස්නාහිර පළාතේ ඩෙංගු රෝගී මරණ 136 ද මධ්‍යම පළාතේ මරණ 20ක් ද සබරගමු පළාතේ 27ක් ද දකුණු පළාතේ 29ක් ද වාර්තා වෙලා තියෙනවා.

අපි මේ ඇතිවී තිබෙන ඩෙංගු අධි වසංගත තත්ත්වයෙන් මිදීමට එක්ව කටයුතු කළ යුතු වෙනවා. ඒකට ජනමාධ්‍ය මගින් විශාල කාර්යභාරයක් කළ යුතු යැයි ඒ මහතා වැඩිදුරටත් පැවසී ය.

## මුවාගේ කොළම

# ජුජුස් කා සැනසෙමු

සමහර වැසි පාත්වෙන්නේ ඇසිපිය හෙලන ක්ෂණයකිනි. නමුත් ඇතැම් අවස්ථාවල වැස්සේ ස්වභාවය පූර්වයෙන් නිර්ණය කළ නොහැකිය. ගොරවයි, විදුලි කොටයි, හෙණ ගසයි, පරිසරය විලම්භීත විපරීත කරයි. කට්ට කර්කෂ නියඟයට හසුවූවෝ වැසි ලැබීමේ පෙර නිමිත්තෙන් ආහ්ලාදයට පත්වෙයි. නමුත් වැස්සක් තියා පොදයක් නොවැටෙයි. සද්දය පුස්සක් වෙයි. 20 වන ව්‍යවස්ථා සංශෝධනය ද එසේමය. අපි උඩ බලා සිටිමු.

ළදරුවෙකුට ජුජුස් කැල්ලක් දුන් විට විගසින් ඇඩීම නතර කරයි. ජුජුසේ බලය රැඳී තිබෙන්නේ මඳ වේලාවකි. නැවතත් ඔහු පෙරටත් වැඩියෙන් හඬයි. අපි ජුජුස් කෑමට උපන් හපනෝ වෙමු. ජුජුසේ රසය ගිය පසුව නැවතත් පෙරලි පෙරලී හඬමු. මෙලෙස දීර්ඝ කාලයක් තිස්සේ ජුජුස් කෑමෙන් පසුව මුලින්ම අප හැඬුවේ කුමටද කියාවත් සිහියට නොඑයි. දැන් අපි හඬන්නේ ජුජුස් කන්නටය. එනම් සීනි බෝල පිළියම් ගිලින්නය. ඒ සීනි තවරන ලද ආටෝපකාර පිළියම්වලට අපි ඇබ්බැහි වී සිටින්නෙමු. ජනතාව සැබෑ ප්‍රශ්නවලින් විතැන් කරමින් ඔවුන්ගේ න්‍යාය පත්‍රවලට ජනතාව නටවමින් සිටිමු. මෙය ඉතිහාසගතව පරිණාමය වෙමින් ඇත. 1978 දී දෙවෙනි ජනරජ ව්‍යවස්ථාව භාවිතයට ආ තැන් පටන් 19 වතාවක් ව්‍යවස්ථා සංශෝධන වී ඇත. ඉන් 16ක් ම සංශෝධනය වී ඇත්තේ එය පිහිටවූ ජේ ආර් ජයවර්ධන මහතාගේ 1978-1989 කාල පරාසය තුළයි.

මෙම කිසිඳු සංශෝධනයක් තුළින් ජනතාව විසින් ඉල්ලන විධායකයේ බල සීමා කිරීමට එකඟ වීද ඉන් අනතුරුව නැවතත් චන්ද්‍රිකා කුමාරතුංග මහින්ද රාජපක්ෂ යන හිටපු ජනාධිපතිවරුන් යටතේ සංශෝධනය විය. වර්තමාන ජනාධිපතිතුමන් යටතේ 19 ගෙන ආවේය. ඒ සිවිල් සංවිධාන සහ රටේ වගකිව යුතු පාර්ශවයන් දීර්ඝ කාලයක් තිස්සේ හැඬීමෙන් ලද ප්‍රථිපලයකි. සම්මුතිගත ආණ්ඩුව කිරුළ පැළඳියේ ඒ සංවිධාන සහ විකල්ප බලවේග යන්ට පින්සිද්ද වෙන්නය. දැන් නැවතත් හොරු එලියේ කරක් ගසති. දූෂණ විමර්ශන කොමිසම කල් ඉකුත් වී වැසීමට යෝජනාවෙති ඥානසාරලා රකිති සිසුන්ට පහරදෙති.

සම්මුතිගත ආණ්ඩුව කිරුළ පැළඳියේ ඒ සංවිධාන සහ විකල්ප බලවේගයන්ට පින් සිද්ධ වෙන්නය. දැන් නැවතත් 20 ගෙන එන ලෙස වාමවාදී ඇතුලු පෙර සංවිධාන සියල්ල හඬ නගමින් සිටියි. අස්ගිරියේ පාර්ලිමේන්තුව නව නීති සම්පාදනය කරමින් ඇත. ජනපතිට ඍජුව තීරණ ගන්නට කොන්දක් නැත. දැන් නැවතත් ආණ්ඩුව 20 ජුජුසක් ලෙස සරසමින් සිටී. පුංචි ඡන්දෙට බාලගිරි දෝසේ වැළඳී ඇත. ආණ්ඩුව මැතිවරණ සිතියම අකුලමින් සිටී. නමුත් මේ කිසිවකට මන්ත්‍රී වරුන්ගෙන් විරෝධත්වයක් පල නොවෙයි. ජනතාව ඇතුලු සංවිධාන මොනයම් ආකාරයෙන් අරගල කළ ද පළාත් පාළන මැතිවරණ පැවැත්වීමට පාර්ලිමේන්තුවේ කිසිදු පක්ෂයකට සැබෑ වුවමනාවක් දක්නට නොමැත. එජාපය, ශ්‍රීලනිප, ජවිපෙ යන පාර්ශව තුනට ම මැතිවරණයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් නැතිබව ඉතා පැහැදිලිය, ඔවුන්ට අවශ්‍යය තම නම රැකගෙන සිටීමටය. ජුනි 1 දා සිට නව පළාත් පාලන පනත බලාත්මක වෙයි, එතෙක් අපි බලා සිටිමු.

දැන් ජුජුස රස ගන්වා අවසන් ය. එය රස ගන්වා ඇත්තේ අපගේ රසට ගැලපෙන පරිදිමය. මේ වේලාවේ දිව ඉල්ලන්නේ ව්‍යවස්ථා සංශෝධනයයි. මෙවර ජුජුස රස ගැන්වෙන්නේ ව්‍යවස්ථාවෙනි. මැතිවරණය ආසන්න වන විට ජුජුස එලි බසිනු ඇත එවිට ජනතාව එයින් උද්දාමයට පත්වී ජුජුස් කයි. පුංචි ඡන්දයෙන් අනතුරුව නැවතත් සංශෝධන අතුරුදහන් වනු ඇත. මේ ගොනා අර අඳින්නේ පොල් පැලය කන්නට බව සිහි තබා ගෙන ජුජුස් කමු, මන්ද මේ ජුජුස් කෑමේ වින්දනය ඉතිහාසයේ පටන් පැවත එන්නක් නිසා ය.

# අලුත් වෛද්‍ය සංගමයක් පිහිටුවයි

**නිසන්සලා තෙන්නකෝන්**

ශ්‍රේණිගත වෛද්‍යවරුන්ගේ සංගමය නමින් වන සංවිධානයක් පිහිටා තිබෙන අතර එහි මහා සභා රැස්වීම පසු ගියදා (19) කොළඹ පදනම් ආයතනයේ දී පැවැත්විණි. මීට ඉහත දී බහුවිධ අංශයන්හි නිපුණතා පූර්ණ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය නමින් ක්‍රියාත්මක වූ සංගමය (ශ්‍රේණිගත වෛද්‍යවරුන්ගේ සංගමය) නමින් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බව එම සංගමයේ ලේකම් වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න මහතා පැවසී ය.

රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය ඉකුත් වසර දෙකක පමණ කාලය තුළ වෛද්‍යවරුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී නොසිටීම නිසා කළකිරීමට පත් වෛද්‍යවරුන් විශාල පිරිසක් තම සංගමය හා එක්ව සිටින බව රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය වෛද්‍යවරුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් පසෙකලා වෙනත් න්‍යාය පත්‍රයකට කටයුතු කරන හෙයින් නව සංගමය වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක කරන බව ද වෛද්‍ය නිරෝෂණ ප්‍රේමරත්න මහතා පැවසී ය. ශ්‍රේණිගත වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිවරයා ලෙස වෛද්‍ය රුචිර සරණපාල මහතා කටයුතු කරයි.

# ආණ්ඩුවේ රෝම කූපයක්වත් හොලවන්න කාටවත් බෑ

**ඉෂාරා ගුණතිලක**

පවතින තත්වය තුළ ආණ්ඩුව වඩාත් සුරක්ෂිත බවත් ආණ්ඩුවේ රෝම කූපයක්වත් සෙලවීමට කිසිවෙකුටත් නොහැකි බවත් අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම යනු රාජපක්ෂවරුන් දකින සිහිනයක් බවත් 16 වනදා සිරිකොත පක්ෂ මූලස්ථානයේ පැති මාධ්‍ය සාකච්ඡාවකට එක් වෙමින් දකුණු පළාත් පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුලාල් බණ්ඩාරගම මහතා පැවසී ය. ඔහු වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

බලය හා තම පවුල පමණක් තම අභිප්‍රාය කරගත් පිරිසක් ආණ්ඩුව වට්ටන්න හැදුවත් එය කවදාවත් සාර්ථක වෙන්නෙන් නෑ. මම කියන්න කැමතියි අපි කුමන ලෙසකින්වත් මේ ආණ්ඩුව අස්ථාවර වෙන්න ඉඩ තියන්නේ නෑ කියලා. අද වෙනකොට අපේ රටේ ආර්ථිකය යම් තරමකට ස්ථාවරයකට පත් වෙමින් තිබෙනවා. නමුත් දේශීය විදේශීය ආයෝජකයන් නැවැත්වීමට ආණ්ඩු විරෝධීන් ක්‍රියා කරනු ඇති බවට අපට සැකයක් පැවතෙනවා. ජාතික ආණ්ඩුව අමාරුවෙන් දිනාගෙන යන මේ ගමන මැද්දට පැනලා කූඤ්ඤ ගලවන්න හැදුවොත් රාජපක්ෂට වෙන්නෙ පංච තන්ත්‍රයේ තියෙන දේ. එහෙම වුණොත් එයාට වෙන්නෙත් අර වඳුරට වෙච්ච දේ තමයි. ජනාධිපතිවරණය කලින් තියලා ගත්ත අන්ත පරාජයට වඩා පරාජයක් වෙනවා කියලා අපි කියන්න කැමතියි. කොහොම හරි මෛත්‍රීපාල සිරිසේන මහතා රට භාරගන්නකොට මීතොටමුල්ලට වඩා වැඩි ණය බර කියන කුණු කන්ද තිබ්බා අද ඒක අපි ටිකෙන් ටික වෙනස් කරමින් යනවා. පවතින තත්වය තුළ මා ප්‍රමුඛ පසුපෙළ ප්‍රාදේශීය දේශපාලකයන් සියල්ලක් ම ආණ්ඩුව රැක ගැනීමට කටයුතු කරන බව ඔහු මෙහි දී පැවසීය.

# මීතොටමුල්ල කුණු කන්ද ඉවතට

**නිමේෂා ගමගේ**

මිනිස් ජීවිත තිස් ගණනකට මරු කැඳවමින් තවත් පිරිසකට බරපතල තුවාල සිදු කොට වාසස්ථාන අහිමි කළ මීතොටමුල්ල කුණු කන්ද එම ස්ථානයෙන් ඉවත් කිරීමේ කටයුතු ලබන මාසයේ ආරම්භ කරන බව නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

කුණු කන්ද තවදුරටත් නාය යෑම වැළැක්වීම සඳහා යුධ හමුදාවේ තාක්ෂණික සහය ලබා ගනිමින් ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කරන බවත් මිතොටමුල්ලේ සිට කැලණිය දුම්රිය ස්ථානය දක්වා ලොරිවලින් ද එතැන් සිට පුත්තලම දක්වා දුම්රියෙන් ද මෙම කුණු ප්‍රවාහනය කරන බවත් සඳහන් වේ. අක්කර දෙකක පමණ ප්‍රමාණයකින් යුත් මෙම කුණු කන්ද ඉවත් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකර එම ප්‍රදේශය සංවර්ධනය කරන ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා නාගරික සංවර්ධන අධිකාරියට උපදෙස් ලබා දී ඇත.

1 වන පිටුවෙන්

# දූෂණ විමර්ශන ...........

දූෂණ විමර්ශන ලේකම් කාර්යාලයේ වියදම් ගැන පහුගිය දවස්වල ලොකු කතාබහක් ඇතිවුණා. ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේදීත් මේ ගැන කතා කළා. ඔහු කිව්වා මේ කාර්යාලයෙන් හොයන්නෙ ආණ්ඩුව පැත්තෙ අයගෙ පොඩි පොඩි වැරදි විතරයි. අනිත් වැරදි කරපු අයගෙ ඒවත් හොයන්න කියලා. ෆවුසි ඇමතිගේ වාහනය ගැනත් ප්‍රියංකර ඇමතිගේ දුවගේ පත්කිරීම ගැනත් මේකෙදී කතා කරලා තියෙනවා. මේ කාර්යාලයට වසර දෙකයි මාස පහක කාලය ඇතුළත මිලියන 32ක් වියදම් වෙලා තියෙනවා. මිලියන 409ක් වියදම් වෙලා තියෙනවා කියන එක සම්පූර්ණ වැරදියි. ඒක ආණ්ඩුව හිතාමතා ම හදපු බොරුවක්. ආණ්ඩුවට අවශ්‍ය වෙලා තියෙන්නෙ දූෂණ විමර්ශන කාර්යාලය වහලා දාන්න. සාවද්‍ය මත ප්‍රකාශ කරලා තමන්ගෙ වැරදි වහගන්න මේක හොඳ උපක්‍රමයක්.

පහුගිය දවස්වල FCID එක මගින් දූෂණ කළ පුද්ගලයන්ට එරෙහිව නඩු දාලා රජයට අහිමිවුණු මුදල් විශාල වශයෙන් අයකර ගත්තා. CSN ආයතනයෙන් රුපියල් මිලියන 159ක් අයකර ගත්තා. රාජපක්ෂලා හැදුව සොහොන් ස්මාරකේටත් මිලියන 159ක් ගෝඨාභය රාජපක්ෂ කඩිනමින් බැන්ඳා වගේ ම මල්වානෙන් ඉඩම ගැනත් විමර්ශනය කළා. අන්තිමට ඒ ඉඩමට අයිතිකාරයෙක් නෑ කියලත් කිව්වා. ඒකෙ වටිනාකම විතරක් මිලියන 300ක්. ඒක රජයට පවරා ගත්ත හින්දා රජයට පුළුවන් වුණා මිලියන 300ක් ආපහු ලබා ගන්න. නාමල්, බැසිල්, විමල් වීරවංශ රාජ්‍ය බලය අයතා ලෙස පාවිච්චි කරලා ගුවන් ගමන් ගියා. ඔවුන්ගෙනුත් රුපියල් මිලියන 16ක් පවරා ගත්තා.

රාජිත ඇමති කියපු විදිහට ෆවුසි ගැනත් ප්‍රියංකරගේ දුවගේ පත්වීම ගැනත් දූෂණ විමර්ශණ කාර්යාලයට පැමිණිල්ලක් ලැබිලත් නෑ. ජනාධිපති ඇතුළු මුළු ආණ්ඩුව ම අද කරන්නේ සම්පූර්ණ වංචාවක්. එහෙම කරන්නෙ නොදන්නාකමට නෙමෙයි හිතාමතා ම මේ දේවල් වහනවා. පැමිණිලි 481න් බරපතල මූල්‍ය අපරාධ ගැන පරීක්ෂා කරනවා. මේවා ප්‍රමාද වෙන්න හේතුව දේශපාලන බලපෑම්, මැදිහත්වීම්. වර්තමාන ආණ්ඩුවේ ඇමතිවරු ගැනත් විමර්ශන සිද්ධ වෙනවා. ජනාධිපති දැනගන්න ඕන හොරුන්ව ඔඩොක්කුවට දාගන්න එක වැරදියි කියලා.

පහුගිය කාලේ ධීවර ඇමති වෙලා හිටිය රාජිත සේනාරත්න ඇමතිවරයා 2014 ඔක්තෝබර් 30 වෙනිදා අක්කරයයි පර්චස් 30යි බිල්ඩින් එකක් සහිත ඉඩමයි, මෝදර වරායෙයි වටිනාකම ලක්ෂ 17යි කියලා තක්සේරු කරලා තියෙද්දිත් අඩු මුදලකට ඒ කියන්නෙ රු. 125,000ට බ්‍රිතාන්‍ය සමාගමකට කුලියට දෙනවා. ඔහු මේක කරන්නෙ නීතියෙන් පිළිගන්න ටෙන්ඩර් පටිපාටියත් උල්ලංඝනය කරලා. රුපියල් කෝටි 47ක පාඩුවක් ධීවර ඇමති කරලා තියෙනවා. මේවා ගැන විමර්ශන කෙරීගෙන යනවා. රවී කරුණානායක හිටපු මුදල් ඇමති අඩු තීරු බදු ගෙවලා සුඛෝපභෝගී වාහන නිදහස් කරගෙන තියෙනවා. අද ආණ්ඩුව හදන්නෙ මේ හොරු රකින්න.කැබිනට් මණ්ඩලය 11 වෙනිදා තීරණයක් අරගත්තා මේ දූෂණ විමර්ශන කාර්යාලය වහලා දාන්න. ඒකෙ නිලධාරීන් සේවය කරේ තමන්ගෙ ජීවිත ගැනවත් විශ්වාසයක් නැතුව. මේක වැහුවට පස්සෙ ජනතාව කොහොමද පැමිණිලි කරන්නෙ. අපි ජනතාවට කියනවා මේවට විරුද්ධව කටයුතු කරන්න කියලා යැයි ද ඔහු පැවසී ය.

# අනුරාධපුරයට පානීය ජලය මහවැලියෙන් මුදා හරියි

**නලිනිකා ලක්ෂාණි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ රැසකට මේ වන විට පවතින දැඩි නියඟය හේතුවෙන් වැව් විශාල සංඛ්‍යාවක් සිඳී ගොස් ඇත. මේ තත්වය හේතුවෙන් පානීය ජලය ලබා ගැනීමට අසීරු බව ප්‍රදේශවාසීහු පවසති. නගරවාසීන් සඳහා ජලය ලබා ගැනීමට ජල ප්‍රවාහන මණ්ඩලය විසින් මහවැලි අධිකාරියෙන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීම මත තුරුවිල ජලාශය සඳහා මහවැලියෙන් අක්කර අඩි 2000 ක ජල ධාරිතාවයක් මේ වන විට මුදා හැර තිබේ. අනුරාධපුර නගරයේ පවුල් එක්ලක්ෂ පනසදහසක් සඳහා ජලය සපයනු ලබන තුරුවිල ජලාශයේ ජල මට්ටම ද මේ වන විට ඉතා සීඝ්‍රයෙන් පහළ ගොස් ඇත.

**යූ.එන්.පී.යයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි එකතුවෙලා පිහිටුවා ගත්ත සම්මුතිවාදී ආණ්ඩුවක් ඒක මේ අගෝස්තුවලින් අවසන් වෙනවා. ඔබ ඒ ගැන මොකද හිතන්නේ?**

මම පිළිගන්නේ නෑ යූ.එන්.පීයයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි පිහිටුවාගෙන තියෙන්නේ සම්මුතිවාදී ආණ්ඩුවක් හෝ ජාතික ආණ්ඩුවක් කියලා. ඒක බල හවුලක් විතරයි. සම්මුතිවාදයක් නම් ඒ සම්මුති මොනවා ද? එහෙම නැත්තම් සම්මුතිවාදී ආණ්ඩුවක් කියලා කියනකොට ඒකට ජනතාව සම්බන්ධයි නෙ. එතකොට ඒකේ කොටස්කාරයෝ වෙන්න ඕන ජනතාව. ජනතාව එහෙම කොටස්කාරයෝ නොවෙනවා නම් ජනතාවගේ නියෝජිතයෝ විදිහට සම්මුතිවාදී යැයි කියන ආණ්ඩුව එකඟ වුණ ගිවිස ගත්ත ගිවිසුම් මොනවා ද? එහෙම කිසි දෙයක් දන්නේ නෑ. අනිත් කාරණාව මේක ජාතික ආණ්ඩුවකුත් නෙවෙයි.

# මේ ආණ්ඩුවේ අවසානය ද?

## ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක

ජාතික ආණ්ඩුව කියන එකේ දි තියන මූලික අර්ථකථනය හා ලෝක ජාතික ආණ්ඩු පිහිටුවලා තියන විදිහ බලනකොට මේක ජාතික ආණ්ඩුවක් කියල කියන්න බෑ. මේ ආණ්ඩුව පිහිටුවාගෙන තියෙන්නේ තනියම ආණ්ඩුවක් පිහිටුවා ගන්න බැරි සුළුතර ප්‍රමාණයක් ආසන හිමිවීම නිසා. තමන්ගේ දේශපාලන පක්ෂවලට ඒ තරම් විශාල බහුතර බලයක් පාර්ලිමේන්තුව තුළ නොලැබෙන දන්න නිසා ඔවුන් කල් ඇතුව තීරණය කරනවා මේ ජාතික ආණ්ඩුව කියන සංකල්පය පාවිච්චි කරනවා කියලා. එතකොට ඒ සංකල්පය පාවිච්චි කිරීමක් මිස මේක ජාතික ආණ්ඩුවක් නෙවෙයි. තමන්ගේ බලය රඳවාගෙන නැත්නම් දුර්වල බලයක් ශක්තිමත් බලයක් බවට පත් කිරීමට කරන ලද එක්තරා විදිහක බල ක්‍රීඩාවක් පමණයි. ඒ අර්ථයෙන් ගත්තම මම එකඟ නෑ මේක සමමුතිවාදී ආණ්ඩුවක් කියනවටවත් ජාතික ආණ්ඩුවක් කියල කියනවටවත්.



**මං හිතන්නේ අලුත් දේශපාලන ව්‍යාපාරයක අලුත් ආණ්ඩුවක් තමයි දැන් අවශ්‍ය. ප්‍රධාන පක්ෂ පාලනය කරන්න පුළුවන් දේශපාලන ක්‍රමයක් තියෙන්න ඕන. ඒ කියන්නේ ප්‍රධාන පක්ෂ නිකං ඇබිත්තයෝ වගේ කන්ට්‍රෝල් කරන්න පුළුවන් විදියේ මහජනයා බලවත් වන දේශපාලන ක්‍රමයක් තමයි දැන් අවශ්‍ය වෙන්නේ. ඒක වාමාංශික වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වෙන්න පුළුවන්.**

**■මේ පක්ෂ දෙක එකතුවෙලා කරන ආණ්ඩුව අවසන් වුණොත් ඒක රටට හොඳ වෙයි ද?**

රටට හොඳයි ද නරකයි ද කියන එක තීරණය වෙන්නේ මේ ආණ්ඩුව බිඳ වැටීම කියන කාරණයම නෙවෙයි. අංක එක මේ ආණ්ඩුව බිඳ වැටිය යුතුයි එහෙමත් නැතිනම් මේ ආණ්ඩුව අයින් වෙලා වෙනත් ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රියාවලියකට යා යුතුයි. දෙවෙනි කාරණය මේ ආණ්ඩුව බිඳ දැමීමෙන් රටට හොඳක් වෙනවද කියන එක තීරණය වෙන්නේ ඊළඟට බලයට පත්වෙන්නේ කවර සමාජ බලවේගයක් ද එම බලවේගය තමන්ගේ ආණ්ඩු බලය යම් කිසි දේශපාලන පක්ෂයකට ලබා දෙන්නේ නම් ඒ කවර සම්මුතීන්ට අනුව ද කියන එක. තුන්වෙනි කාරණය තමයි ඒ සම්මුති ක්‍රියාත්මක කිරීමට ඒ අදාළ පක්ෂය යම් කිසි කැප කිරීමක් උනන්දුවක් පෙන්නුම් කරයි ද කියන කාරණය. මේ ආණ්ඩුව බිඳ වැටීම පමණක් සමාජයට යහපතක් වෙයි කියලා මට කල් ඇතුව කියන්න බැහැ. හැබැයි මෙහෙම දෙයක් කියන්න පුළුවන්. හැබැයි දේශපාලන පෙළ ගැස්මකට සමගාමී වන ආකාරයෙන් ඊට සමාන ආකාරයෙන් ක්‍රියාත්මක වන ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරවල පෙළ ගැසීමක් පෙනෙන්නට නැතත් සමාජයට යහපතක් වීම සඳහා වූ දේශපාලන පෙළ ගැස්මක් සමාජය තුළ දැන් නිර්මාණය වෙමින් පවතිනවා. අපි යෝජනා කළ යුතුයි එවැනි ප්‍රගතිශීලී ව්‍යාපාරවල සංවිධානගත වීමක් සහ ඒ සංවිධාන ගතවීම ඇතුලේ ඉතාමත් ප්‍රගතිශීලී අරමුණු නිර්මාණය කරගෙන ඊට අදාළ වැඩපිළිවෙලක් සකස් කරගෙන කටයුතු කළ යුතුයි කියන එක.

**■මේ ආණ්ඩුව අගෝස්තුවලින් අවසන් වුණොත් එහෙමත් නැත්නම් දෙකට කැඩිලා වෙන් වුණොත් මොනවා වෙයි ද ?**

මම හිතන්නේ දෙකට වෙන් වුණත් වෙන්නේ මේ එකට ඉන්න කාලෙ වෙච්ච දේම තමයි. මොකද මේ මොහොතේ පවතින්නේ ආණ්ඩුවක් නෙවේ. ඉතාමත් විසිරුණු සහ ජාතික අභිලාෂයන්වලට කිසිම ආකාරයකින් ඇහුම්කන් දෙන්නේ නැති සහ ඒ වෙනුවෙන් වැඩ කරන්නේ නැති යම් යම් ආකාරයට විසිරුණු ක්‍රමයක්. ඒ කියන්නේ වැයික්කි වගේ. පොඩි පොඩි වැයික්කි ටිකක් තියනවා.

අනිත් පැත්තෙන් ගත්තම ඒ ඒ වැයික්කි වල උප වැයික්කි තියෙනවා. මේක එක්තරා විදියක වැයික්කි දේශපාලන ක්‍රමයක්. ඉතින් මේ වැයික්කි දේශපාලනයට මේ දෙගොල්ලෝ දෙපැත්තට වුණා කියලා මහ ලොකු දෙයක් වෙන්නෑ. මේ කට්ටිය ආණ්ඩුවක් නැවත පිහිටුවා ගනීවි.

මොකද එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවක් පිහිටුවා ගැනීමේ හැකියාව හොඳින්ම තියනවා. මොකද ඔවුන් පිටුපසින් විශාල වශයෙන් දෙමළ ඩයස්පෝරාව ඉන්නවා. දෙමළ ජාතික සංවිධානය හරහාත් මේ ආණ්ඩුව නැවත වතාවක් පවත්වාගෙන යන්න පුළුවන්.

මොකද විපක්ෂයෙන් අයින් වෙලා හෝ විපක්ෂයේ ඉඳගෙන නම ඔවුන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් පවත්වා ගෙන යන්න උදව් කරාවි.

හැබැයි ඒක දුර්වල ආණ්ඩුවක්. සමාජය තුළ යුක්ති යුක්තතාවයක් නැති ආණ්ඩුවක්. එහෙම වුනොත් ඒ ආණ්ඩුව මතවාදීමය වශයෙන් ජනතාව පිළිගන්නේ නැති ආණ්ඩුවක් බවට පත් වෙන්න පුළුවන් දැන් වගේම. එතකොට එවැනි ආණ්ඩුවකට බැහැ තීරණාත්මක සංවර්ධන ප්‍රතිපත්ති වලට යන්න හරි තීරණාත්මක ජාතික ප්‍රතිපත්ති වලට යන්න හරි. ඒ නිසා වඩා වැදගත් වෙන්නේ මේ දෙගොල්ලෝ වෙන් වුණොත් මොකද වෙන්නේ කියන එක හොයනවට වඩා වහාම මැතිවරණයකට ගිහිල්ලා මේ රටට ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමයි.

**එතකොට මේ අගෝස්තුවේ ශ්‍රී.නි.ප 18 දෙනෙක් ම ආණ්ඩුවෙන් ඉවත් වෙලා ස්වාධීන වෙනවා. තව දෙමළ මන්ත්‍රවරු කිහිපදෙනෙකුත් ස්වාධීනව පාර්ලිමේන්තුවේ අසුන් ගන්න තීරණය කරලා තියෙනවා. මෙහෙම ඇමතිවරු මන්ත්‍රීවරු ඉවත් වෙන්න ගත්තොත් ආණ්ඩුවට පැවැත්මක් තියේවිද?**

අපිට මේ ආණ්ඩුව බිඳ වැටේද නොවැටේද කියන එක නෙමෙයි වැදගත් වෙන්නේ. මං හිතන්නේ මේ කට්ටියට අපේ රටේ ඉරණම තීරණය කරන්න දීලා බලා ඉන්නවද නැත්නම් මේ කට්ටියගෙන් තොර වෙලා වෙනත් දේශපාලන ව්‍යාපෘතියක් ගැන හිතනවද කියන එක තමයි මේ වෙලාවෙ වැදගත් වෙන්නෙ. මොකද මේ 225න් 220 විතර ම පුද්ගලවාදී ආත්මාර්ථකාමී චරිත ටිකක්නේ. මේ අය ජනතා නියෝජිතයෝ නෙවෙයි.

පහුගිය කාලේ ලක්ෂ 400 ගාණක් තමන්ගෙ වාහන වලට වෙන් කරන්න කියපු නියෝජිතයෝ ටිකක් තමයි මේ ඉන්නේ. අනිත් පැත්තෙන් ගත්තම රටේ මිනිස්සු බඩගින්නේ ඉන්නවා. කුණු කඳුවලට යට වෙනවා. නාය යනවා. නමුත් ඔවුන්ට ගාණක්වත් නෑ. ප්‍රශ්නෙ කියන්නේ ජනතාව ගැන හිතන්නැති ජනතා නියෝජිතයෝ කොට්ඨාසයකින්ද අපි නිවන් දකින්න හදන්නෙ කියන එක. මේ ආණ්ඩුව පෙරළනවද වැටෙනවද කියන එකට වඩා අළුත් දේශපාලන ව්‍යාපාරයක අලුත් ආණ්ඩුවක් ගැන හිතන එක තමයි වැදගත් වෙන්නෙ.

**ව්‍යවස්ථා සංශෝධනයක් කරනවා කියලා දැන් කාලෙක ඉඳන් තියන කතාවක්නේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා ෆෙඩරල් ක්‍රමයකට යනවා කියලත් කියනවා.**

මේවා සේරම එයාලගේ ක්‍රීඩා. එයාලගේ නීති. ලංකාවේ ව්‍යවස්ථා සංශෝධනයකට වඩා කළයුතු ගොඩක් දේවල් තියෙනවා. ඔය ව්‍යවස්ථා සංශෝධනේ නැනේ බණ්ඩාරවෙල බේරගන්නේ කොහොමද කියලා. ඒ විනාශය වළක්වන්නේ කොහොමද කියලා. මේවා පොදු ජනයාට අදාල දේවල් නෙවෙයි. මේවා වනාහි ඇත්ත මාතෘකා යටපත් කිරීම සඳහා ගේන ව්‍යාජ මාතෘකා. ව්‍යවස්ථා සංශෝධනයන් හෝ ව්‍යවස්ථා සම්පාදනයන් කළ යුත්තේ නව දේශපාලන ව්‍යාපාරයක් නව වැඩ පිළිවෙලක් ඇති කිරීමයි. මේ අය කරන කිසිම ව්‍යවස්ථා සංශෝධනයකින් රටට හොඳක් වෙයි කියලා මම නම් හිතන්නේ නෑ.

**අපේ රටේ මේ තියෙන තත්ත්වෙත් එක්ක ඔබතුමා හිතන විදිහට මොනවගේ ආණ්ඩුවක් ද අවශ්‍ය වෙන්නේ ?**

මං හිතන්නේ අලුත් දේශපාලන ව්‍යාපාරයක අලුත් ආණ්ඩුවක් තමයි දැන් අවශ්‍ය. ප්‍රධාන පක්ෂ පාලනය කරන්න පුළුවන් දේශපාලන ක්‍රමයක් තියෙන්න ඕන. ඒ කියන්නේ ප්‍රධාන පක්ෂ නිකං ඇබිත්තයෝ වගේ කන්ට්‍රෝල් කරන්න පුළුවන් විදියේ මහජනයා බලවත් වන දේශපාලන ක්‍රමයක් තමයි දැන් අවශ්‍ය වෙන්නේ. ඒක වාමාංශික වෙන්න පුළුවන්. නැත්නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වෙන්න පුළුවන්. මම හිතන්නේ කවර සන්නාමයකින් ඉන්නවද කියන එකට වඩා වැදගත් වෙන්නේ කොයිතරම් දුරට ජනතාව ගැන හිතනවද ඒ වෙනුවෙන් වැඩ කරනවද කියන එකයි.

නිමේෂා ගමගේ

# කසළ ජයගත් රටවල්

දිනුෂිකා ආරියරත්න

**ලෝකයේ කසළ කළමණාකරණය කිරීම අතින් ශ්‍රී ලංකාව තවමත් සිටින්නේ ඉතාම පහළ තැනක. එක් පසෙකින් ශක්ති අර්බුදයටත් පිළියමක් විය හැකි කසළ ශ්‍රී ලංකාව කියන රමණීය දිවයිනේ මනස්කාන්ත බව නැති කරන එක නම් දුකට කාරණාවක්. ලෙහෙසියෙන්ම ප්‍රයෝජනවත් දෙයක් කරගන්නට හැකියාව තිබෙන කුණු නිසා අපේම සහෝදර සහෝදරියන්ගේ ජීවිත අහිමි වී යාම නම් ඉතාම ඛේදනීයයි.**




පසුගිය දිනවල ශ්‍රී ලංකාවේ මහා ඛේදවාචකයක් සිදු වුණා. ඒ මීතොටමුල්ල කුණු කන්ද නාය යාමයි. මේ වගේ කුණු කන්දක් දින දෙක තුනකින් නිර්මාණය වෙන්නේ නෑ. එසේ සිදු වීමට හේතුව රටේ නිසි කසළකළමනාකරණයක් සිදු නොවීමයි. අධික ජනගහනයත් මේකට හේතුවක්. මේ වන විට ලෝකයේ සමස්ත ජනගහනය බිලියන 07 ඉක්මවා තිබෙනවා. එය වර්ෂ 2050 වන විට බිලියන 10ද ඉක්මවන බවට ඇස්තමේන්තු කර තිබෙනවා. ඉතින් ලෝකයේ කුණු එකතු වීමේ සීඝ්‍රතාවය තව දුරටත් වැඩි වීමක් මිස අඩුවීමක් නම් වෙන්නේ නෑ.

ඉතින් අනාගතයට හෝ ප්‍රයෝජනයක් වේ යැයි සිතා අපි අදහස් කළා ලෝකයේ විවිධ රටවල් පාවිච්චි කරන ඉතාම සාර්ථක කසළ කළමනාකරණ වැඩපිළිවෙල කීපයක් ඔබ වෙත ගෙන එන්නට. යුරෝපීය රටවල් කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම අතින් ඉදිරියෙන්ම සිටිනවා. මේ අතරින් ජර්මනිය, ඔස්ට්‍රියාව හා බෙල්ජියම ඉතා විශේෂයි.

කසළ කළමනාකරණය අතින් ජර්මනිය බොහෝ ඉදිරියෙන් සිටිනවා. ජර්මනිය අතීතයේ සිට ම නව නිර්මාණවලට හා කීර්තිමත් විද්‍යාඥයින්ට ප්‍රසිද්ධයි. කෙසේ නමුත් 1950 වන විට ජර්මනිය තුළත් කසළ එකතු වූ තැන් 50,000 ක් පමණ තිබුණා. නමුත් දැන් එහි ඇත්තේ එවැනි තැන් 300ක් පමණ. ඒවාට වෙන් කර හා වර්ගීකරණය කර රැගෙන එන කසළ පමණක් බාර ගැනෙනවා. 2005 දී ජර්මනිය සාමාන්‍යයෙන් කුණු කඳු තහනම් කරන ලද අතර ඔවුන් සැලසුම් කරගෙන සිටින්නේ 2022 වන විට ඉතිරි කුණු ගොඩවල් කිහිපයත් නැති කර දමා එකතු වෙන කසළ සම්පූර්ණයෙන්ම විදුලිය වැනි ශක්තීන් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමටයි.

මේ කර්තව්‍යයෙන් ඔවුන් අනුමාන කරන පරිදි ඔවුන්ගේ සම්පූර්ණ ප්‍රාග්ධනයෙන් වසරකට යුරෝ බිලියන 3.7ක් ඉතිරි කර ගත හැකි අතර දැනටමත් කසළ ප්‍රතිචක්‍රීයකරණය කිරීමෙන් ඔවුන් ශක්ති ආනයනයෙන් 3% ක්ද, ලෝහ ආනයන වියදමෙන් 20% ක්ද ඉතිරි කරගෙන තිබෙනවා. සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා ආරම්භයේ දී නවීන ක්‍රම හඳුන්වාදීමට වැඩි වියදමක් ගත වූවත් ජර්මානු ව්‍යවසායකයන් එය දකින්නේ අනාගතයේ ලොවටම ඉතා වැදගත් වන හා අත්‍යවශ්‍යවන කර්මාන්තයකට අත්පොත් ලැබීමට ලැබෙන අවස්ථාවක් හැටියටයි.

ජර්මනිය හඳුන්වා දී ඇති තවත් විශේෂ කසළ කළමනාකරණ ක්‍රමයක් තමයි තමයි ග්‍රීන් ඩොට් හෙවත් කොළ තිත් ක්‍රමය. මේ ක්‍රමයේදී කසළවල වගකීම එය නිෂ්පාදනය කරන්නාට පැවරෙන අතර ඒ සඳහා ඔහු යම් ගෙවීමක් කළ යුතුයි. මේ නිසා ඉවතලන ද්‍රව්‍ය අඩුවෙන් යොදා ගැනීමට නිෂ්පාදකයා පෙළඹෙනවා වගේම ප්‍රතිචක්‍රීකරණයටත් යොමු වෙනවා. මෙමඟින් භාණ්ඩ නිෂ්පාදනයේදී කඩදාසි, වීදුරු, ලෝහ වැනි දේ අඩුවෙන් පාවිච්චි කිරීමට නිපැයුම්කරුවන් පෙළඹෙන අතර මෙම කොළ තිත් ක්‍රමය කුණු නිෂ්පාදනය වසරකට ටොන් මිලියන 1 කින් අඩු කිරීමට දායක වී තිබෙනවා.

ඔස්ට්‍රියාව කුඩා රාජ්‍යයක් වුණාට කසළ කළමනාකරණය අතින් නම් ඉන්නේ ගොඩක් ඉදිරියෙන්. සාම්ප්‍රදායික ක්‍රම වන බදු පැනවීම වැනි ක්‍රමවලින් ඔවුන් සෑහෙන දුරට කසළ ප්‍රශ්නය අවම කරගෙන තිබෙනවා.මීට අමතරව ඔස්ට්‍රියානු ජෛව තාක්ෂණ ආයතනයක් මඟින් පොලි එතිලීන් තෙරැප්තලේට් හෙවත් පී.ඊ.ටී (PET) ප්ලාස්ටික් බෝතල් ජීර්ණය කළ හැකි දිලීරමය එන්සයිමයක් නිපදවා තිබෙනවා. මෙමගින් පී.ඊ.ටී බෝතල්වල සංඝටකයේ මහා අණුව බිඳ හෙලා නැවතත් වඩා ප්‍රයෝජනවත් බහු අවයවික නිෂ්පාදනය කළ හැකියි. මේ එන්සයිමය යොදාගෙන මෙම ක්‍රියාවලිය ස්වභාවිකවම කළ හැකි අතර වෙනත් හානිදායක අතුරු ඵල කිසිවක් සෑදෙන්නේ නෑ.

**පී.ඊ.ටී බෝතල් නවමු ලෙස නිෂ්පාදනයේ දී අමුද්‍රව්‍ය බොර තෙල්වලින් ලබා ගත යුතු අතර අවසානයේ ප්‍රතිචක්‍රීකරණය කළ හැකිව තිබුණේ දහනයෙන් හෝ ඇඹරීමෙන් පමණයි. ඒවා මිලෙන් අධික වූත්, අඩු කාර්යක්ෂමතාවයෙන් යුතු වූත් ක්‍රමයන්.**

**බෙල්ජියමත් කසළ කළමනාකරණය අතින් ඉදිරියෙන්ම සිටින තවත් යුරෝපීය රටක්. මෙම රටෙහි නිෂ්පාදනය වන කසළ වලින් 75%ක්ම නැවත යොදාගන්නවා, නැතිනම් ප්‍රතිචක්‍රීකරණය කරනවා හෝ කොම්පෝස්ට් බවට පත් කරනවා. බෙල්ජියම ඉතාම දියුණු කසළ කළමනාකරණ තාක්ෂණ දෙකක් සිය රට වැසියන්ට හඳුන්වා දී තිබෙනවා. එනම් එකොලයිසර් ක්‍රමය හා හරිත උත්සව හා තක්සේරු කිරීමේ මාර්ගෝපදේශනය යන ක්‍රමයයි.**

එකොලයිසර් ක්‍රමය ඉතාම සාර්ථකව නව කසළ නිෂ්පාදනය වළක්වා ගැනීමේ ක්‍රමයක්. එකොලයිසර ක්‍රමයේදී කසළ ඒවා නිපදවන ප්‍රභවයේදීම හඳුනාගැනීම කෙරෙනවා. ඒ අනුව ගණනය කිරීමක් කොට කසළ ජනනය හා පරිසරයට වන බලපෑම අවම වන නිෂ්පාදන ක්‍රියාවලීන් හා භාණ්ඩ ප්‍රවර්ධනය කිරීම සිද්ධ කෙරෙනවා. මීට අමතරව ඒ ඒ නිෂ්පාදන සමාගම්වලට සිය ක්‍රියාවලීන්, භාණ්ඩ හා සේවාවලින් වන කසළ ජනනය හා පරිසරයට වන බලපෑම් ගැන පූර්ව අධ්‍යයනයකට අවස්ථාව සැලසෙනවා. මේ අනුව වඩාත් පරිසර හිතකාමී නිර්මාණවලට ඉතාම කාර්යක්ෂම හා ලාභදායී ලෙස යොමු වීමේ අවස්ථාව ඔවුන්ට ලැබෙනවා.

හරිත උත්සව හා තක්සේරු ක්‍රමය කසළ ජනනය අවම කරන්නට බෙල්ජියමේ භාවිත වන ඩිජිටල් ක්‍රමයක්. මෙමගින් උත්සව පවත්වන්නන්ට සිය ව්‍යාපෘතියෙන් පරිසරයට සිදු වන බලපෑමේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳව පෙරැයීම් කළ හැකි අතර බලපෑම අවම වන පරිදි ඒවා පැවැත්වීමට රුකුළක් වෙනවා. මෙම ක්‍රමය ප්‍රවර්ධනය කරන සමාගමේ වෙබ් අඩවියේ පරිසර හිතකාමී හා නැවත යොදාගත හැකි පිඟන්, හැඳි-ගෑරොප්පු වැනි භාණ්ඩ ලබා ගත හැකි තැන් පිළිබඳව විස්තරද අඩංගුයි. මෙමගින් එවැනි පරිසර හිතකාමී නිෂ්පාදනවලට අත දීමක් ද වෙනවා.

ඉහත කියපු ක්‍රමවලට අමතරව සමස්තයක් ලෙස කසළ වලින් පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා විවිධ දියුණු ක්‍රම බොහෝ රටවල් අනුගමනය කරනවා. පහත දැක්වෙන්නේ කසළ වලින් වන බලපෑම අවම කර ගැනීමට ලෝකයේ විවිධ රටවල් වර්තමානයේ උපයෝගී කර ගන්නා දියුණු හා කාර්යක්ෂම ක්‍රම කිහිපයක්.

නිර්වායු ජීර්ණය ක්‍රමය යොදාගන්නේ ජෛව කසළ (ශාක හෝ සත්ත්ව ප්‍රභවයකින් බිහි වන කසළ) සඳහායි. මෙහිදී ඔක්සිජන් රහිත පරිසරයක ක්ෂුද්‍ර ජීවීන් භාවිතයෙන් කසළ ජීර්ණය කිරීමට ලක් කෙරෙනවා. කාබනික ඝන, අර්ධ ඝන හා දියරමය අපද්‍රව්‍ය සඳහා මේ ක්‍රමය යොදා ගත හැකියි. මේ ක්‍රමය ඉතා ඉක්මන් එකක් වන අතර අතුරු ඵල වන ජීව වායුව (මීතේන්) ඉන්ධනයක් හැටියටද යොදා ගන්න පුළුවන්.

ශූන්‍ය අපද්‍රව්‍ය (Zero Waste) ක්‍රමය සත්‍ය ලෝකයේදී උදා කර ගත හැකි ඉලක්කයකට වඩා හැකිතාක් අපද්‍රව්‍ය අවම කර ගැනීම සඳහා යොදාගෙන ඇති සංකල්පයක්. මෙහිදී ඇත්තෙන්ම අවසාන ඉලක්කය යම් භාණ්ඩයක් හෝ සේවාවක් සැළසුම් කිරීමේදී ඉන් අනාගතයේදී බිහි වන අපද්‍රව්‍ය ප්‍රමාණය ශූන්‍යව තබා ගැනීමයි. මෙය කිසිදා උදා කරගත නොහැකි ඉලක්කයක් වුණත් ඒ මග යමින් ඉතා සාර්ථක ලෙස අපද්‍රව්‍ය ජනනය අවම කරගත් තැන් ලෝකයේ ඕනෑ තරම් තිබෙනවා.

කසළ ප්‍රභවයේදී ම වර්ගීකරණය කිරීම නවීන ලෝකය විවිධාකාරයේ කසළ නිෂ්පාදනය කරනවා. මේවා ප්‍රයෝජනවත් ආකාරයකට නැවත යොදා ගැනීමට හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමට නම් ඊට පෙර වර්ගීකරණය කළ යුතු වෙනවා. එය කල් යන වගේම ඉතාම වියදම්කාරී වැඩක්.

ලෝකයේ කසළ කළමණාකරණය කිරීම අතින් ශ්‍රී ලංකාව තවමත් සිටින්නේ ඉතාම පහළ තැනක. එක් පසෙකින් ශක්ති අර්බුදයටත් පිළියමක් විය හැකි කසළ ශ්‍රී ලංකාව කියන රමණීය දිවයිනේ මනස්කාන්ත බව නැති කරන එක නම් දුකට කාරණාවක්. ලෙහෙසියෙන්ම ප්‍රයෝජනවත් දෙයක් කරගන්නට හැකියාව තිබෙන කුණු නිසා අපේම සහෝදර සහෝදරියන්ගේ ජීවිත අහිමි වී යාම නම් ඉතාම ඛේදනීයයි.

මේ ලිපියේ සඳහන් ක්‍රමවලින් බහුතරයක් නිවැරදි දැක්මකින් යුතුව ශ්‍රී ලංකාවේ පාරිසරික හා ආර්ථික වපසරිය තුළ ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ තිබෙනවා. ඒවාට නිසි බලධාරීන්ගේ අවධානය ඉක්මණින්ම යොමු වන්නේ නම් එය රටටත් ජනතාවටත් යහපතක් ම වෙනු ඇති.

# ලෝක බැංකුවට එරෙහිව BRICS

**ආර්ථිකය සමාන ස්ථර වලින් පවතින රාජ්‍යන්ගේ ප්‍රධානත්වයෙන් BRICS සංගමය ආරම්භ වන්නේ 2001 වසරේ දී ජිම් ඕනෙයිල් නම් ආර්ථික විද්‍යාඥයාගේ ප්‍රධානත්වයෙනි. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව සහ චීනය යන රටවල් එකතුවෙන් මෙම සංවිධානය ආරම්භ කර ඇත. BRICS හි සාමාජික රාජ්‍යන්හි ආරාධනයෙන් 2010 වසරේ දී දකුණු අප්‍රිකාව මෙහි සාමාජිකත්වය සඳහා එකතු විය. ඒ අනුව මේ වන විට BRICS සංගමයේ සාමාජිකත්වය රටවල් 5ක් විසින් හොබවනු ලබයි.**

BRICS සංගමයේ අරමුණු වශයෙන් ඔවුන් දක්වන්නේ විශ්වීය සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය සැපයීමත්, ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථිකයක් ගොඩනැගීමේ අරමුණෙන් ප්‍රතිපත්ති සැකසීමත්, තිරසාර සංවර්ධනය උදෙසා ලෝක ආර්ථිකය හමුවේ පවතින ගැටලු වන දුප්පත්කම,කුසගින්න සහ ආපදාවන් ද විශේෂයෙන් ආහාර




ගැටලුව විසඳීම සඳහා මූල්‍යමය ආධාර ලබා දීමත් ය. මෙම සංවිධානය විසින් වසරකට වරක් රැස්වී ඒ ඒ රාජ්‍යන්හි ආර්ථිකය හා ගෝලීය දේශපාලනය හා ආර්ථිකය සම්බන්ධ බොහෝ කාරණාවන් සාකච්ඡා කරන අතර 2009 වසරේ දී මෙම සංවිධානය ඉදිරිපත් කළ ඒකාබද්ධ ප්‍රකාශයෙන් BRICSසාමාජික රාජ්‍යන්හි ගෝලීය මූල්‍යමය අතිරික්තය සම්බන්ධ කරුණු ඉදිරිපත් කෙරුණි.

2011 දී මෙම සංවිධානය විසින් Sanya ප්‍රකාශය නමින් ඉදිරිපත් කෙරුණු ක්‍රියාකාරී සැලැස්ම චීනයේ ප්‍රධානත්වයෙන් සිදුවිය. 2012 වසරේ දී ඉදිරිපත් වූ ඒකාබද්ධ ප්‍රකාශය මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල නියෝජනය ශක්තිමත් කිරීමට කටයුතු යෙදීම සහ නව සංවර්ධන බැංකුවක් පිහිටවීම සඳහා යොජනා ඉදිරිපත් විය. එමෙන් ම ඩොලර් වෙනුවට සාමාජික රටවල මුදල් ඒකක හරහා ගණුදෙනු කිරීම පහසු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් විය. ඒ අතර ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවට වඩා සහනදායී කොන්දේසි යටතේ සංවර්ධනය වෙමින් පවතින රටවලට ණය ආධාර ලබාදීමට මෙමගින් කටයුතු කරයි. ඉදිරි වසර සඳහා මෙම සංවිධානය විසින් මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. මේ වන විට සමස්ත ලෝක ජනතාවගෙන් අඩකටත් ආසන්න ප්‍රමාණයක් මෙම සංවිධානයට ඇතුළත් වන අතර සාමාජික රාජ්‍යන්ගේ සමස්ත ආර්ථිකයේ දළ ජාතික නිෂ්පාදනය ඩොලර් ට්‍රිලියන 16. 6 ක් වේ. සමස්ත විදේශ සංචිත ප්‍රමාණය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 4 කට වඩා වැඩි බව ගණනය කොට ඇත. ලෝක දළ ජාතික නිෂ්පාදනයෙන් 37 % ක් ද, ලෝක වෙළෙඳාමෙන් 17 % ක්ද BRICS සංවිධානය කරන රාජ්‍යන් සතුව පවතී. 2016 වසරේ දී පැවැති 8 වන BRICS සමුළුවේ සභාපතීත්වය ඉන්දියාව විසින් හිමි කර ගන්නා ලදී. එම සමුළුවේ තේමාව වූයේ ප්‍රතිචාරාත්මක, සියල්ල ඇතුළුවන් සාමූහික විසඳුම් ගොඩනැගීම යන්නයි. එමෙන් ම මෙම සමුළුවේ දී BRICS සංවර්ධන බැංකුව, සෞඛ්‍ය, තිරසාර සංවර්ධනය, පිරිසිදු හා හරිත බලශක්ති යන අංශ පිළිබඳ අවධානයට යොමුවිය. දියුණු වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික මූල්‍ය ආයතනවල සමාන නියෝජන ඉඩ ප්‍රස්ථා ලබා ගැනීම කේන්ද්‍ර කර ගනිමින් බ්‍රික්ස් සංවිධානය ලෝක දේශපාලනය සහ ආර්ථිකය තුළ විශේෂ අවධානයක් දිනාගෙන ඇත. මෙමස 3, 4 සහ 5 වන දින චීනයේ ප්‍රධානත්වයෙන් නව වන වරට BRICS සමුළුව පැවැත්විය. මෙවර BRICS සමුළුවේ දී චීනය සිය ස්ථාවරත්වය ප්‍රකාශ කර සිටියේ මෙම සමුළුව හරහා ආර්ථික මට්ටමින් අවම පහසුකම් පවතින රටවල ආර්ථික අර්බුද කෙරෙහි තමන් මැදිහත් වන බවයි. ඉන්දියාව සහ චීනය අතර විශේෂ සාකච්ඡා පවත්වමින් දීර්ඝකාලීන ආර්ථික වැඩපිළිවෙලක් සඳහා අවශ්‍ය යොජනා ඉදිරිපත් කෙරිණ. ඒ අනුව සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් මෙම සමුළුව ලංකාවට කුමන ආකාරයක බලපෑමක් සිදු කරයි ද? යන්න අවධානය යොමු කළ යුතු වේ.

## One Road One Belt

## අබියස ශ්‍රී ලංකාව

චීනය විසින් 2015 මාර්තු මස විස්තීරණ යටිතල පහසුකම් සහ සංවර්ධන වැඩසටහනක් ලෙස ලොවට හඳුන්වා දෙන ලද එක් මාවතක් , එක් තීරුවක් යන සංකල්පය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. එක් පියවරක් ගොඩබිම් සේද මාවත් ආර්ථික පෙදෙස මගින් චීනය මධ්‍යම හා බටහිර ආසියාව ඔස්සේ යුරෝපය සමඟ සම්බන්ධ වන අතර අනෙක 21 ව සියවසේ මුහුදු සේද මාවත ඔස්සේ චීනය අග්නිදිග ආසියානු රටවල්, අප්‍රිකාව සහ යුරෝපය සමඟ සම්බන්ධ වේ. මෙම ව්‍යාපෘතිය ඇමරිකානු ඩොලර් බිලියන 40 ක පමණ වටිනාකමකින් යුත් ව්‍යාපෘතියකි. මෙම සංකල්පය හරහා සේද මාවතට අයත් රටවල අනන්‍යතාවය රැකගනිමින් ඒ ඒ රටවල් සකස් කරගත් දේශීය ව්‍යාපෘතිවලට අවශ්‍ය යටිතල පහසුකම් තාක්ෂණික හා විශේෂඥ සහය ලබාදීම අරමුණු වේ. 2014 ත් 2015 වසරත් අතරකාලය




තුළ චීනය මෙම ව්‍යාපෘතිය ඔස්සේ අදාළ රටවල් සමග සිදු කළ ආයෝජනය ඇමරිකානු ඩොලර් බිලියන 50කට අධික වේ. චීන ව්‍යාපාර රටවල් 20ක පමණ ආර්ථික වෙළඳ සහයෝගතා කලාප 56ක් ස්ථාපිත කළ ඇති අතර මේ වසර වන විට එම රටවලට එමගින් ලබා ඇති බදු ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 1. 1 බව පැවසේ. මෙවර පැවති සමුළුවට සහභාගි වූ අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සහ දූත පිරිස හමුවේ චීන ජනපති පවසා සිටියේ ලංකාවේ ජාතික සමගිය සංහිදියාව සහ ආර්ථික සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය මගින් පූර්ණ සහය ලබා දීමට ක්‍රියා කරන බවයි. ලංකාව සහ චීනය අතර රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව වසර 60ත් සම්පූර්ණ වීම හා දෙරට අතර ක්‍රියාත්මක රබර් සහල් ගිවිසුමට වසර 65ක් පිරෙන මේ වසරේ සබඳතා ශක්තිමත් කිරීම සම්බන්ධව මෙම සමුළුවේ දී සාකච්ඡා විය. මීළඟ එක් මාවතක් එක් තීරුවක් සමුළුව 2019 වසරේ දී පැවැත්වීමට නියමිත බවත් මෙම වසරේ ලබාදීමට යෝජිත චීන යුවාන් මිලියන 400 ක ආධාර මුදලට අමතරව 2018 සිට 2020 කාලය සඳහා චීන යුවාන් බිලියන 2ක ආධාර දීමට තම රට කටයුතු කරන බවට චීන ජනපති ෂි ජින් පිං මහතා මෙවසරේ මැයි මස පැවති සමුළුවේ දී සඳහන් කළේ ය.

# කිරට ගිය කල ?

පසුගිය දශක කිහිපය තුළ කිරි හා මස් පරිභෝජනයත් ඒ සඳහා ඉල්ලුමත් සීඝ්‍රයෙන් වර්ධනය විය. මෙම තත්ත්වය දියුණු වෙමින් පවතින රටවලට ම විශේෂිත වන අතර එය පශු සම්පත් විප්ලවය ලෙස හඳුන්වන තරමට ම වර්ධනයකි. පවතින අර්බුදය නම් ගම්බද ගොවියා සතු කිරි නිෂ්පාදනය රටේ පරිභෝජනය සඳහා යොදා ගන්නට පවතින්නේ අවම පහසුකම් සමුදායක් වීමයි.. මේ සඳහා නිශ්චිත ක්‍රියාපිළිවෙතක් මේ වන විටත් නොමැත.

වෙළඳපොළ නිර්මාණය කරයි. ශ්‍රී ලාංකිකයන්ට ස්ව ගවයන්ගෙන් ගන්නා කිරි පිළිබඳ නිශ්චිත ඇගයුමක් නොමැත. දියර කිරි පානය ශරීරයට අහිතකර බව හා ශීත බැව් බොහෝ දෙනාගේ මිථ්‍යා මතයයි. නමුත් කිසිඳු වෛද්‍යවරයෙක් දියර කිරි ශරීරයට අහිතකර බව දක්වා නොමැත.

අනෙක් රටවලට සාපේක්ෂව ලංකාවේ කිරි පරිභෝජනය අවම මට්ටමේ පවතී. කිරි නිෂ්පාදනය වැඩි වීමත් සමඟ කිරි පිටි ආනයනයේ අඩු වීමක් අපේක්ෂා දියර කිරි අලෙවිය ව්‍යාප්ත කිරීමට විවිධ පියවර වරින් වර ගෙන ඇති නමුදු එය සාර්ථකත්වයට පත් වී නොමැත. දියර කිරි ව්‍යවසායක මට්ටමෙන් පවත්වා ගෙන යැම සඳහා හොඳ ඉල්ලුමක් තිබිය යුතු ය.

කිරි පරිභෝජනය වැඩි කිරීමත් විශේෂයෙන් දියර කිරි පරිභෝජනයට නැඹුරු වීමත් සමස්ත ජනතාවගෙන් අපේක්ෂා කරන දෙයකි. එලෙසින් සිදු වන්නේ නම් කිරි වලින් ස්වයංපෝෂිත තත්වයක් කරා මේ කර්මාන්තය ගෙන යැම වඩාත්

දේශීය ගොවියාගෙන් ලබාගන්නා කිරි අපතේ හරින බවට කරන චෝදනාවන් මධ්‍යයේ මැතක දී මාධ්‍ය සාක්ච්ඡාවක් කැඳවමින් ග්‍රාමීය ආර්ථික පිළිබඳ ඇමතිතුමා සඳහන් කරන්නේ න් අයහපත් කාළගුණ තත්ත්වය හේතුවෙන් කිරි ප්‍රවාහනය කරන බවුසර්වල සිදු වූ ප්‍රමාදය නිසා යම් කිරි ප්‍රමාණයක් අපතේ දැමීමට සිදු වූ බවයි.”

ලෝක ආහාර හා කෘෂිකර්මාන්ත සංවිධානයට අනුව ආනයනය මත පදනම් වූ ඒක ශීර්ෂ දෛනික කිරි හා කිරි නිෂ්පාදිත සැපයුම 1990 වර්ෂයේ ග්‍රෑම් 32.67 සිට 2005 වර්ෂයේ දී ග්‍රෑම් 81 දක්වා වැඩි වී ඇත. මේ අනුව මේ වසර තුළ ආනයනය මත රඳා පැවැත්ම 45% සිට 77% දක්වා වැඩි වී ඇත. ශ්‍රී ලංකාව තුළ ඇති කිරි නිෂ්පාදනය මෙරට ඉල්ලුම සැපයීමට ප්‍රමාණවත් නොවීම කිරි ආනයනය සඳහා කළ යුතු ය. කිරිපිටි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා අප විසින් වසරකට වැය කරන මුදල රුපියල් බිලියන 30 කට ආසන්න වේ. ශ්‍රී ලංකාවේ පවතින කිරි කර්මාන්තශාලාවල ධාරිතාව දැනට නිපදවන්නා වූ කිරි ප්‍රමාණය සැකසීම සඳහා ප්‍රමාණවත් වුව ද ඉදිරි වසර කිහිපය තුළ අපේක්ෂිත වර්ධනයත් සමග සලකා බලන කළ ප්‍රමාණවත් නොවන්නට පුළුවන.

කිරි වලින් සැකසූ ආහාර හෝ කිරි පිටි ලෙස කිරි පරිභොජනය කිරීම ආර්ථික වශයෙන් මෙන් ම පොෂණීය වශයෙන් ද අවාසි සහගත විය හැක. එබැවින් දියර කිරි පරිභෝජනයට ජනතාව නැඹුරු කරවීම අවශ්‍ය කටයුත්තක් ව ඇත. පාරිභෝගිකයන්ට පහසුවෙන් මිලදී ගත හැකි පරිදි පහසු වනු ඇත. එමෙන් ම වසරක් පාසා විදේශ කිරි ගොවියා සහ විදේශීය වෙළෙන්දන් වෙත ඇදී යන මුදල අප රටේ රඳවා ගෙන දේශීය කිරි නිෂ්පාදිතයා වෙත ලබා දීමට රජය ප්‍රමුඛ අදාළ රාජ්‍ය ආයතන උත්සාහ ගත යුතු ය.



**සටහන හා සංස්කරණය**
**සුලක්ෂි රත්නායක**

# ඉන්දියානු විරෝධයට පාර කැපීම

ඉන්දීය ශ්‍රමිකයින් පිළිබඳ කතිකාව යටගියේ එට්කා ගිවිසුමට එල්ලවූ ජනතා විරෝධයත් සමඟ ය. ජාත්‍යන්තර ව්‍යාපාරකයින් මෙරටට අයෝජනය කිරීම සම්බන්ධව විවේචනයක් අපට නැත. විදේශීය සම්බන්ධතා තර කර ගනිමින් රට සංවර්ධනය කිරීමට නම් විදේශීය ආයෝජන නිවැරදි තෝරාගැනීම් මතින් සිදුවිය යුතුය. නමුත් ගැටලුව නම් මෙම ආයෝජන ගිවිසුම් රටේ පුරවැසියාගේ සංස්කෘතික සමාජීය සහ ආර්ථික ජීවන රටාව කෙරෙහි කෙතරම් බලපෑම්කාරී වනවාද යන්න පිළිබඳ නිවැරදි තක්සේරුවකින් තොරව හිස්මුදුනින් පිළිගැනීමයි. ඇතැම් අවස්ථාවල වෙනත් රටවලින් ඉවත් කරන ලද කර්මාන්තශාලා පවා මෙරට පිහිටුවා ඇත. නුවර එළියේ ඇස් පිහාටු නිපදවන කර්මාන්තශාලාව එවන් එකකි. පසුගිය වර්ෂවල දී මෙරටට අයෝජනය කරනු ලැබූ මහා පරිමාණ ආයෝජන සියල්ල අපව ආර්ථික වශයෙන් සහ දේශපාලනික වශයෙන් කෙතරම් වියවුලකට පත්කළේ ද යන්න අමුතුවෙන් පැහැදිලි කළ යුතු නොවේ.

පසුගියදා රටේ ප්‍රසිද්ධ රූපලාවන්‍ය ශිල්පීන් විසින් මාධ්‍ය සමුළුවක් කැඳවා තිබිණි. මෙහි නිමිත්ත බවට පත් වුණේ ඉන්දීය මහා පරිමාණ රූපලාවන්‍ය සමාගමක් විසින් මෙරට ස්ථාන සියයක රූපලාවන්‍ය මධ්‍යස්ථාන සියයක් විවෘත කිරීම සම්බන්ධව මාධ්‍ය දැනුවත් කිරීමයි. ඉන්දියාවත් ලංකාවත් අතර ද්වීපාර්ශික වෙළඳ සබඳතා ශක්තිමත් කිරීම මෙහි අරමුණ විය. නමුත් මෙයින් මතුවට අපේ රූපලාවන්‍ය ශිල්පියාට යන කල ්දසාව පිළිබඳ වගකීම රජය විසින් බැහැර නොකල යුතුය. රූපලාවන්‍ය ශිල්පීය යන්න වර්මානයේ නාගරික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා අවකාශයක පැතිරුණු වෘත්තියකි. මහා පරිමාණ මට්ටමේ සිට නිවෙස්වල ඇති රූපලාවන්‍යාගාර දක්වා උස්පහත්කම් සහිත වෘත්තියකි. මිලියන ගණන්වල සිට දහස් ගණන් දක්වා ලාභ උපයන විෂමතාවන් ඇති වෘත්තියකි. රජයේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ඔවුන් විසින් ම සපුරාගෙන ස්වයං රැකියාවක් මගින් ජීවිකාව සරිකරගන්නා වෘත්තියකි. අද වන විට ඩිප්ලෝමා උපාධි දක්වා වර්ධනය වී ඇති ජනතාවට අත්‍යවශ්‍ය ම සේවාවකි. ඉන්දීය ආයෝජකයින්ගේ ආක්‍රමණයට ලක්වන්නට නියමිත වෘත්තියකි.

අද වන විට හෙද සූපවේදී දන්වීම්කරණ යන ක්ෂේත්‍රවල ඉන්දීය ශ්‍රමිකයින්ගේ ප්‍රමාණය වර්ධනය වෙමින් ඇත. මෙය ලාබ ශ්‍රමය උපයා ගැනීමට විසඳුමක් ලෙස භාවිතකරන බවක් පෙනෙන්ට ඇත. නමුත් මෙරට ස්ථාපිතව ඇති ව්‍යාපාර සඳහා ඉන්දීය ව්‍යාපාරිකයින් මෙරටට ගෙන්වීම සමඟ ශ්‍රමිකයින් පැමිණීම කිසිවිටෙක අපි සාධාරණීකරනය නොකරමු. රූපලාවන්‍ය ක්ෂෙත්‍රයේ මෙම ස්ථාපනයන් සමඟ ඔවුනට හිමිවන වරප්‍රසාද ලංකාවේ රූපලාවන්‍ය ශිල්පියාට අහිමි වී යයි. උදාහරණයක් වශයෙන් එරටින් ගෙන්වන උපකරණ සහ ද්‍රව්‍ය සඳහා හිමිවන බදු සහන රාජ්‍ය ණය වරප්‍රසාද ලංකාවේ ශිල්පියාට අහිමිවී යයි. මෙහි ප්‍රතිපලයක් වශයෙන් ඉන්දීය ශිල්පියා රූපලාවන්‍ය කාර්ය සඳහා අයකරන මුදල ට වැඩි මුදලක් අප රූපලාවන්‍ය ශිල්පියාට අයකර ගැනීමට සිදුවෙයි. අවසානයේ සිදුවන්නේ අපේ ශිල්පියාට බඩේ පාර වැදීමය.

ඉන්දීය විරෝධයට පොටක් පාදා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින අගතිගාමී පිරිස් හට රජයෙන් නිර්මාණය කරදුන් අවස්ථාවක් ලෙස අපි මෙය දකිමු. විදෙස් ආයෝජන රටට ඇතුල් වීම සම්බන්ධයෙන් අපට අවුලක් නොමැත. නමුත් රට නමුත් අවිචාරයෙන් සිදුකරනු ලබන අත්සන් තැබීම් පිළිබඳ අපගේ බලවත් විරෝධය පලකරමු.

**ජනසන්නිවේදනය ( විශේෂ) තෙවන වසර**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**

**වෙබ්**
http://ss.kln.ac.lk/depts/maco/
Facebook link
https://www.facebook.com/mass.com73

Tel-011 2917713

# "ආණ්ඩුව බහුතර ජනතාවගේ කැමැත්ත නොසලකා හරිනවා"

ආචාර්ය
චරිත හේරත්



**"මේ වෙලාවේ ස්ථාවර ආණ්ඩුවක් අවශ්‍යයයි. නමුත් බහුතර ජනතාව ඉන්නෙ එතැන නෙමෙයි. ජනතාව කැමති උදේට එකයි හවසට එකයි ආණ්ඩුවලට."**

**හවුල් ආණ්ඩුවේ එකගෙයි කෑම හමාර වීමට තව ඇත්තේ මාස 2කටත් අඩු කාලයකි.2015 බහුතර ජන වරමක් නොමැති තැන සම්මුතිගතව පිහිටවාගත් ආණ්ඩුව ගතවූ අවුරුදු දෙක ඇතුළත දේශපාලනික හා ආයතනික වශයෙන් වෙනස්කම් රාශියක් සිදුකළ බව සැබෑය. නමුත් දින සීයේ වැඩපිළිවෙළ දින හයසීයේ සීමාවට පැමිණෙන තෙක් ඇතැම් පොරොන්දු ප්‍රතිපත්ති ප්‍රකාශනවලට පමණක් සීමා වී තිබීම කණගාටුවට කරුණකි. අනෙක් පසින් නව ව්‍යවස්ථාව විසඳාගත නොහැකි වියවුලක් දක්වා උඩු දුවා ඇත. මෙම බිඳීයාමත් සමඟ ආණ්ඩුවේ ස්ථාවරය කෙරෙහි ඇති වන බලපෑම මගින් රටේ දේශපාලන හැසිරීමේ කවරාකාර අර්බුද නිර්මාණය කරයි ද මෙවර අක්ෂය දේශපාලන සංවාදය ඒ පිළිබඳවයි.**

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පිරිසක් ආණ්ඩුවෙන් ඉවත් වීමට තීරණය කර තිබෙනවා. මෙම ඉවත් වීම ආණ්ඩුවේ අස්ථාවර බව ප්‍රදර්ශනය කිරීමක් ද?**

"ඇත්තට ම දනට තියෙන තොරතුරු අනුව ආණ්ඩුවෙන් ඉවත් වීමට තීරණය කරල තියෙන්නේ මන්ත්‍රීවරුන් 44ක වැනි කණ්ඩායමක්. ඉතින් මෙම සුළු පිරිස ඉවත් වීමෙන් ආණ්ඩුවට එතරම් බලපෑමක් කරන්න පුළුවන් කියල මම හිතන්නෙ නැහැ. මොකද ආණ්ඩුවක් පිහිටවන්න අවශ්‍ය මන්ත්‍රී ධූර 113න් 105ක් ම තියෙන්නෙ එක්සත් ජාතික පක්ෂයට. ඒ නිසා සුළු පිරිසක් ඉවත් වීම හින්ද ආණ්ඩුව අස්ථාවර වෙයි කියල කියන්න අමාරුයි. නමුත් මේ නිසා වෙනත් ප්‍රශ්ණ ගණනාවක් නිර්මාණය වෙන්න පුලුවන්. ඒ තුළින් ආණ්ඩුව කෙරෙහි ජනතාවට තිබුණ විශ්වාසයේ පළුද්දක් ඇති වෙනවා. අනෙක මේ ආණ්ඩුවට ලොකු වැඩක් කරන්න බැහැ කියන එක පැහැදිලියි. පහුගිය දවසවල ඒකට උදාහරණ ඕනි තරම් තිබුණා. තනි එජාප ආණ්ඩුවක් පිහිටවන්න යනකොට ආණ්ඩුව ඇතුළේ ඉන්න අනෙක් පිරිස එළියට බහින එක ස්වභාවිකයි."

**බහුතර ජනතාවගෙ කැමැත්ත තියෙන්නේ තනි පක්ෂයක් හදන ආණ්ඩුවකට ද?**

මගේ මතය නම් මේ වෙලාවේ ස්ථාවර ආණ්ඩුවක් අවශ්‍යයයි. නමුත් බහුතර ජනතාව ඉන්නෙ එතැන නෙමෙයි. ජනතාව කැමති උදේට එකයි හවසට එකයි ආණ්ඩුවලට. නමුත් අපි මෙතන දෙයක් තේරුම් ගන්න අවශ්‍යයි. බහුතරයගෙ මතය නොසලකා හැරීම නිසා විශාල ප්‍රශ්න නිර්මාණය වෙන්න පුලුවන්. උදාහරණයක් විදියට 13 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවෙ බහුතර ජනතාව ඒකට විරුද්ධ වුණා. නමුත් ඒක නොසලකා හැරලා සංශෝධනය ගෙනාවා. අද ඒකේ අනිසි ප්‍රතිඵල අපි විඳිනවා. පළාත් පාලන අවුල ම ඒකට හොඳ උදාහරණයක්. ආණ්ඩුවෙන් ඉවත් වුණු පිරිසක් ස්වාධීන වෙන්න යනවා. තවත් පිරිසක් ඒකාබද්ධය එක්ක එකතු වෙයි. මේකෙන් සිද්ධ වෙන්නෙන් එජාපයට නැවත තනිව ම සටන් කරන්න වෙන එක. නමුත් නිදහස් පක්ෂ සුළු පිරිසක් එකතු කරගෙන හරි ආණ්ඩුව ගැටග හගෙන පවත්වගෙන යයි. පුංචි ඡන්දෙදි ජනතාව මීට දක්වන ප්‍රතිචාරය බලාගන්න පුළුවන්.


**බහුතර ජනතාවගෙන් නියෝජනය වෙන්නෙ වැරදි මතයක් නම්..**

සමහර විට එහෙම වෙන්නත් පුළුවන්. නමුත් ජනතාව ම තමයි මේ ආණ්ඩුව පත් කළේ. කිසිම පක්ෂයකට වැඩි බලයක් දෙන්නෙ නැතුව මේ දෙක එකතු කළෙත් ජනතාව ම තමයි. නමුත් ජනතාවට සෙතක් නම් වුණේ නැහැ. කොහොම නමුත් ආණ්ඩුව එදා වේල ගැටග හගෙන ඉදිරියට යයි. වාහන ගෙන්නලා පඩි වැඩි කරගෙන එයාල සැපෙන් සනීපෙන් ජීවත් වෙයි. ඒ නිසා ජනතාව හවුල් ආණ්ඩු එපා කියනවනම් ඒකත් සලකල බලන්න වෙනවා.

**ඔබ කියන්නෙ මේ බිඳීම නිසා ආණ්ඩුවට එතරම් බලපෑමක් නොවුණත් බහුතර ජනතාවට ඇහුම්කන් නොදීම නිසා ආණ්ඩුව අස්ථාවර වෙයි කියලද?**

ඔව්. දැන් ව්‍යවස්ථා ප්‍රශ්නෙදී අස්ගිරි පාර්ශවය නියෝජනය කරන්නේ මේ රටේ බහුතර සිංහල ජනතාවගේ මතය. රජය කරන්නෙ ඊට ප්‍රහාර එල්ල කරන එක. කදිරේශන් කෝවිලට ජරමා පල්ලියට තියෙන හයිය අස්ගිරියටත් තියෙන්න ඕනි. ඒකට අපහාස කිරීම වැරදියි. මේක ආණ්ඩුව වරද්ද ගත්ත එක තැනක් හැටියටයි මා දකින්නෙ. ඇත්තට ම මේ වෙලාවෙ ආණ්ඩුව ස්ථාවරව තබා ගන්නනම් කරන්න තියෙන එකම දේ බහුතර මතයට ඇහුම්කන් ඕනි දෙන එක.

**සංවාද සටහන**



නිලුපුල් විතානගේ

# ජාතිවාදයේ පැටලුණු ව්‍යවස්ථාවේ නූල්බෝලය

**ජාතිවාදය ලාංකේය භාවිතාව තුළ බෙදුම්වාදයට මුල පිරීමකි. ජාතික ආරක්ෂාවට තර්ජනයකි. වර්තමානයේ මෙය ඉතා සංකීර්ණ ස්වරූප තුළින් අප රවටමින් ඇති බව ප්‍රත්‍යෂයකි. කෙසේ වෙතත් ජාතීන් වශයෙන් බෙදීමෙන් වාසිය අත් කරන්නේ රට පසෙක තබා මං පෙරට න්‍යාය අනුගමනය කරන දේශපාලනය යි.**

දේශපාලනය හා ජාතිවාදය එකිනෙකට අනුලෝමව ක්‍රියාත්මක වන බලවේග දෙකක් බවට පත්ව ඇත්තේ නූතන සමාජ සංකීර්ණතා පුමුබ කොටගෙන ය. නමුත් ජාතිවාදීත්වය හා එකිනෙකාට උවමනා ලෙස ජනතාවගේ නොදැනුවත්කමින් ඔවුන් රූකඩ ලෙස නටවන අභ්‍යන්තර හා මේ දූපතින් එපිට සිට ක්‍රියාත්මක වන මහා පරිමාණ සැලසුම් නොමැති බවට කිසිවෙකුට තර්ක කළ නොහැකි ය. නමුත් පවතින යථාව තුළ වර්තමාන දේශපාලන සංකීර්ණතාවය සහ රටෙහි අනාගත ස්ථාවරය පවා ජාතිවාදී යන සංකල්පයෙන් පිට සිට සාකච්ඡා කිරීම අපහසු ය. සිංහල , මුස්ලිම් , දමිළ , බර්ගර් යන සියලු ජාතීන්ගේ නියෝජනයක් ශ්‍රී ලංකාව තුළ ප්‍රතිමාන වෙයි. එම නිසා දේශපාලනයේ දී ජනතා බලය නිර්මාණය වීමට ඉහත සියලු නියෝජනයන් අදාල වෙයි. සෑම රජයක්ම බලයට පත්වන්නේ මේ පසුබිම තුළ ය. එනම් රජයක් බලයට පැමිණෙන්නේ සිංහල හෝ දමිළ ඡන්ද මත පමණක් පදනම්ව නොවේ. රටේ පුරවැසි වන සියලු ජාතීන්ගේ ඡන්ද ඒ තුළ අන්තර්ගත වෙයි. එමනිසා නව ව්‍යවස්ථාව ඇතුළු අතුරුදහන්වූවන්ගේ පනත සම්මත කිරීම සඳහා මහානායක හිමිවරුන්ට පමණක් විරුද්ධ විය නොහැකිය. 2015 ජනතා බලයකින් මෙම ආණ්ඩුව පත්කරන්නේ බෞද්ධයින් පමණක් නොවන නිසාත් කාලානුක්‍රමිකව ගොඩනැගුණු විධායක බලතල අහෝසි කිරීමටත් බලය බෙදීමේ මධ්‍ය තවත් විකාශනය කිරීමටත් පොරොන්දු කරගනිමිනි.

### අස්ගිරියේ අයිතිය

රතන හිමියන්ට හෝ අස්ගිරි පාර්ශවයට ඊට එකහෙලා විරුද්ධ විය නොහැක්කේ එම පදනම මත පිහිටා ය. අනෙක් කරුණ නම් ජාතිවාදීත්වය මුවාවෙන් බෞද්ධයා උසිගන්වමින් ඒකීය රාජ්‍යයක් නොලැබීම සහ බෞද්ධයාට ප්‍රමුඛ ස්ථානය නොලැබෙන බවට හැඟවුම්කරණය කිරීම යි. ඥානසාර හිමියන් විසින් ඉස්ලාම් භක්තිකයන්ට එරෙහිව සමස්ත බෞද්ධයන්ගේ වෛරය මෙහෙය වීම කොතෙක්දුරට දේශපාලනික ද යන්න විමසිය යුතුවෙයි. අස්ගිරි පාර්ශවය විසින් අන්‍ය ආගම් හෙළා නොදකින බව කියමින් උගුරට හොරා බෙහෙත් බීම ද අස්ගිරි සංඝ සභාවෙන් ආණ්ඩුවට කොල එළියක් දැල්වූ ජුනි 20 දිනට පසු දිනයේ ඥානසාර හිමියන්ට ඇප ලබාදීමත් අතර ඇති සම්බන්ධය ද වක්‍ර දේශපාලන අරමුණු දෙකකි. දැන් නැවතත් බෞද්ධ අන්තවාදීන් වයින් වීමට පටන් ගන්නේ ඥානසාරගේ බලය ආරෝපණය කර ගනිමිනි.

දැන් සිංහල බෞද්ධයා උසිගැන් වී ඇත්තේ ජාතිවාදී බලාපොරොත්තු දේශපාලන තැනක ස්ථානගත කිරීමේ අරමුණෙනි. නමුත් බහුතර සිංහලයන් ඒ තුළින් අඳුරු යුගයකට ආපසු ගමන් යන බව නොදැන සිටීම කණගාටුවට කරුණකි. නව ව්‍යවස්ථාවට විරුද්ධ වීමෙන් අස්ගිරි මහා සංඝ සභාව බලාපොරොත්තු වන්නේ කුමක් ද? ඒකීය රාජ්‍ය යන සංකල්පය අහිමි වීම සහ ෆෙඩරල් ක්‍රමය ස්ථාපිත වීම සම්බන්ධ කතාවයි.

> **"මතභේදය වන්නේ යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ෆෙඩරල් ක්‍රමයක් ස්ථාපිත කරන්නේ ද යන්නයි. ඇත්ත වශයෙන් ම එය පූර්ණ වශයෙන් ම ෆෙඩරල් ක්‍රමයක් නොවේ. "**



### ෆෙඩරල් කතාව

නව ව්‍යවස්ථාව තුළ ඒකීය රාජ්‍ය යන්න පූර්ණ වශයෙන් අහිමි නොවන අතර පූර්ණ ෆෙඩරල් ක්‍රමක් ද නොවෙයි. ඒකීය රාජ්‍යයක් යනු සියලු පාලන ආයතන වෙත මධ්‍යම ආණ්ඩුවෙන් බලය බෙදා හැරෙන සහ මධ්‍යම ආණ්ඩුව අවසාන වශයෙන් උත්තරීතර වන රාජ්‍ය ක්‍රමයකි.

උදාහරණයක් වශයෙන් ලංකාවේ පළාත් සභා වෙත බලය බෙදාහැරෙන්නේ මධ්‍යම ආණ්ඩුවෙනි. එම බලතල අවශ්‍ය විටෙක ආපසු හරවා ගැනීමේ බලයත් මධ්‍යම ආණ්ඩුවට තිබේ. මතභේදය වන්නේ යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ෆෙඩරල් ක්‍රමයක් ස්ථාපිත කරන්නේ ද යන්නයි. ඇත්ත වශයෙන්ම එය පූර්ණ වශයෙන්ම ෆෙඩරල් ක්‍රමයක් නොවේ.

දැනට පවතින ආණුඩුක්‍රමයන් යටතේ දක්නට නොලැබෙන ආරක්ෂණ ක්‍රමෝපායන් පවා නව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වෙයි. යම්කිසි පළාත් සභාවක් කැඩී යාමට තැත් කළ හොත් එම පළාත් සභාව මධ්‍යම ආණ්ඩුවට පවරා ගැනීමේ බලයක් නව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත ය. නමුත් ජාතිවාදීත්වය මත නව ව්‍යවස්ථාව හකුලා ගැනීමට බල කරන ඇතැම් පිරිස් ගෙන එනු ලබන තර්කය නම් බෙදුම්වාදය පරාජය කළ හැකි වූයේ විධායක ජනාධිපති ක්‍රමයක් පැවති නිසා යන්න යි. නමුත් සැබැවින් ම බෙදුම්වාදය පරාජය වූයේ විධායක බලතල මත පිහිටා නොවෙයි. අගතියට පත් පාර්ශවයේ දුර්වලතා නිසා බව කිව යුතු ය. ඔවුන් දේශපාලන වශයෙන් අස්ථාවරව සිටි මොහොතක ජාත්‍යන්තර සහයෝගය බිඳෙමින් පැවති මොහොතක ය. විධායකයක් නොමැති ඉන්දියාව මහා බ්‍රිතාන්‍යය පවා ඉතා ශක්තිමත් රාජ්‍යයන් බවට පත්වීම මත විධායකයක් නොමැතිවීම නිශේධනීය ලෙස සලකනු නොහැකිය. බහු වාර්ගික බහු ආගමික රටක ප්‍රබලත්වය තීරණය වන්නේ ජාතීන් අතර සහයෝගය සහ සහජීවනය සුරක්ෂිතතාවය තුළයි.

රටේ ජාතීන් අතර සහයෝගීතාවය වර්ධනය කිරීමටත් සංවර්ධනය වඩාත් පුළුල් තලයකට පත්කිරීමටත් බලතල බෙදාහදා ගැනීම අත්‍යවශ්‍ය වෙයි. උදාහරණයක් ලෙස කොළඹ සිට පාලනය කරන කොළඹින් බැහැර පළාත් වන්නිය, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල සංවර්ධනය මන්දගාමී වන්නේ කොළඹ සිට එම දිස්ත්‍රික්ක පාලනය කරන නිසාවෙනි. නමුත් බලය බෙදීමේ මධ්‍ය වඩාත් පුළුල් තලයකට විස්තාරණය කළ පසුව එම ප්‍රාදේශිකයන්ට තම සංවර්ධන කටයුතු වඩාත් සීඝ්‍රයෙන් සිදුකිරීමේ පහසුව සැලසෙන්නේ ය. මේ නිසා විධාකය අහෝසි කිරීම සුළු ජාතීන්ට බලය ලබාදීමක් ලෙස අර්ථකථනය කිරීම සහමුලින් ම වැරදි ය. මෙම පසුබිම තුළ සිංහල ජාතිය යන ලේබලය අලවාගෙන නව ව්‍යවස්ථාවට එක හෙලා ම විරුද්ධ වන සංවිධාන හා පුද්ගලයින් සිටගන්නේ ජනතාව පැත්තෙහි නොවන බවත් යම් යම් පෞද්ගලික දේශපාලන අරමුණු පෙරදැරි කොටගෙන බවත් ලාංකිකයන් වන අප සියලු දෙනා වටහා ගත යුතුව ඇත.

බලහත්කාරයෙන් අතුරුදන් තහනම් කිරීමේ පනත දෙවෙනි වර පාර්ලිමේන්තුවේ කියවීමට නියමිත වූ ජූලි 5 වන දින එය නොපැවැත්විණි. ජාතිවාදී ඇතුලු

> **"අනෙක් කරුණ නම් ජාතිවාදීත්වය මුවාවෙන් බෞද්ධයා උසිගන්වමින් ඒකීය රාජ්‍යයක් නොලැබීම සහ බෞද්ධයාට ප්‍රමුඛ ස්ථානය නොලැබෙන බවට හැඟවුම්කරණයයි.**

අන්තවාදී කණ්ඩායම් මේ කෙරෙහි මැදිහත් වන්නේ ද වෙනත් දේශපාලන නියෝජනයක් වෙනුවෙන් විනා අන් කිසිවක් නිසා නොවෙයි. මෙම පනත ලාංකේය නීති පද්ධතිය තුළට අත්‍යවශ්‍ය ම පනතක් ලෙස හුවා දැක්විය හැකි ය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු ජාතීන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ ශ්‍රී ලංකාව පාර්ෂවකරුවෙකු වන්නේ 2016 ජුනි 24 වන දා සිට ය. එකී සම්මුතියේ බැඳීම් ඉටුකරනු වස් මෙවන් පනතක් ගෙන ඒම අනිවාර්ය විය. මෙමඟින් රණවිරුවන් බිලී බෑමකට ලක්වන බවක් මේ සඳහා විරුද්ධ වන්නන්ගේ අදහස නමුත් මෙම පනත ප්‍රකාරව වලංගු වන්නේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මතව කථානායක වරයාගේ අත්සන තැබූ මොහොතේ සිටයි. ඒ අනුව මෙම පනත ප්‍රකාරව ක්‍රියාත්මක වන විධිවිධාන යටතේ රණවිරුවාට විරුද්ධව නීතිය භාවිතා කළ නොහැකි ය. එසේ නම් මේ අන්තවාදී පිරිස් රණවිරුවා පෝරකයට යැවීම යන තේමා පාඨය මුල් කරගනිමින් ජනතාව මෙහෙය වන්නේ කුමන අභිප්‍රායකින් ද යන්න විමසිය යුතු වෙයි. ඒ සඳහා විරුද්ධ වීමට ඇතැම් භික්ෂූන්ට ඇති අයිතිය විමසිය යුතු වෙයි. පසුගිය කාලය මුළුල්ලේ අතුරුදහන් වූ මිනිසුන්ගේ අයිතිය වෙනුවෙන් තදබල ලෙස පෙනී සිටීමේ හැකියාව ඇති මෙම පනත විපක්ෂය හා ඇතැම් චීවරධාරීන් ප්‍රතික්ෂේප කරන්නේ තම තමන්ගේ කුණු නැවත ගොඩ එන නිසා බව පැහැදිලි ය. ජාතිවාදී උසිගැන්වීම් සිදුකරන පූජ්‍ය පක්ෂය ඇතුලු

මැති ඇමති වරුන්ද මීට වගකිව යුතු ය. බුද්ධශාසන හෝ අධිකරණ ඇමති වූ පමණින් ජාතිවාදී ප්‍රකාශ සිදුකිරීමට ඔහුට බලයක් නැත. සියලු ජාතීන්ගේ අයිතිය ව්‍යවස්ථාවෙන් ම තහවුරු කෙරෙන නිසාත් පෙරලා ඔහුත් එයට යටත් වන නිසාත් අන්තවාදී ප්‍රකාශ සිදුකිරීම ඔහුගේ සෞඛ්‍යට සුවදායී නොවේ. දේශපාලනය තුළට ජාතිවාදී හා වාර්ගිකවාදී මැදිහත් වීමේ අඳුරු සෙවනැලි දැන් දැන් මතුවෙමින් ඇත. 1956 දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායකයන් හා චෙල්වනායගම් අතර අත්සන් කිරීමට යෝජිතව තිබූ සහයෝගිතා ගිවිසුම කඩාකප්පල්කාරී කළේ එවකට සිටි ඇතැම් චීවරධාරීන් ය. එය නොවිසිඳුණු පරම්පරාගත වියවුලක් දක්වා වර්ධනය වෙමින් පැමිණෙයි. එවකට ඊට එරෙහිව හඬක් නගන්නට බණ්ඩාරනායක මහතා අපොහොසත් විය.

### ඉදිරි අඩිය

වර්තමානයේ ද ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ශක්තිමත්කම අවශ්‍ය ම මොහොත මෙය යැයි ජාතිවාදීන් නොවන ලාංකිකයන් වටහා ගත යුතුව ඇත. ඉදිරියට තබන නව පියවර ජාතිවාදයකට බියවී ආපසු හරවා ගතහොත් ඉදිරි අනාගතය පිළිබඳව ශ්‍රී ලාංකිකයන් වශයෙන් නිගමන සෙවීමට අපොහොසත් වනු ඇත.

නව ව්‍යවස්ථාව තුළ බුද්ධාගමට හිමි ප්‍රමුඛ ස්ථානය අහිමි කරන්නේද යන්න පිළිබඳව මත ගැටුම් පවතියි. නමුත් ව්‍යවස්ථාපිතව බුද්ධාගම සතු ප්‍රමුඛත්වය සුරකිනු ලබයි. ආසාද් සාලි වැනි දේශපාලඥයින් සහ ඥානසාර වැනි ආගමික පූජකයින් වටහා ගත යුතු වන්නේ ජනතාව දෙපැත්තට ඇදීම නොව එක්තැන් කිරීමයි. අනෙක් කරුණ නම් අස්ගිරියේ සංඝ සභාව වටහා ගත යුතු වන්නේ ව්‍යවස්ථාදායකයේ බලතල සංඝ සභාවට නොමැති බවත්, දේශපාලනය කෙරෙහි මැදිහත් වීමේ සීමාව උගත යුතු බවත් ය.

ලෝෂිනී සෞම්‍යා අත්තනායක

# උඩුගං බලා යන සින්තටික් ජීවිත

**දැනට දශක දෙකකට පමණ පෙර පැවති සමාජයේ ජීවත් වූ මිනිසුන්ගේ ඇවතුම් පැවතුම්වල, ඇඳුම් පැලඳුම්වල, ආහාරපාන සිරිත් විරිත්වල, විතරක් නොවේ, කතාබහේද සරල බවක්, චාම් බවක් තිබුණා. නමුත් අද වන විට ලාංකේය මිනිස් සමාජය ගෝලීයකරණය හා අති නවීන සන්නිවේදන තාක්ෂණය සමඟ නන්නත්තාර පිරිසක් බවට පත්වෙලා. අද වන විට මැක්ඩොනල්ඩ්, KFC, pizza hut සිට කෘතීම ආහාර රටාවෙන් සම්ප්‍රදායික ආහාර රටාව ගිලගනිමින් බහුජාතික සමාගම්වල ඇලෙමින් සිටී. චීත්තය , , සරම වෙනුවට ඩෙනිම් කලිසම ,ත්‍රීක්වාට් , හයිහීල්ස් , ඩෙක්ෂූස් , නැතිවම බැරි ෆැෂන් වෙලා. කොණ්ඩය කලර් , ටින්ට් , ෆර්ම් කිරිම අද යෞවනයේ රැල්ල බවට පත්වෙලා.**

බාහිරව පමණක් නොව අධ්‍යාත්මිකව අප විඳිනා ගීතය අද අසා සිටිය නොහැකි පහත් රසවින්දනයක් ගෙන එන්නක් බවට පත් වෙලා. අර්ථ , රස , භාව තුළින් සපිරුණු ගීතයක් වෙනුවට භාෂා කිහිපයකින් මර ලතෝනි දෙන , දෙපිට කැපෙන වචන තියෙන ඩ්‍රම්-බීට් තාලයට එලොව මෙලොව අමතකවී, නටමින් කෑගසන සංකර වූ පරපුරක් අද වන විට බිහිවී අවසන්. fm චැනල්වල, Tv චැනල්වල තලු මරන ඕපදූපයන්ගෙන් පිරුණු, නළු නිළියන්ගේ බහුරූ කෝළම්වලින්, ස්ටාර් තරඟවලින් පිරීගිය විකාර රූපී වාණිජ ප්‍රදර්ශනකාමී රැල්ලකින් රසවින්දනය උදුරාගෙන ගොසින්. රූපවාහිනි මෙගා ටෙලිනාට්‍ය අද වන විට සෑම නිවසක්ම වසා පැතිරගෙන සිටින පිළිලයක් මෙනි. සාම්ප්‍රදායික බව සංස්කෘතිය, හැදියාව, විනිතකම කොටින් ම අද අපේ මුලු ශරීරයම ලාභ අරමුණුවල ඉත්තන් බවට පත්වෙලා.

අපේ හිත් පහුරු ගා සුන්දර ලෝකවල අපව අතරමං කරවා, අපේ පොකට් එකට තට්ටු කරන මගෝඩි අරමුණක් පෙරදැරි කරගනිමින් සිදුකරන දැලක අප පැටලී අවසන්. අප විසින් මානව ප්‍රගමනය උදෙසා සිදුකළ යුතු සියල්ල වෙළෙන්දන්, ඔවුන්ගේ ප්‍රාග්ධන ලාභ අපේක්ෂාවන් වෙනුවෙන් අපෙන් උදුරාගන්නට මාන බලමින් සිටී. මෙවැනි අවිඥානික දේවල් සමඟ නිරන්තරයෙන් අප ඔවුන්ගේ රූකඩ බවට පත්වන්නේ අපටත් නොදැනීමයි.

තමන්ට සහජයෙන් ලැබුණු රූපසොබාවෙන් සෑහිමකට පත්නොවී, තමන් කැතයි, කලුයි කියා පසුතැවෙමින්, සුදු වන්නට දඟලන බොහෝ තරුණියෝ කුට වෙළඳුන්ගේ ඇම ගිලිමින් සුදුවන්නට විවිධාකාර ක්‍රීම් වර්ග ඇඟේ ගායි. ඇගේ මස් පිඩු ජේන් සීනාගේ වගේ නැතැයි සිතා වෙළඳුන්ගේ උප්පරවැට්ටිවලට රැවටී තම ඇඟ හදාගැනීමට කෘතිම ශක්තිවර්ධක යැයි හඳුන්වා දෙන ඊනියා ආහාර පාන වර්ග කන්නට පුරුදු වී අවසානයේ ලෙඩ දුක් සදාගනිමින් විඳවයි.

ඊළඟ කතන්දරය ගම සහ නගරය අතර සිදුවන වෙනස ගැනයි. ගමේ මිනිසුන් පමණක් නොව ගහකොළ සතා සීපාවා ද, නගරය විසින් ගිලගනිමින් සිටී. ඉස්සර ගමේ දිළිඳු ගොවියා තිරිසන් සතා සීපාවාට හා සොබාදහමට ආදරය කළා. පය තබන්නට භූමියත්, කුස පුරවන්නට ආහාරත්, ලෙඩට දුකට ඖෂධත්, පිපාසය දිය පොදත්, පණ ගැහෙන්නට හුස්ම පොදත්, ඒ ආදරයට ප්‍රතිඋපකාර ලෙස සොබාදහම අපට දුන්නා. ඒ උපකාර සම්පත් කරගනිමින් අපි දියුණුව නම් ආශ්චර්ය වෙත උඩුගං බලා පිහිනුවා. අහස අල්ලන විසල් ගොඩනැගිලි, අධිවේගි මංමාවත්, එල්ලෙන පාලම්, සොඳුරු උයන්, ඇවිදින මංතිරූ, අපේ දියුණුවේ ඉලක්ක වුණා. මේ සොඳුරු පියකරු මඟ සරසන්නට නගරයේ අය ගම්වලට පැන මහා වනන්තර බිඳ දැව හොරෙන් කැපුවා. මේවාට පර්මිට් හදන්නේ නගරයේ මුදලාලිලා නැතිනම් නගරය රජ කරන දේශපාලනඥය යි. අනාගත පරපුරට හුස්ම පොදක් සපයන්නට හෝ ඉතිරි කළ යුතු වනරක්ෂණයන් වේගයෙන් විනාශ වීමට ලක්වෙනවා. වසර ගාණක් පුරාවට ගලාගෙන ගිය සුන්දර ගංගා, ඇළ මාර්ග හරස් කරමින් හිතුමතේ ජල ව්‍යාපෘති සිදුකරනවා. මේ සියල්ල අපගේ භෞතික දියුණුව පසක් කරනා තාවකාලික සුන්දරත්වයක් පමණයි. ඒ භෞතික දියුණුව යට අපට අමතක වුණු අපට මඟහැරුණු බොහෝ දේ සැඟව තිබුණා. සැබවින්ම අපට අපේ සොබාදහම අමතක වුණා. මහ වැස්සකට දොරේ ගලන ගංගාවන්හි ජලය පිරෙන්නට ඉඩ ඉතිරි වූ වෙල්, කඩොලාන, වගුරුබිම් සංවර්ධනය මුවාවෙන් පස්වලින් පුරවලා මහා ගොඩනැගිලි ඉදිකළා. කඳුමුදුන් සෝදා පාලුවෙන් ආරක්ෂා කරන වෘක්ෂලතා සියල්ල බිඳදමා ලී මුදලාලිට පිටරටුන්ට විකිණුවා. මුහුදු වෙරළේ කඩොලාන පරිසර සියල්ලක්ම විනාශ කර ආකර්ෂණීය සංචාරක නිකේතන ඉදිකළා. අද වෙන කොට සුළු වැස්සකට පවා පිරෙන වැසිදිය බැස යන්නටවත් නොහැකි වූ කාණු පද්ධති, ඇළිවේලි, නිම්න බෝක්කු වසාගෙන කොළඹ නගරය පුරා පෙන්වා තිබෙන්නේ ප්‍රදර්ශනාත්මක දියුණුවක් පමණකි. ඒවායේ ප්‍රමිතිය සුළු වැස්සකට පවා ඔරොත්තු නොදෙන තරමට ප්‍රාථමිකයි. කඳුකරයේ පස්කපා කොටා පෙරලා සොබාදහමේ සමතුලිත බව නැති කළා. මේ සියල්ල ඉවසා සිටි සොබාදහමේ ඉවසීමේ සීමාව පසුගිය ජූනි මාසයේ ඉක්මවා ගියා. වියරු වැටුණු සොබාදහම "මෝරා" සුළිකුණාටුව සමඟින් අපේ රටේ ප්‍රදේශ රැසක් ජලයෙන් යට කර බොහෝ හානි සිදුකරමින් විනාශයේ උපරිමය ජනතාව වෙත ලබාදුන්නා. ගිය වසරේදිත් මෙවැනිම පාඩමක් ස්වභාවදහම අපට කියාදුන්නත් නැවතත් එවැන්නක් ම සිදුවන්නේ අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් ඉවසා සිටිය නොහැකි තැනය. එක් ඡන්දයක් මනාපයක් බලාපොරොත්තුවෙන් මෙවැනි අවස්ථාවන් හිඳි ද රොත්ත පිටින් මිනිසුන්ගේ උපකාරයට පැමිණෙන දේශපාලකයින් දැකීම ද සැබෑ විහිලුවක්. ඔවුන් මිනිසුන්ට දක්වන සැබෑ ආදරය නම්, අදූරදර්ශී ලෙස සිදුකරන නාගරික ඉදිකිරීම් සහ සංවර්ධන කාර්යන්, පරිසර හිතකාමී ලෙස ස්වභාවිකව සකස් කර මෙවන් විපතක් නැවත නැවතත් සිදුනොවීමට පියවර ගැනීම නොවේද ?



> **"අද අපේ මුලු ශරීරයම ලාභ අරමුණුවල ඉත්තන් බවට පත්වෙලා. අපේ හිත් පහුරු ගා සුන්දර ලෝකවල අපව අතරමං කරවා, අපේ පොකට් එකට තට්ටු කරන මගෝඩි අරමුණක් පෙරදැරි කරගනිමින් සිදුකරන දැලක අප පැටලී අවසන්."**

එල්ලිලා ඉන්නේ වව්ලො විතරක් කියලා හිතුවට මේ වෙනකොට තවත් පිරිසක් එල්ලිලා ඉන්න පටන් අරන්. නමුත් ඔවුන් එල්ලිලා ඉන්න තෝරගෙන තියෙන්නේ ගස් නම් නෙවේ. ඒ තරමටම අම්මලාට තාත්තලාට ගලවාගන්න බැරි තරමටම අද වන විට පාසල් දරුවන්, තරුණ තරුණියන් අන්තර්ජාල මාධ්‍යන් සමඟ ඇඟෑලුම් පාන්නට පටන්ගෙන තිබෙනවා. කුඩා දරුවාගේ පටන් පාසල් දරුවා තරුණ තරුණියන් දක්වාම ජංගම දුරකතනයක් නොතිබේනම්, එය පුදුමයක්. Face Book, you tube, whatsup, viber, imo මෙකී සියල්ල තුළ වත්මන් තාරුණ්‍ය ගලවාගත නොහැකි ලෙසින් ආකර්ශනය වී අවසන්.

කුඩා වයස්වලදී නොදැකිය යුතු සියල්ල අසීමාන්තික නිදහසකින් යුතුව මොවුන් විඳිනවා. දරුවන් මෙවැනි වයස්වල ගනු ලබන තිරණ කෙරෙහි වැඩි වශයෙන් බලපා තිබෙන්නේ ද, විවිධ දේවල් අනුකරණයට පෙලඹී තිබෙන්නේ ද, ඔවුන් අසන දකින යම් යම් දේවල් මගිනි. සයිබර් යහළුවන් පිරිවරාගනිමින් ඔවුන්ගේ ලෝකයන්හි අතරමං වන මොවුන්ට දෙමාපියන් සමඟ සුහදව වචන කිහිපයක් කතාබහ කිරීමට පවා ඉඩ හසරක් නොමැත. මෙවැනි තත්ත්වයක් මත අද වන විට දරුවන් දෙමාපියන් නොහඳුනන සමාජ වටපිටාවක් නිර්මාණය විම පුදුමයක් නොවේ.

ගෝලීයකරණය නමැති සාහසික බූවල්ලා තම අතපය දිගහරිමින් අප වැනි රටවල්වල සංස්කෘතිය සභ්‍යත්වය ,සදාචාරය පමණක් නොව, මිනිස් ජීවිත පවා සූරා ගනිමින් සිටී. දේශපාලකයින් පිටරටුන්ගේ පදයට නැටීමේ ප්‍රතිඵල ලෙසද, විටක මේවා පෙනී සිටී. ආහාර පාන, විලාසිතා ,රූපලාවන්‍ය ,රසවින්දනය ,අධ්‍යාපනය ,සමාජ දරිද්‍රතාවය මෙන්ම අවසානයේ මුළු මහත් සෞඛ්‍ය සම්පන්න ජීවිතය ද වත්මන් පරපුරට අහිමි කරමින් සිටි. මේවා කල්පනාකාරිව නවතා නොගතහොත්, හෙට අනිද්දා වැටත්-නියරත් නොහඳුනන, මිනිසා-තිරිසනා නොහඳුනන,

> **"එල්ලිලා ඉන්නේ වව්ලො විතරක් කියලා හිතුවට මේ වෙනකොට තවත් පිරිසක් එල්ලිලා ඉන්න පටන් අරන්. නමුත් ඔවුන් එල්ලිලා ඉන්න තෝරගෙන තියෙන්නේ ගස් නම් නෙවේ."**

දැනට පවතින සදාචාරයවත් නොරකින හුදු අඳ බාල පාතාල සමාජයක් නිර්මාණය වනවා නොඅනුමාන යි.

මේ තත්ත්වය මත සෑම අතින් ම නීරෝගි යහපත් අනාගත ශ්‍රී ලංකාවක් සකස් කිරීමට සමත් ආදරණීය වැඩිහිටි පරපුරක් මෙන් ම, රජයේ මැදිහත් වීමත් අන් කවරදාකටත් වඩා අපේ මහපොළව දැන් දැන් අපෙන් ඉල්ලා සිටී.



# නැගීමේ හා බැසීමේ කලාව



සානිකා දිසානායක

**ජපානය දියුණු රටක් බවට පත්වූයේ දෙවන ලෝක යුද්ධය අවසානයේ බිමටම සමතලා වීමෙන් පසුව බව සෑම දෙනාම දන්නා කරුණකි. නමුත් ජපානයේ තාක්ෂණික කර්මාන්ත ආරම්භ වූයේ දෙවන ලෝක යුද්ධයට බොහෝ කලකට පෙරය. එරට රථ වාහන නිෂ්පාදනයේ ඉතිහාසය 1912-1926 අතර පැවති ටයිෂෝ යුගය තෙක් දිව යයි. පළමු ලෝක යුද්ධයෙන් අනතුරුව රජයේ සහ හමුදාවේ අවශ්‍යතාව මත විවිධ නිෂ්පාදකයින් විසින් යුධ ට්‍රක් රථ නිෂ්පාදනය, ජපන් වාහන නිෂ්පාදන කර්මාන්තයේ ආරම්භයයි.**

වාහන නිෂ්පාදන එලෙසින් ආරම්භ වූ පසුව නිසාන් සහ ටොයෝටා සමාගම් විසින් ගෘහස්ත රථ නිෂ්පාදනය ආරම්භ කළහ. වසර 1933 දී නිහොන් සන්ග්යෝ විසින් නිසාන් කර්මාන්ත ශාලාව ආරම්භ කරන ලද අතර ටොයෝටා නම්වූ රෙදි නිෂ්පාදන යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයා විසින් එම වසරේදීම සිය වාහන නිෂ්පාදන අංශය ආරම්භ කළේ ය,

කෙසේ වෙතත් දෙවන ලෝක යුද්ධ සමයේදී ජපන් ගෘහස්ථ වාහන නිෂ්පාදන කර්මාන්තය වැඩි දියුණුවක් පෙන්නුම් නොකළේය. එම කාල සීමාව තුළ නිෂ්පාදනය වූයේ යුධ ට්‍රක් රථ , ප්‍රවාහන ට්‍රක් රථ සහ බස් රථ පමණි. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව 1950 වසර වනතෙක් වසර පහක කාල සීමාවකට ජපන් රථ වාහන නිෂ්පාදන කර්මාන්තය මිත්‍ර හමුදා යුධ මූලස්ථානය විසින් තහනම් කර තිබිණි. තහනම අවසානයේ ටොයොටා සහ නිසාන් නැවත සිය නිෂ්පාදනය ආරම්භ කළහ. වසර 1950 සිට ජපානය විවිධාකාර නිෂ්පාදන රැසක් ආරම්භ කරමින් සුවිසල් ආර්ථික දියුණුවක් ලබා ගත්තේ ය. යුද්ධයට පෙර විවිධ නිෂ්පාදන සඳහා තිබූ අපනයනය වෙළඳ පොළ වෙත රිංගා ගැනීමට මේ කාලය තුළ ජපන් නිෂ්පාදකයා සමත් විය. රෙදිපිලි, පිඟන් බඩු සහ ඔරලෝසු වැනි විවිධ භාණ්ඩ සඳහා විදේශ වෙළෙඳ පොළඉතා සුළු කාල සීමාවක් තුල ජපන් නිෂ්පාදකයා ජය ගත්තේය. එවැනි නිෂ්පාදන පමණක් නොව දේශීය මෙන්ම විදේශ වෙළඳ පොළ සඳහා විදුලි උපකරණ ද සුළු පරිමාණයෙන් නිෂ්පාදනය විය. විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදන මගින් විදේශ විනිමය රට තුළට ගලා ගෙන එන්නට වූ වහාම ජපන් ආර්ථිකය ස්ථාවර වන්නට පටන් ගත්තේ ය. මේ නිසා රටේ ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව වර්ධනය වූ අතර ඔවුන් විසින් ශීතකරණ, රෙදි සේදීමේ යන්ත්‍ර, විදුලිපංකා, ට්‍රාන්සිස්ටර් රේඩියෝ වැනි විදුලි උපකරණ මිලදි ගැනීමට පෙළඹුණි. මේ නිසා ජපානය තුළ විදුලි උපකරණ නිෂ්පාදනය ඉමහත් දියුණුවට පත්වුණි . නිදහස ලබනා කාලය වන විට ලංකාව මුළුමනින් ම කෘෂි ආර්ථිකය මත රඳා පැවතිණි. කර්මාන්ත ශාලා පැවතියේ තේ රබර් සහ පොල් නිෂ්පාදනය වෙනුවෙන් පමණි. වෙනත් නිෂ්පාදන කෙරෙහි මෙරට පාලනය කරන ලද ඉංග්‍රීසි ජාතිකයන් සිත යොමු නොකළ නමුදු ශ්‍රී ලංකාව එවකට ආසියාවේ ධනවත්ම භාණ්ඩාගාරයට හිමිකම් කීවේය. දෙවන ලෝක යුද්ධය අවසානයේ ඉංග්‍රීසීන් ස්වෙච්ඡාවෙන්ම මෙරටින් පිටවූයේ බල ලෝභී නායකයන් රැලකට රට භාර දෙමිනි.

මේ ඊනියා නායකයන් රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැංවීම කෙරෙහි කිසිදු අවධානයක් යොමු නොකරනා ලද අතර තමන් වෙත බලය රඳවා ගැනීම කෙරෙහි පමණක් අවධානය යොමු කළහ. බල ලෝභයෙන් පෙළුණු බණ්ඩාරනායක විසින් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු නමින් ඊනිසා පංච මහා බලවේගය බලමුළු ගන්වා සිංහල රාජ්‍ය භාෂාව බවට පත් කර, පසු කලෙක තිස් අවුරුද්දක් පුරා රට විනාශය කරා ගෙනගිය ජාතිවාදි යුද්ධයක මඟ හෙළි කළේය.

පසුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් උගත් වාමාංශික දේශපාලන නායකයන් රැසක් සමඟ සන්ධානගතවී සමගි පෙරමුණු රජය පිහිටවූ අතර එම රජය තුළ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැංවීමට මුල් පියවර ගත්තේය. රටක නිෂ්පාදන ආර්ථිකය ගොඩ නැංවීමට මූලික සාධක වන යකඩ හා වානේ කර්මාන්ත,වීදුරු නිෂ්පාදනය, දූව සැකසීමේ කර්මාන්තය වැනි මහා පරිමාණ කර්මාන්ත රජය විසින් ආරම්භ කරන ලදී . රට තුළට ආනයනය මුළුමනින්ම නවතා දමූ අතර එතුළින් සුලු පරිමාණ කර්මාන්ත ආරම්භය සඳහා හිතකර පරිසරයක් ගොඩ නැංවිය . උපාලි විජේවර්ධන වැනි කර්මාන්ත කරුවන් මේ අවදියේදී හිස එසවීය. නමුත් සමගි පෙරමුණු රජය එක තැනකදී මාරාන්තික වරදක් සිදු කළේ ය. එනම් රට තුළ සිටි ප්‍රධාන ආයෝජකයන් වූ වැවිලිකරුවන්, වතු ජනසතුව මගින් විනාශ කර දැමීම ය. මේ හේතුවෙන් රටේ ප්‍රධාන ආර්ථිකය විනාශ විය. කෙසේ වුව ද රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගෙමින් පැවතිණි. සංවෘත ආර්ථිකය තුළ ජනතාව වෙත තිබූ පීඩනය අවස්ථාවාදී ලෙස ප්‍රයෝජනයට ගත් ජේ.ආර් ජයවර්ධන සුවිසල් බහුතරයක් සහිත ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කළේ ය. ජනතාව වෙත දුන් වන්දි පොරොන්දුවක් වූ විවෘත ආර්ථික ප්‍රතිපත්ති කිසිදු වග විභාගයකින් තොරව ක්‍රියාත්මක කරනා ලද්දේ ය. මේ හේතුවෙන් විදේශ නිෂ්පාදන කිසිදු පාලනයකින් තොරව රට තුළට ගලාගෙන ආවේ නැගී එන දේශීය කර්මාන්ත කරුවන් වනසා දමමිනි. අවසානයේ ජේ.ආර් ජයවර්ධන දේශපාලනයෙන් සමුගත්තේ වැරදි රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිපත්ති හේතුවෙන් රට තුළ සිවිල් යුද්ධයකට මුල පුරා රට විනාශ මුඛයට ඇද දමමිනි. මේ වන විට රට තුළ නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් ඇඟලුම් කර්මාන්තයට සීමා වී පවතියි. කෙතරම් දියුණු ඇඟලුම් කර්මාන්තයක් තිබුණ ද රටේ ජනතාව චීන ඇඟලුම් භාවිත කරන්නට තරම් පහත් තත්ත්වයකට පත්ව සිටිති. විදුලි උපකරණ, පරිගණක පමණක් නොව උදලු වැනි ප්‍රාථමික කෘෂි උපකරණ සහ සෙල්ලම් බඩු පවා චීනයෙන් ගෙන්වමින් මෙරට කාන්තාවන් විදේශයන් හි බැලමෙහෙවර කරමින් ගෙන එන විදේශ විනිමය කාබාසිනියා කර දමති. අවම වශයෙන් ත්‍රී රෝද රථයක් නිෂ්පාදනය කෙරෙහි වත් අවධානය යොමු කර නැත. ඒ වෙනුවට රටම වෙහෙස වෙමින් චීනයේ නිෂ්පාදකයා පොහොසත් කරමින් සිටින්නෙමු.ලංකාවේ කලදසාවට අනාගතයේදි කුමක්වේවි ද? සිතාබලන්නේනම් කාටකාටත් හොඳක් මිස නරකක් නොවෙනු ඇත.

# කඩුල්ලෙන් පැන බලමු



සුභාෂිණී පෙරේරා

**වත්මන් ලාංකේය ටෙලි නාට්‍ය කලාව ණයට මඟුල් කෑමක් බඳු වී ඇත. සතුට හා වින්දනය උදෙසා පුංචි තිරයට අසල්වැසි රටවල් වලින් ඉල්ලාගත් දෑ බුරුතු පිටින් ගෙන එමින් තිබේ. මුලදී ඒවායේ කිසියම් සෞන්දර්යයක් දැකගත හැකි වුව ද දැන් දක්නට ලැබෙන්නේ වට්ටෝරුගත කතාතේමාවන් කිහිපයක් පමණි.**

පිටරටින් ගෙන්වා ප්‍රචාරය කරන ටෙලිනාට්‍ය රූපවාහිනී විකාශන කාලය පැහැරගනිද්දී, ලංකාව තුළ නිෂ්පාදනය කරන ටෙලි නාට්‍ය බොහෝමයක් ලාබ බඩු මෙන් හරසුන්ව ඉදිරිපත් කරන බව පෙනෙයි. ඉඳහිට ඇතැම් නාලිකා වල හරවත් මෙන්ම සෞන්දර්යයෙන් අනූන නිෂ්පාදන ද තිබෙන බව මෙහිදී කිවයුතුය. මෙවර රයිගම් සම්මානයට පාත්‍ර වූ "තනි අතට යන පාර" නම් ටෙලි මාලාව ද එවැන්නකි. නමුත් එම නාට්‍ය අවසන් කොටස වනතෙක් නරඹන්නට ඇත්තේ මෙරට අතිමහත් ප්‍රේක්ෂකයින්ගෙන් කීයෙන් කීදෙනෙක් විය හැකිද.

වින්දනය සමඟ හරය රැගෙන එන ටෙලි නාට්‍ය නිර්මාණය කිරීමේදී මෙරට අධ්‍යක්ෂකවරුන්ට මුහුණ දීමට සිදුවන බාධකයන් බොහෝමයකි. මුදල හා කාලය ඒ අතර ප්‍රධාන තැනක් ගනී. අද මෙන් ගමනාගමනය පහසු නොවූ සැප පහසුකම් අවම කාලවකවානුවල බිහි වූ ඇතැම් ටෙලිනාට්‍ය අද මහා පරිමාණයෙන් නිපදවන මාලා නාටක වලට වඩා රස ජනනයෙහි සමත් වූ බව කිව යුතුය. එදා කටුක ගම්දනව් වල දර්ශනතල තුළ සැරිසැරමින් ටෙලිනාට්‍ය කණ්ඩායම් දැරූ මහන්සිය අද කොළඹට වී නව තාක්ෂණයෙන් කළ හැකි වුවත් එවන් නිර්මාණකරුවන්ගේ ද, නිර්මාණ රසවිඳින්නන්ගේ ද හිඩැසක් නිර්මාණය වී තිබේ. හරවත් නිර්මාණ පිළිබඳවද මැසිවිලි නැඟෙනු පෙනෙයි. වඩාත් ප්‍රබල කතාතේමාවන් සහිත වත්මන් ටෙලිකතාංගයන් වල අරුත් වටහා ගැනීමට සාමාන්‍ය ප්‍රේක්ෂකයාට නොහැකි යයි එක් මැසිවිල්ලක් වෙයි. විදග්ධ ප්‍රේක්ෂකයින් පමණක් ඉලක්ක කරගැනීම ද එවැන්නකි. විකාශන වේලාවන් දවසේ කාර්යබහුල වේලාවන් වීම සහ දුවා දරුවන්ගේ හා දෙමාපියන්ගේ ද රුචිකත්වය එකවර පැහැරගරනීමට සමත් නොවීමද එවැන්නකි.

මීට දශක කිහිපයකට පෙර ජාතික රූපවාහිනිය ජාතියේ රසවින්දනය බාරගෙන තිබුණු අවධියක මෙපමණ මැසිවිලි නැඟීමට එකළ රූපවාහිනී ප්‍රේක්ෂකයාට අවශ්‍යතාවයක් නොවීය. පුංචිතිරයට එකළ නිර්මාණය කෙරුණු ටෙලි නාට්‍ය සියල්ලම පාහේ උසස් ගුණයෙන් යුතු වූවා පමණක් නොව පවුලේ සියල්ලන්ටම එකසේ රසවිඳිය හැකි විය. ඒ අතරින් ඇතැම් ටෙලිනාට්‍ය සමාජ යථාර්ථය මැනවින් නිරූපණය කරන්නට සමත්වූ ගැඹුරු ජීවන දෘෂ්ටීන්ගෙන් යුතු වූවා මෙන්ම එහි මතුපිට අර්ථය පවා මනාරූප සමෝධානයකින් යුක්තව බාල මහලු සියල්ලන් සන්තෘප්ත කිරීමට සමත් විය. දිමුතු මුතු, කන්දෙ ගෙදර, ලා හිරු දහසක්, වෙද හාමිනේ, පස්සෙ ගෙනා මනමාලි, පළිඟු මැණිකේ, දඬුබස්නාමානය, කඩුල්ල වැනි කතාංගයන් ඉන් අතලොස්සකි. ඒ අතරින් මෙරට බිහිවූ විශිෂ්ටතම ටෙලිවෘතාන්තයක් ලෙස එදා මෙදා තුර විචාරක පැසසුම් ලැබූ කඩුල්ල ටෙලි නාට්‍ය ප්‍රමුඛත්වයක් ගනී.

කඩුල්ල ටෙලි නාට්‍ය පිළිබඳ

15 පිටුවට

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවය

## වඩා කාර්යක්ෂම කරවිය හැකිද?

**"තොරතුරු අපේක්ෂාවෙන් ජාතික පුස්තකාලයට යන පුද්ගලයන්ට මහත් ප්‍රශ්නයක් වී ඇත්තේ විශ්වවිද්‍යාල ශිෂ්‍යාට, පාසල් ශිෂ්‍යාට මෙන් ම පුවත්පත් ආශ්‍රයෙන් දීර්ඝ වශයෙන් පර්යේෂණ කරන්නවුන්ට මේ මුදලට ස්කෑන් පිටපත් ලබා ගැනීමට අපහසු හෙයිනි."**

නලිනිකා ලක්ෂාණි



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමගින් ක්‍රියාත්මක වන ජාතික පුස්තකාලය ක්‍රියාත්මක වන්නේ දැනුවත් සමාජයක් බිහිකිරීම උදෙසා විවිධ අරමුණු අපේක්ෂා කර ගනිමිනි. ජාතික පුස්තකාලය සතු තවත් වැදගත්කමක් වන්නේ 1976 සිට මේ දක්වා පළවූ සියලුම විකල්ප හා ජාතික පුවත්පත්වල එකතුවක් පවත්වාගෙන යාමයි. මේ ලිපියට හේතු පාදක වන්නේ පර්යේෂකයින් හා තොරතුරු ලබා ගැනීමේ අරමුණින් ජාතික පුස්තකාලය වෙත යන්නවුන් මුහුණපාන ගැටළු කිහිපයකි.

සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන ආකාරය අනුව ජාතික පුස්තකාලය පරිශීලනය කරන පාඨකයන්ගේ පහසුව උදෙසා ඡායා පිටපත් ලබාදීම, නව ප්‍රකාශන එකතුන් ප්‍රදර්ශනය, පරිගණක සුචිය තුළින් පොත් තෝරා ගැනීමට සහාය වීම, පටුන පිටු සේවාව, සාහිත්‍ය ගවේෂණ කටයුතු ආදී විවිධාකාරයේ තොරතුරු ලබා දීමේ ක්‍රම රැසක් පුස්තකාලය විසින් ඉටු කරනු ලබයි. නමුත් 2016.06.23 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි පුවත්පත් එකතුව ආශ්‍රිත ඡායා පිටපත් ලබා දීමේදී ඡායා පිටපත් සේවාව වෙනුවට ස්කෑන් පිටපත් ලබා ගැනීම දක්වා සීමා වී ඇත. මෙය පාඨකයින්ගේ පහසුව තකා ක්‍රියාත්මක කළ බව දැක්වූව ද සිදු වී ඇත්තේ පාඨකයින්ට හිරිහැරයකි. A3 පිටු වර්ගයෙන් ලබා ගන්නා එක් පුවත්පත් ස්කෑන් පිටපතක මිල රුපියල් 130කි. මේ දැනට ලබා ගත හැකි ස්කෑන් පිටපත් වර්ගයයි. A4 පිටපතක මිල රුපියල් 15ක් යනුවෙන් සඳහන් කළ ද පුවත්පතක පිටපතක් A4 ප්‍රමාණයෙන් ලබා දෙන්නේ නැත. එහි පිටපතක් අවශ්‍ය නම් ලබා ගැනීමට සිදුවන්නේ රුපියල් 115ක් ගෙවා සංයුක්ත තැටියක ගබඩා කර ගැනීමෙන් හෝ රුපියල් 130ක් ගෙවා A3 ප්‍රමාණයෙන් ස්කෑන් පිටපතක් ලබා ගැනීමෙනි. මෙය තොරතුරු අපේක්ෂාවෙන් ජාතික පුස්තකාලයට යන පුද්ගලයන්ට මහත් ප්‍රශ්නයක් වී ඇත්තේ විශ්වවිද්‍යාල ශිෂ්‍යාට, පාසල් ශිෂ්‍යාට මෙන් ම පුවත්පත් ආශ්‍රයෙන් දීර්ඝ වශයෙන් පර්යේෂණ කරන්නවුන්ට මේ මුදලට ස්කෑන් පිටපත් ලබා ගැනීමට අපහසු හෙයිනි. අනෙක් කාරණය නම් ඊ මේල් කරමින් පිටපත් ලබා දීම ද මේ වන විට ක්‍රියාත්මක වන්නේ නැත. දිනකට මෙම පුස්තකාලයෙන් පර්යේෂකයින් ඇතුළු තොරතුරු අවශ්‍යතාවයක් ඇති බොහෝ පිරිස් සේවා ලබා ගන්නේ අති විශාල අන්දමිනි.
පුස්තකාලයට ගොස් කාලය කා දමමින් තමන්ට අවශ්‍ය තොරතුරු ග්‍රන්ථයන් හෝ පුවත්පත හෝ ලිපි කැපුම් එකතුව ලැබෙන තුරු බලා සිටීමට සිදුවන වාර අනන්තයි. මෙයින් හැඟී යන්නේ කාර්යක්ෂම ආකාරයට මෙම කටයුතු කර ගැනීමට සුදුසු මෙන්ම වගකීම් සහගත සේවක මඩුල්ලක අවශ්‍යතාවය පැන නැගී ඇති බව නොවේද?

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ 27 වන සංවත්සරය නිමිත්තෙන් 'ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධනය සඳහා තිරසර ජාල පද්ධතියක් ගොඩනැගීම්' යන තේමාව යටතේ පසුගිය මැයි මාසයේදී පැවැති සංවත්සර උත්සවයට සහභාගී වෙමින් අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා පවසා ඇත්තේ පුස්තකාලයක් විසින් අත්පත් කර ගත යුතු ඉලක්ක මොනවාදැයි ජාත්‍යන්තර පුස්තකාල සංගමය පෙන්වා දී තිබෙන අතර ජාතික පුස්තකාලය ඒවාට අනුකූලව ඉදිරියට යා යුතු බවත් ඒ සඳහා වෙනස්කම් රාශියක් සිදුකළ යුතු බව ඔහුගේ හැඟීම බවයි. එහිදී ලෝක මට්ටමේ දියුණු ක්‍රමවේද අනුගමනය කරමින් කටයුතු කළ යුතු බවත් ඔහු තවදුරටත් පවසා ඇත.

අද වන විට ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂම බවත් පාඨක සේවාවන්හි තත්ත්වයත් පිළිබඳ මීට වඩා සැලකිලිමත් විය යුතු වීම අනාගත පර්යේෂකයින්ට මහත් අස්වැසිල්ලක් වනු නොඅනුමානයි. එයට හේතුව පර්යේෂණ පවතින්නේ තොරතුරු ලබා ගැනීම මත බැවින් බව සිතීමට මේ එළඹී ඇති කාලය බැවිනි.

---


# මකරන්දය



### පොලිතින්

**කුණු කඳු හදන**
**දැම්මොත් නොදිරන**
**පුවත් මවන**
**අපේ කාලේ හීතිකාව**

**තිළාණි බණ්ඩාර**



### පුරඟනකි ඇය

**හද පිනවන මුවග සිනා**
**රවටන එහද රූ සපුනා**
**නොවෙද ආලයක් පිනවනා**
**හිඳින්නේ කෙලෙසදැයි සිතිනා**
**දුහුවිල්ලට වැසී**
**කාසියට එක්ව ගිය**
**අහිංසකාවිය**

**දිල්රුක්ෂි හෙට්ටිආරච්චි**

### ආදරය

මගේ පෙම් ගීතවල
නුඹෙ නමට හිමිවූ
අකුරු හතරක් ඇත............

සිතේ හැම රිදුමක්ම
ස්වරයකට නගන නුඹ
තනුවක්ය මියැසි ලොව
දිවිය සුවපත් කරන..............

සිත් අහසේ මා ගොතන
සැම පෙම් කවියකම
නුඹෙ නමට හිමි වූ
අකුරු හතරක් ඇත............

අළු පාට හීනවල
විනිවිඳින මතක මැද
සැඟවෙච්ච ගීතවල
අකුරු හතරක් ඇත............

නුඹේ පෙම් ගීතවල
පටලැවී ස්වර අතර
සොයමි ආදරය
බැඳි සෙනෙහස නුඹට..........

**ගයානි රණතුංග**

### පිටකොටුවේ මහ බෝ රද

**බුදු වන්නට සිත් නැතුව ට**
**දාන පාරමිතා පුරන**
**විරිය පාරමිතා වඩන**
**ශීල පාරමී බිඳගත්**
**මතු බුදු වන මෑණියන් ට**
**පිං නොතකා සෙවන සඳන**
**රන්වන් පාටින් දළුලන**
**නුඹ සෙවනේ හිඳ රැයම**
**දන් දෙති මල් මොනරු නමට**
**කිරිපිඬු දුන් සුජාතාවෝ**
**පිටුපාගෙන යන අරුමය**
**තපස්සු බල්ලුක නැතුවට**
**කුස තණ අතුරන්න නුඹට**
**දුක වෙනුවට මොනරු පුදන .....**
**දෙව්දත් බුදුවන උදයක**
**රත් සඳ පායන් එනකොට**
**සිල් රැකපන් පුතුගේ නම ට ..**

**-තාරිකා තත්සරිණී-**

### තුහින මල් වැසි

**නිමානි තල්පාවිල**

මල් කිනිත්තක
අගින් හිමිහිට
ලැගුම් ගෙන හිඳ
රහස් මිමිණූ
පිණි බිඳුව නුඹ
කොයි ගියාවද....?

### අහිමි ආදරය

නොකියාම යන්නට
රිසි විටක එන්නට
සඳට ඇති හිමිකම
ඇතිද පොළවේ කුහුඹුවකු හට
සඳ එළිය විඳිනු මිස
හිමිකමක් වෙද කුහුඹුවා හට
පුරහඳේ එළියට
අමාවක කළුවරද මුහුකර
සිතී ඔහු මෙලෙසට
මොනතරම් මිහිරිද හිමි නැතත්
පුරහඳ

**ලෝෂනී සෞම්‍යා**

### මනුස්සකම

**අවැසිය නුඹව අයහපත රජ වූ**
**වර්තමානයට**
**සෙවූවෙමි**
**මුණගැසෙන සෑම මිනිසෙකු තුළම**
**අතුරුදන් වූ නුඹව**
**සොයා ගනු බැරි විය මා හට**
**කොහිද නුඹ ,කියනු මැන**

**ඉරේෂා නදීශානී**

### සංස්කෘතිය....

**තිඹිරි ගෙයි සිට**
**සුසානය තෙක්**
**යදම් බැම්වලින් සිරකොට**
**සදාචාරය නම් වූ කම්බි වැටින්**
**සීමා මායිම් පැන වූ**
**මානුෂීය හැඟීම්වල**
**මරණයයි**

**නිමේෂා ගමගේ**

### නුඹ සෙවූ ආදරය

**සකුරා මල් පිපෙන**
**නකපිමා සොහොන ළඟ**
**සුසුම්ලමින්**
**සිහිකරමි මම තවම**
**නුඹ සෙවූ ආදරය**
**කබුකි රඟහලේදී**
**වේදිකාව පුරා**
**ඇස් නටවමින්**
**නුඹ සෙවූ ආදරය**
**පිස්සුවෙන් මෙන්**
**ටෝකියෝ වීදි පුරා ඇව්දිමින්**
**නුඹ සෙවූ ආදරය**
**දෙවොන්දරා**
**හමුවුණිද නුඹට**
**නකපිමා සොහොන පාමුල**
**හුදකලාවේ වැතිර සිටින විට**
**නුඹ සෙවූ ආදරය**

**ඉෂාරා ගුණතිලක**

සංස්කාරක
නිසන්සලා තෙන්නකෝන්

# ඇපෙන්ඩිසයිටිස් - Appendicitis

**ශල්‍ය වෛද්‍ය විශේෂඥ ඩී.ජේ. ඇන්තනි**

**ඇපෙන්ඩිසයිටිස්** නැත්නම් උණ්ඩුකපුච්ඡ ප්‍රදාහය කියලා කියන්නේ ගොඩක් වෙලාවට තරුණ තරුණියන් අතර බහුලව දකින්න පුළුවන් ලෙඩක්. බාල අයටත් වැඩිහිටි වියේ අයටත් මෙය සෑදීමට ඇති ඉඩකඩ අඩු අතර ගැටවර වියේ අයවලුන්ට සෑදෙන ප්‍රතිශතය ඉහළ බවයි පෙනී යන්නේ.

උදර කුහරයේ දකුණු පැත්තේ පහළ කෙළවරට වන්නට පිහිටලා තියෙන උණ්ඩුකපුච්ඡය, නිලීන අවයවයක්. ඒ කියන්නේ මෙයින් ශරීරයට වැඩක් වෙන්නේ නෑ කියන එක. සාමාන්‍යයෙන් නිලීන අවයවයකින් ශරීරයට කෘත්‍යයක් ඉටු කරන්නේ නෑ. දරුවෙකු මව් කුසේ ඉද්දී ඔහුගේ බඩවැල් නිර්මාණය වෙනකොට ශරීරයට අවශ්‍යතාවයක් නැති අවයවයන් ඉබේම නිලීන වී යනවා. හැබැයි මේ අවයවය මහබඩවැලට විවෘත වෙලා වර්ධනය වනවා. මේ තමයි උණ්ඩුකපුච්ඡය ගැන සරල ම අදහස.

**කොහොමද ඇපෙන්ඩිසයිටිස් ඇතිවෙන්නේ?**

කුඩා බඩවැලේ ඉඳලා මහා බඩවැල දක්වා ආහාර ගමන් කරද්දී ආහාර යන්නේ උණ්ඩුකපුච්ඡය පහු කරගෙන. ඒ වගේ අවස්ථාවකදී ආහාර හෝ අසූචි තත්වයට පත් වූ ද්‍රව්‍යක් උණ්ඩුකපුච්ඡයට ඇතුල් වුවොත් ඇතුලු වූ ද්‍රව්‍යවලට නැවත එළියට පැමිණීම අසීරු වෙනවා. මෙවැනි අවස්ථාවක දී එම ද්‍රව්‍ය උණ්ඩුකපුච්ඡය ඇතුළේදී ම පල් වීමකට ලක් වනවා. එතකොට තමයි උණ්ඩුකපුච්ඡයේ ඉදිමීමක් සිදු වන්නේ. උණ්ඩුකපුච්ඡ ප්‍රදාහය ඇතිවෙනවා කියලා කියන්නේ මේ තත්වයට.

මේ විදිහට අධිකව ඉදිමීමට ලක් වූ අවස්ථාවක දී උණ්ඩුකපුච්ඡය පුපුරන්නත් ඉඩ තියෙනවා. එහෙම වුණොත් උණ්ඩුකපුච්ඡය ඇතුළේ තියෙන පැසවීමට ලක් වුණු ආහාර සහ සැරව උදර කුහරයට ඇතුල් වනවා. එතකොට තමයි උදර කුහරයට ඇතුලු වන විෂබීජ හේතුවෙන් මුළු උදර කුහරය ම ආසාදනය වෙලා Peritonitis කියලා හඳුන්වන තත්වය ඇති වෙන්නේ. මේ වගේ අවස්ථාවකදී නම් රෝගියා මරණයට ලක්වීමට පවා ඉඩ පවතිනවා.

**කොහොමද ඇපෙන්ඩිසයිටිස් හඳුනාගන්නේ?**

ඉස්සෙල්ලා ම පෙකණිය ආශ්‍රිතව ඇතිවන වේදනාව දැනෙන්න පුළුවන්.

පැය කිහිපයකට පස්සේ උණ්ඩුකපුච්ඡය ඉදිමීම නිසා උදර කුහරයේ පිටත බිත්තිය ස්පර්ශ වීමකට ලක් වීම නිසා උදර කුහරයේ දකුණු පැත්තේ පහළ කෙළවරට වෙන්නට වේදනාව ඇති වීමට පුළුවන්.

වේදනාවත් එක්ක ම සාමාන්‍ය උණ තත්වයක් ද පවතින්න පුළුවන්.

කෑම අරුචියක් දැනීම

සමහර විට වමනේ යාමට ද හැකියි.

**රෝගය හඳුනාගන්නා පරීක්ෂණ මොනවාද?**

ශෛල්‍ය වෛද්‍යවරයෙකුගේ නිගමනය හැර රෝගය හඳුනාගන්න පරීක්ෂණ නම් නෑ. එහෙම කියන්නේ ක්ෂ සහ එක්ෂ ස්කෑන්වලට බොහෝ වෙලාවට මේ රෝගය හසු නොවන නිසා. නමුත් වෙනත් රෝග සඳහාත් මෙවැනි රෝග ලක්ෂණ පෙන්වීමට අවස්ථාව තිබෙනවා.

ඇපෙන්ඩිසයිටිස් සඳහා කරන ශල්‍යකර්මයකින් කරන්නේ උණ්ඩුකපුච්ඡය ඉවත් කිරීමයි. මේ ශල්‍ය කර්ම ක්‍රම දෙකකට සිදු කරනවා.

**1. උදරයේ දකුණු පැත්තෙන් කුඩා කැපුමක් යොදා උණ්ඩුකපුච්ඡය ඉවත් කිරීම**
**2. ලැපරොස්කොපි මාර්ගයෙන් කරනු ලබන ශල්‍ය කර්මයත් මේ ක්‍රම දෙකයි.**

සාමාන්‍යයෙන් මේ ශල්‍යකර්මයෙන් පස්සේ විශේෂිත පරිස්සම් වීමක් අවශ්‍ය වන්නේ නෑ. ඒ වගේ ම තමයි ශල්‍යකර්මයක් සිදු කිරීමෙන් උණ්ඩුකපුච්ඡය ඉවත් කරන නිසා ඇපෙන්ඩිසයිටිස් නැවත ඇති වන්නේත් නෑ.

ඇපෙන්ඩිසයිටිස් සෑදී ඇත්නම් ඒ සඳහා ශල්‍යකර්මයකින් ප්‍රතිකාර කර ගැනීමයි කළ හැකි හොඳ ම දේ.

**නලිනිකා ලක්ෂාණි**



# CANCER නසන ඔලිව්

**ඔලිව් කියන්නේ අවුරුදු 500 විතර පැරණි පලතුරක්. ඒ වගේ ම අවුරුදු 500 වගේ ආයු කාලයක් මේ ශාකයට තියෙනවා. පලතුරු ලෝකයේ වැඩි ම ආයුෂ හිමි පලතුර තමයි ඔලිව්. ග්‍රීක ඉතිහාසයට අනුව ඇතිනා දෙව්දුවගේ ත්‍රිසූලයෙන් ඔලිව් ගස ඉපදුන බවයි කියන්නේ. ජාත්‍යන්තර වෙළඳපොලේ නම ගිය පලතුරක් විදියට තමයි ඔලිව් හඳුන්වනවා.**

ලංකාවේ වගේ ම ලෝකයේ ම cancer ගැන ලොකු කතා බහක් මේ කාලේ දී වෙනවා. ඒ අතරින් සමේ ඇතිවන පිළිකා තමයි ඉතා ම වේගයෙන් පැතිරෙනවා කියන්නේ. ඔලිව්වලින් සමේ ඇතිවන පිළිකා නිට්ටාවට ම සුව කරගන්න පුළුවන්.

දියවැඩියාව නිට්ටාවට ම සුව කරන්න පුළුවන් අපූරු හැකියාවක් මේ පලතුරට තියෙනවා. හෘද රෝග වලට කදිම විසඳුමක් ලෙස ඔලිව් භාවිතා කරනවා. කොලෙස්ටරෝල් වගේ ම pressure නැති කරන බෙහෙතක් විදියටත් භාවිතා කරනවා. අපේ මතක ශක්තිය වැඩි දියුණු කරන්න වගේ ම අපේ වැඩත් එක්ක ඇතිවන stress නැති කරන්න පුළුවන්.

ඇස් යට අඳුරු ගතිය නැති කරන්න ඔලිව් තෙල් පාවිච්චි කරනවා. අපි මොනදේ කළත් අපේ ශරීරය සමබරව, නිරෝගීව වගේ ම පැහැපත්ව තියාගන්න ඕනේ. ඒ වගේ ම ඔලිව් තෙල් රූපලාවන්‍ය කටයුතු සඳහා නිතර දෙවේලේ භාවිතා කරනවා. සමට අහිතකර පාරජම්බුල කිරණ ඒ වගේ ම අහිතකර විකිරණ වර්ගවලින් සම ආරක්ෂා කරගන්න ඔලිව් කියන්නේ වටිනා අත්බෙහෙතක්.

අපේ සමේ පැහැය හැමදාම එක වගේ තියාගන්න ඕනේ නිසා ඔලිව් කියන්නේ කාගේත් අවධානය ලබා ගන්න පලතුරක්. සම වියළීම, ඔලිව් පලතුරෙන් සමට ලබා දෙන පෝෂණය වෙනත් කිසිඳු පලතුරකින් ලැබෙන්නේ නෑ. අපි නාන වතුරට ඔලිව් ගෙඩි නැත්නම් යුෂ ටිකක් මිශ්‍ර කරනවනම් සම පැහැපත් කරගන්න පුළුවන්. body lotion එකකින් කරන සත්කාරය ඔලිව් පලතුරට කරන්න පුළුවන්.

**සුලක්ෂි රත්නායක**

# සුවය ගලන දොරටුව



**තරුණ තරුණියන් රූපලාවන්‍ය කෙරේ විශේෂ නැඹුරුවක් දැක්වීම අද කාලයේ හැටියට සාමාන්‍ය දෙයක්. එහිදී සම රැකගැනීම කෙරේ හිමිවන්නේ වැදගත් ස්ථානයක්. ශරීරය අභ්‍යන්තරයේ මෙන්ම බාහිරින් තිබෙන ශරීර අංග කෙරේ විශේෂ සැළකිලිමත් බවක් තිබීම යහපත් සෞඛ්‍ය මට්ටමක පෙරනිමිති වේ. තරුණ තරුණියන්ට පමණක් නොවේ වැඩිහිටියන්ට වුවද එය සුවදායකය. ඔබේ ශරීරයේ අභ්‍යන්තර අවයව වසා සිටින සම පිළිබඳවයි මේ සටහන.**

ඔබගේ ශරීරය වසා සිටින සමට කෝටි ගණන් ඉතා සියුම් ස්නායු සම්බන්ධව පවතිනවා. සමට සම්බන්ධ ස්නායු ශරීරයේ සෑම අවයවයක් සමඟම සම්බන්ධ වනවා. ඔබේ සමෙන් නිරෝගීව පැවතීමට උපකාර වන හෝමෝන නම් රසායනික ද්‍රව්‍ය රාශියක් නිපදවෙනවා. වසර දහස්

ගණනක සිට මිනිසුන් සමෙහි විවිධ ස්ථාන උත්තේජනය කිරීමෙන් ලෙඩ සුවකරා. චීන කටු චිකිත්සක ක්‍රමයත් එවැන්නක්. එමගින් සමෙහි ඇති සුවිශේෂී ස්ථාන වලට සියුම් කටු ඇතුලු කිරීමෙන් රෝග සුවකරන, වසර දහස් ගණනක් අතීතයේ සිට පැවත එන , අදටත් ලෝකය පුරා භාවිත කරන ක්‍රමයකි. චීන කටු ක්‍රමයට අනුව ශරීර අභ්‍යන්තරයේ ඇති සෑම ඉන්ද්‍රියක්ම සම්බන්ධව ශක්තිය, ශරීරය පුරා ගමන් කරනවා. මේ ගමන් කරන මාර්ග සම මතුපිටින් පිහිටා තිබෙනවා. මෙම මාර්ග වල තිබෙන සුවිශේෂි ස්ථාන කටු මඟින් උත්තේජනය කිරීමෙන් ශක්තිය සමබරව ශරීරය පුරා ගමන් කරවීමට හැකිවෙනවා. එමගින් සුවතාවය ඇතිවනවා.

අතීතයේ සිට කියා දෙන සම්බාහන ක්‍රම ඇසුරෙන් ඉතා සරලවම විනාඩි කීපයකින් ඔබටම ඔබවම සම්බාහනය කරගත හැකි ආකාරය පහතින් දක්වෙනවා. මෙය කිරීමේදී ඔලිව් තෙල් හෝ කුඩා ළමුන්ට ගල්වන බේබි ඔයිල් වැනි මෘදු තෙලක් භාවිත කරන්න පුලුවන්. එසේ නැත්නම් තෙල් නොමැතිවද කරන්න පුලුවන්. හැකි සෑම විටම සම්බාහනයට අල්ල ප්‍රදේශය භාවිතා කරන්න. සම්බාහනය දවසේ ඕනෑම වෙලාවක කරන්න පුළුවන්. සම්බාහනය කරමක් වේගයෙන් හා තදින් කිරීමෙන් ශරීරයට ප්‍රබෝධයක් ඇති වෙනවා. මෙය උදෑසන, දිවා කාලයේ, හවස, ව්‍යායාමයකට ක්‍රීඩාවකට පෙර, වැඩක් කිරීමට පෙර, නිදිමත ගතිය නැති කර ගැනීමට, ප්‍රබෝධය ඇති කර ගැනීමට කරන්න. සම්බාහනය මෘදු ලෙස හා සෙමින් කිරීමෙන් ශරීරය ලිහිල් වනවා සෞම්‍ය වනවා. විඩාව නැතිවෙනවා. මෙය රාත්‍රී නින්දට පෙර, වැඩ වැඩිවී ඇතිවන පීඩනය අඩුකරගැනීමට හෝ භාවනාවකට පෙර සිත ගත සන්සුන් කරගැනීමට කළහැකියි.

සම්භාහනය ඉඳගෙන කිරීම පහසුයි. හිසෙන් පටන් ගන්න. අත් දෙකම භාවිතා කරන්න. අල්ලෙන් හිස පිරිමදින්න. රවුමට අත යවමින් චක්‍රාකාරව පිරිමදින්න. දෙඅල්ලෙන් නළල, නළල දෙපස, කම්මුල් පිරිමදින්න. බෙල්ලේ පසුපස හා දෙපස ඉහළ පහළ සහ චක්‍රාකාරව පිරිමදින්න. මැණික් කටුව, වැලමිට සහ උරහිස යන හන්දි චක්‍රාකාරව වටේට පිරිමදින්න. ඉතිරි කොටස් දික්
අතට පිරිමදින්න. පපුව ප්‍රදේශය

සෙමින් මෘදු ලෙස පිරිමදින්න. බඩ ප්‍රදේශය හරහට, ඉහළට පහළට සහ ඔරලෝසු කටුව යන අතට වටේට පිරිමදින්න. පිට සහ කොන්ද ප්‍රදේශය හැකි ආකාරයට ඉහළට පහළට පිරිමදින්න. කකුල් දෙක කිරීමේදී වළලුකර, දණහිස සහ උකුල් හන්දි ප්‍රදේශ චක්‍රාකාරවද අනෙක් ප්‍රදේශ දිගටද පිරිමදින්න.
එක් එක් ඇඟිල්ල වෙනම පිරිමදින්න.

මෙම සම්භාහනය ඔබට වෙලා ඇති ආකාරයට විනාඩි 2-3 න් හෝ 5-10 න් හෝ කළ හැකියි. ඔබට හොඳ යැයි සිතෙන ආකාරයට, වෙලාව තිබෙන ආකාරයට, පහසුවක් දෙන ආකාරයට සම්බාහනය කරගන්න. තෙල් යොදා සම්බාහය කළේ නම්, විනාඩි කීපයක් යන්නට හැර නාගන්න. නැතිනම් පසුව නාගන්න. මෙය ප්‍රථම වතාවට කිරීමට ඔබට අලසකමක් දනේවි. අපහසුව වැඩිම පළමු වරටයි. අවශ්‍ය සෑම විටම, කැමති සෑම විටම ඔබටම මෙය සිදුකරගත හැකියි.

**සටහන**
**සමිතා ලක්ෂි**

# සම්මාන හුටපට

පවනි කවිරත්න

**සාහිත්‍ය සම්මාන උදෙසා කැපී පෙනෙන ප්‍රබෝධයක් අප අතරේ දක්නට ලැබෙනුයේ මෑතක සිට ය. නවකතා සාහිත ලෝකයේ උස් කඳු මුදුන් අගයමින් කරලියට ආ ස්වර්ණ පුස්තක සම්මාන උළෙල පසුගිය වසරවලදී දිනාගත් අවධානය සුළුපටු වූවක් නො වේ.**

මෙතෙක් පැවතියේ නවකතා වෙනුවෙන් පිරිනැමුණු ස්වර්ණ පුස්තක සම්මාන උළෙලක් පමණි. එහෙත් මෙම වසරේ සිට ඊට සමගාමී ව කෙටිකතා සහ කාව්‍ය කෘතීන් ද අගයනු වස් රජත පුස්තක නමින් සම්මානයක් පිරිනැමීමට ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය තීරණය කර තිබිණි. එහිදී මංජුල වෙඩිවර්ධනයන් විසින් රචිත දුස්ටකමේ සවුන්දර්යය සහ රත්මලානේ තවත් කතා කෘතිය හොඳ ම කෙටිකතා සංග්‍රහය ලෙස සම්මානිත විය. ලක්ෂාන්ත අතුකොරලගේ සමහර කමටහන් හොඳම කාව්‍ය සංග්‍රහය ලෙස මෙහිදී අභිෂේක ලැබී ය.

සාහිත්‍ය තරග උත්සවශ්‍රීයෙන් පැවැත්වීමත් සාහිත්‍ය කෘතීන් වෙනුවෙන් පිරිනමන සම්මාන අරබයාත් සමාජයෙන් නැගෙන්නාවූ අපවාද බොහෝ ය. ඒ අතරින් මූල්‍ය ත්‍යාග හිමිවන තරඟ ඉදිරියෙන් සිටී යි. ඊට හේතු කිහිපයකි.

අද වන විට ලේඛන කලාව තුළ අහිතකර තත්ත්වයන් රැසක් ගොඩනැඟීමට සාහිත්‍ය සම්මාන උත්සව හේතු වී ඇත. මෙහි දී සාහිත සම්මාන වෙනුවෙන් ලේඛකයන් විසින් සිදු කරන්නා වූ අගතීන් බොහෝ ය. පෙර වසරවල පැවති ස්වර්ණ පුස්තක සම්මාන උත්සව ගමන්මග දෙස ආපසු හැරී බැලීමේ දී මෙම අගතීන් ක්‍රම ක්‍රමයෙන් දඋලමින් තිබූ සැටි පැහැදිලි වේ. එනම් බොහෝ ලේඛකයින් නවකතා නිර්මාණකරණයේ නියැලෙනුයේ සම්මාන උළෙල ඉලක්ක කරගෙන ය. කණගාටුවට තවත් කරුණක් නම් සාහිත්‍ය සම්මාන උත්සව නිසා සම්මානිත පුස්තක නාමාවලිය හැර සෙසු නවකතා සියල්ලක් ම පාහේ පාඨකයන්ගෙන් ගිලිහී යාමයි.

බැලූ බැල්මට පෙනී යන්නේ සාහිත්‍ය කෘති සඳහා වූ සම්මාන බෙදා දීම සම්බන්ධ ව සතුටු විය හැකි වාතාවරණයක් ඇති බවයි. එහෙත් ඇත්තේ උඩු යටිකුරු වූ තත්වයකි. ස්වර්ණ පුස්තක කෘති තේරීමේදීත් මෙන් ම රජත පුස්තක කෘති තේරීමේදීත් විශේෂිත වූ නිර්දේශ දෙකක් මත පදනම් වේ. එනම්

ප්‍රකාශනයට පෙර සඟරා හෝ වෙනත් මුද්‍රිත මාධ්‍යයක කොටස් ලෙස පළ වී තිබෙන කෘතීන් නොසලකා හැරීම

කර්තෘ ප්‍රකාශන කෘති සම්මාන ප්‍රකාශයේ දී නොසලකා හැරීම

නිර්මාණ සඳහා වූ සම්මාන උළෙලක දී ප්‍රමුඛස්ථානයක් ලබා දිය යුත්තේ නිර්මාණයේ අන්තර්ගතය සඳහා ය. එහිදී නිර්මාණයක අන්තර්ගතයට පරිබාහිර වූ නිර්ණායක සඳහා මුල් තැනක් දීම යෝග්‍ය වන්නේ ද යන්න නැවතත් සිතිය යුතු කරුණකි. මීට අදාල ව පසුගිය වසරේ දී පොත් ප්‍රකාශකයන්ගේ සංගමයට නොයෙක් පාර්ශවයන්ගෙන් විවේචන සහ චෝදනා එල්ල විය. ඊට පිළිතුරු ලෙස ප්‍රකාශකයන්ගේ සංගමයේ ඇතැම් නියෝජිතයන් සහ සමාජ ජාල ක්‍රියාකාරිකයින් කියා සිටියේ ප්‍රකාශකයන්ගේ සංගමයේ මුඛ්‍ය අරමුණ නම්, පොත් ප්‍රකාශකයන්ගේ දියුණුව බව යි. රජත පුස්තක සම්මාන උළෙලේ දී ද මෙම කරුණ අදාල වේ.



පොත් ප්‍රකාශකයන්ගේ පැතිකඩින් බැලූ කල එහි සාධාරණත්වයක් ඇති මුත් පාඨකයාගේ හෝ රසිකයාගේ පැතිකඩින් බැලූ කල එය සාධාරණ යැයි කීම අසීරු ය. මන් ද පාඨකයන් සහ රසිකයින් සාහිත්‍ය නිර්මාණයක් කියවනුයේ ප්‍රකාශකයන්ගේ දියුණුව පතා නොවන බව නම් සක් සුදක් සේ පැහැදිලි ය.

මේ වන විටත් කෙටිකතා පොත් මෙන් ම නවකතා පොත් බොහෝමයක් ප්‍රකාශයට පත් වන්නේ කතෘ ප්‍රකාශන කෘති ලෙසට ය. එහිදී ආධුනිකයන්ගේ කෘතීන් අතරට එම කෘතීන් එක් වීමට ඇත්තේ ද අවම සම්භාවිතාවකි. ක්ෂේත්‍රයේ ආධුනිකයන්ගේ කෙටිකතා පොතක් හෝ කවි පොතක් මුද්‍රණය කරවා ගැනීමට ප්‍රකාශකයෙකු සොයා ගැනීම පවා අද අසීරු කාරණයක් ව තිබේ.

උසස් සාහිත්‍යාංගයන් අතරට කවිය සහ කෙටි කතාව ගෙන යා යුතුයැයි උදම් අනන කිසිවෙකුත් එකී නිර්මාණ අද වැටී ඇති අගතිගාමී යථාර්ථමය අගාධයෙන් මුදවා ගැනීමට කටයුතු කරන බවක් නම් දක්නට නොමැත. එවන් පසුබිමක් තුළ සාහිත්‍ය නිර්මාණ ඇගයීම වනාහි සැබවින් ම හාස්‍යයකි. කෙසේ නමුත් රජත සම්මානය හෝ ලබාදීමෙන් කාව්‍ය කෘති සහ කෙටි කතා කෘති ක්ෂේත්‍රවල ප්‍රගමනයක් ඇතිවේ යැයි සුභවාදී සිතුවිලි දරන නිර්මාණකරුවන් සහ පාඨකයන් යම් ප්‍රමාණයක් අප අතර සිටී.

මෙම පසුබිම අතරේ රජත සම්මාන උළෙලට අදාළ සුභවාදී පසුබිමක් ද පවතී. සාහිත වපසරිය පිළිබඳ විවෘත නිදහස් කතිකාවකට මුල පිරීමට ලේඛකයන්ට මෙන් ම පාඨකයන්ට ඉඩ හසර වෙන් වීම සාහිත සම්මාන උත්සව හමුවේ ඉස්මතුවන්නා වූ එක් ගුණාංගයකි. කාලාන්තරයක සිට කවිය සහ කෙටිකතාව අතහැර දමමින් නවකතාව සමග පමණක් යමින් තිබූ සම්මාන පිදුම් ගමන් මගට කවිය සහ කෙටිකතාවත් එක්කර ගැනීම ද මෙහිදී ඇගයිය යුතුය.

සාහිත්‍ය ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය තකා ඉදිරියටත් විකල්ප සාහිත්‍ය උත්සවයන්, සම්මාන උත්සවයන් තව තවත් බිහි විය යුතුය. පුද්ගලික වාසි ඉටුකර ගැනීමට මාන බැලීමේ පටු සංස්කෘතියෙන් ඈත් විය යුතුය. කෘතීන් තෝරාපත් කර ගැනීමේ දී එම වසර තුළ පාඨක රුචිකත්වයට බඳුන් වූ කෘතීන් නොසලකා හැරීමෙන් ඈත් විය යුතු ය. සාහිත්‍ය නිර්මාණ ඇගයීමට සමගාමීව වසරක් පාසා ඉදිරිගාමී සාහිත්‍ය වැඩපිළිවෙළක් නිර්මාණය කළ යුතු ය.

අතරමගදී මගහැරෙන දක්ෂතා සපිරි ආධුනික නිර්මාණකරුවන්ට අතහිත දීමක් ද මීට අමතර ව සිදුවන්නේ නම් පොත් ප්‍රකාශකයන්ගේ සංගමයට එල්ලවන්නා වූ අපවාද යම් මට්ටමකින් හෝ පසුබසිනු ඇත. එමණක් නොව රිදියෙන් පිදුම් ලද කෘතීන්ට අමතර ව ඊට නිර්දේශිත වූ සෙසු කාව්‍ය සංග්‍රහයන් මෙන් ම කෙටිකතා සංග්‍රහයන් ගුණාත්මක කතිකාවකට බඳුන් වන්නේ නම් රජත සම්මානයේ ආලෝකය ද තව තවත් වැඩිවනු ඇත.

---

# සොඳුරු ඉසව්ව

නිසන්සලා තෙන්නකෝන්

**කලාවට කෙනෙකු ජීවත් කළ හැකි ය. කෙනෙකුගේ මතකය අවදි කළ හැකි ය. හැඬවිය හැකිය. දුක, වේදනාව, වෛරය පමණක් නොව මිනිස් චිත්තසන්තානය තුළ සැඟව පවත්නා අනේකවිධ චින්තනයන්ට ජීවයක් එක් කිරීමට කලාවට හැකි ය.**



සංගීතය, කවිය, ගීතය, නවකතාව හෝ පමණක් නොව කලා සිතුවම් ආදී කුමන නිර්මාණයක් අභිමුව වුව ද කවර පුද්ගලයකු හෝ දමුණු පුද්ගලයකු වනු නිසැක ය. එයිනිදු ගීතයට ලැබෙන්නේ සුවිශේෂී ස්ථානයකි. එවන් නිර්මාණ කළ සොඳුරු මිනිසෙකු ලෙස ධම්මික බණ්ඩාරය සැලකේ. විපුල පෞරුෂයකින් හා නොනැමෙන පිල්මල් බවකින් යුක්ත විශාරද බුද්ධිමතෙකු සේ ඔහු සැලකෙන්නේ හුදෙක් ඔහුගේ අසාමාන්‍ය බුද්ධි මහිමයත්, බස හැසිරවීමේ ප්‍රබලත්වයත්, තර්ක බුද්ධියත් නිසා ය. සාම්භාව්‍ය කෘති රැසක් පල කරමින් ධම්මික බණ්ඩාරයන් කළ සේවාව පුලුල් වපසරියකට උරුමකම් කියයි.

2011 වර්ෂයේ ප්‍රකාශයට පත් වූ සාහිත්‍ය කෘති අතරින් ගීත සාහිත්‍යයට හිමි වූ රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි කර ගැනීමට සමත් වූයේ ධම්මික බණ්ඩාරයන්ගේ " මගේ පුංචි රෝස මලේ " ගීත එකතුවයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ලද 2011 වර්ෂයේ ප්‍රකාශයට පත් වූ ගීත කෘති අතරින් හොඳම ගීත කෘතිය වෙනුවෙන් පිරිනමන සරසවි සාහිත්‍ය සම්මානය හිමි වූයේද බණ්ඩාරයන්ගේ එම කෘතියට වීම විශේෂත්වයකි. ගීත රචනයට මෙන්ම කාව්‍ය රචනයටද අසහාය හැකියාවක් ඇති ධම්මික බණ්ඩාරයන් ගීත රචනයට පෙර සරසවි සිසුවකුව සිටියදී 1990 දී " අහෝ මිත්‍රවරුණි " නමින් ඉතා විශිෂ්ට ගණයේ කාව්‍ය සංග්‍රහයක් එළිදක්විය. එය ඔහුගේ සාහිත්‍ය නිර්මාණකරණයේ පළමු පිම්මයි.

එතෙක් ආ දිගු ගමනේ ඔහුගේ හදවතේ නැගී සිතිවිලිවලට තෙලි තුඩින් පණ පෙවූ නිර්මාණයන් කාගේත් හදවත්වල ලැගුම් ගැනීමට සමත් වූයේ ඔහු සතු වූ බස හැසිරවීමේ අපූර්වත්වය නිසාවෙනි. නිර්මාණයක් බිහිවන්නේ සිය අත්දැකීම්වලිනි. නැතිනම් අත්විඳීම්වලිනි. අත්දැකීම තමා විඳින දෑය. අත්විඳීම් තවත් කෙනෙකු විඳි දෙයක් පිළිබඳ තමා ඇසූ, දුටු, කිය වූ දේය. මෙයින් කිවූ දේ හා ඇසූ දේ තුළ විවිධ දේ තිබිය හැකිය. ධම්මික බණ්ඩාරයන්ට ඇසූ හෝ දුටු හෝ නැතිනම් අත්විඳි කවරකින් හෝ රසිකයන් රසාලිප්ත සයුරක කිමිදවීමට විපුල හැකියාවක් ඇති බව ඔහුගේ නිර්මාණයන් දෙස බැලූ විට පෙනේ.

හන්තානට පැයූ සඳ, ඔබ ආයෙමත් ඇවිදින්, ඔබ එදා නම් සඳ වගේමයි, මගේ පුංචි රෝස මලේ, ශ්‍රී දේවි වගේ නටන්න බැරි හින්දාම වැනි කවදත් රසික හදවත්වල නිදන්ගත වූ නිර්මාණයන් ගත් කළ එය තීව් වේ.

**“නවකතාව හෝ පමණක් නොව කලා සිතුවම් ආදී කුමන නිර්මාණයක් අභිමුව වුව ද කවර පුද්ගලයකු හෝ දැමුණු පුද්ගලයකු වනු නිසැක ය.”**

ධම්මික බණ්ඩාරයන් උපත ලබන්නේ කුරුණෑගලය. ඔහු බිහි වූ ජන සමාජය තුළ ජීවත් වූ අව්‍යාජ ජන කවියාත් ඔහුගේ ගීත නිර්මාණවල ජීවමාන ලෙස සැඟවී සිටී. ඒ නිසාම ජන කවියේ නොමඳ ඇසුර හා භාවිතය ඔහුගේ ගීතයට ආලෝකයක් ලබා දී ඇත. " හන්තානට පායන සඳ " ගීතය එයට කදිම නිදසුනයි.

ආදරය විරහව මිනිස් චිත්ත සන්තානයන්වල ලැගුම් ගත් සංවේදීතාවන්ය. ප්‍රේමයත් , ආදරයේත් සදාතනික බව රුදෙන්නේ එය විඳින සත්‍යා තුළය. ප්‍රේමය, විරහව, දුක, කඳුළ ආදරයක් තවත් අර්ථවත් කරයි. එවැනි සංවේදනාත්මක සිතිවිලිවල තව තවත් රසවින්දකයන් අතරමං කිරීමට ධම්මික බණ්ඩාරයන්ට ඇත්තේ සහජ හැකියාවකි. සප්ත සයුර නොපරදින විසල් ප්‍රේමයෙන් අගතැම්පත් වූවන් ද, ප්‍රේමයෙන් ලතැවුල් විඳින්නවුන්ද එකසේ අනුවේදනීය කරවන විපුල හැකියාවක් ධම්මික බණ්ඩාරයන්ගේ නිර්මාණ තුළ ගැබ්ව ඇති බව පුන පුනා කිව යුතු වන්නේ නැත.

# අලවුද්දීන් පද්මාවතීගේ සිත පැහැර ගනීද ?



බොලිවුඩයේ දැවැන්ත සිනමා අධ්‍යක්ෂක වරයෙකු වන සංජේ ලීලා බන්සාලිගේ නවතම නිර්මාණය වන පද්මාවතී චිත්‍රපටයේ වැඩකටයුතු මේ වන විට අවසන්ව ඇත. ඉන්දීය ඉතිහාසයේ කාල පරිච්ඡේදයක කතා පුවතක් තේමා කරගත් මෙම චිත්‍රපටය වියාකොම් මෝෂන් පික්චර්ස් සමාග මේ හා සන්ජේ ලීලා බන්සාලිගේ සම නිෂ්පාදනයක් ලෙස නිපදවූවක්. රාම් ලීලා සහ බජිරාවෙර් මස්තානි වැනි බන්සාලිගේ චිත්‍රපට තුළින් ප්‍රේක්ෂකයන් අමන්දානන්දයට පත්කළ දීපිකා පදුකෝන් හා රන්වීර් සිං යුවළ මෙම චිත්‍රපටයේදී ද ප්‍රධාන චරිත විදියට දැකගන්න පුළුවන්.

පද්මාවතී රැජිනගේ ජීවිත වෘත්තාන්තය තේමා කරගත් මේ කතා පුවත ක්‍රි. ව. 1303 දක්වා අතීතයට දිව යන්නක් වෙනවා. මෙවාර් හි රජකල රාවල් රතන් සිං නැමැති රජුගේ බිරිය වූ පද්මාවතී කුමරිය අත්පත් කර ගැනීමට අලවුද්දීන් කිල්ජි නමැති දිල්ලි සුල්තාන්වරයා සිදුකරන ආක්‍රමණය මෙම කතා පුවතේ තේමාවයි. පද්මාවතී රැජිණ දැකගැනීමට ලැබෙන අලවුද්දීන් කිල්ජි සුල්තාන්වරයා ඇය කෙරෙහි ප්‍රේමයෙන් කරන සංග්‍රාමය මෙම චිත්‍රපටයෙන් නිරූපණය වෙනවා. පද්මාවතී රැජින ලෙස මෙම චිත්‍රපටයේ ප්‍රධාන චරිතය නිරූපණය කරන්නේ බොලිවුඩයේ ජනප්‍රියතම තාරකාවක් වන දීපිකා පදුකෝන් විසින්. රාවල් රතන් සිංරජු ලෙස ශහීඩ් කපූර් හා අලවුද්දීන් කිල්ජි ලෙස රඟපාන්නේ දීපිකා පදුකෝන්ගේ පෙම්වතා වන බොලිවුඩ් නළු රන්වීර් සිං විසින්.

මෙම චිත්‍රපටයේ ඉන්දීය ගායන තාරකාවක් වන ශ්‍රේයා ගෝෂාල් ගයන ගීත පහක් පමණ ඇතුලත් බව සඳහන්. චිත්‍රපටයේ රූගත කිරීම්වලට අවස්ථා ගණනාවකදීම විවිධ සංවිධාන වලින් බාධා පැමිණුන බවයි සංවිධායකයින් පවසන්නේ. චිත්‍රපටයෙන් පද්මාවතී රැජිණ සම්බන්ධ ඓතිහාසික කතා පුවත විකෘති කර ඇතැයි කියමින් 2017 ජනවාරි මස ශ්‍රී රාජ්පුත් කානි සේනා සංවිධානයේ සාමාජිකයින් රූගත කිරීම් වලට බාධා එල්ල කළා. පසුගිය මාර්තු මාසයේදීද එම සංවිධානයේ මැදිහත්වීම්

**“පද්මාවතී රැජිණ දැකගැනීමට ලැබෙන අලවුද්දීන් කිල්ජි සුල්තාන්වරයා ඇය කෙරෙහි ප්‍රේමයෙන් කරන සංග්‍රාමය”**

අතරතුරදී පද්මාවතී මන්දිරයෙන් ලබාදී තිබුණු වසර 40 ක් පමණ පැරණි කැඩපතකට අලාභහානි සිදුවූ බවයි එරට මාධ්‍ය වාර්තා කළේ. කෙසේ වෙතත් මෙම සිදුවීම් නිසා චිත්‍රපටය පිළිබඳ නිරන්තරයෙන් කතාබහ ඇතිවෙනු දක්නට ලැබුනා. 1963 වර්ෂයේදී ද මෙම කතා පුවත ආශ්‍රයෙන් දමිළ චිත්‍රපටයක් නිපදවා ඇති බව ද සඳහන් වෙනවා. ඓතිහාසික කතා තේමා වලට ප්‍රිය කරන රසිකයින්ට මේ ආදරණීය කතා පුවත එළඹෙන (2017) නොවැම්බර් මාසයේ සිට දැකගන්න පුළුවන්. නොවැම්බර් මස 17 වන දින සිට චිත්‍රපටය තිරගත කිරීමට නියමිතයි.

# ධර්මයුද්ධය සහ චිත්‍රපට යුද්ධය

**ලාංකීය සිනමා ලෝලීන්ට නැරඹීමට ලැබුණු නවතම සිනමා අත්දැකීම ධර්මයුද්ධය චිත්‍රපටයයි. මේ වන විටත් ධර්ම යුද්ධය චිත්‍රපටය රීගල්, ලීඩෝ ඇතුළු සිනමාහල් කිහිපයක තිරගත වනවා.**

ධර්මයුද්ධය චිත්‍රපටය නිෂ්පාදනය කරන්නේ M-Entertainment ඇතුළු මහාරාජා සමාගම විසින්. ප්‍රකට ඉන්දීය චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකු වන චෙයිනාර් රවී මෙහි අධ්‍යක්ෂණයෙන් දායක වනවා. චිත්‍රපටයේ නළු නිළියන් ලංකාවේ ශිල්පීන් වුණාට චිත්‍රපටයේ අනෙක් බොහෝ අංශවල මුලිකත්වය ගත්තේ ඉන්දීය ශිල්පීන්. ඒ නිසා එක් අතකට ධර්මයුද්ධය චිත්‍රපටය ඉන්දීය නිෂ්පාදනයක් කිව්වත් වරදක් නෑ.

**“ධර්මයුද්ධයේ මුල් චිත්‍රපටය විවිධ භාෂාවලින් නැවත ප්‍රතිනිර්මාණය වුණේ එහි කතා තේමාවේ එන සුවිශේෂී ගුණයක් නිසායි.”**

මීට පෙර මෙයට සමාන කතා තේමාවන් සහිත Drishyam නම් හින්දි චිත්‍රපටය 2015 වසරේ දී තිරගත වුණා. එම චිත්‍රපටය Drishyam නමින් මලයාලම් බසින් ද, Papanasam නමින් දෙමළ බසින් ද සිනමාවට නැගුණා. මේ චිත්‍රපට අතර සියුම් සමානතාවයන් වගේම පැහැදිලි වෙනස්කම් ද දකින්න පුලුවන්. ඉන්දීය සිනමාවේ දී අජේ දේව්ගන් ප්‍රධාන චරිතය රඟ පෑ Drishyam චිත්‍රපටය නව ආරක් ගත් රූපරාමු සහිතව හින්දු සංස්කෘතියට මුසුව ඉදිරිපත් කර තිබුණි. මලයාලම් හා ද්‍රවිඩ නිෂ්පාදනයේ දී එහි ප්‍රධාන චරිතයක් වන පියාගේ චරිතය එම සංස්කෘතියට හා සමාජයට ගැළපෙන ප්‍රබල චරිතයක් ලෙස ගොඩනගා තිබුණා. ලංකාවේ දී ද ලාංකීය පරිසරයට හා සංස්කෘතික සමාජ වටපිටාව ගැළපෙන ලෙස ප්‍රබල හා සංවේදී පියෙකුගේ චරිත නිරූපණයක් ලෙස චිත්‍රපටය ගොඩනගා තිබෙනවා. විශේෂයෙන් සිංහල බෞද්ධ අක්මුල් තිර පිටපතට එක් කිරීම තරම් සැලකිලිමත් වෙලා තියෙනවා කියලා තමයි දැකගන්න ලැබුණේ. මෙහි තිර රචනය යොවුන් නළුවකු වන ප්‍රගීත් රත්නායකගේ. සංගීත අධ්‍යක්ෂණය සිදු කර ඇත්තේ ලාංකීය ශිල්පියකු වන සචින් පීරිස් විසින්. ගීත රචනය මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගෙන්.



චිත්‍රපටයේ ප්‍රධාන චරිතය වන හරිස්චන්ද්‍රගේ චරිතයට පණ පොවන්නේ ප්‍රවීණ රංගන ශිල්පී ජැක්සන් ඇන්තනී විසින්. දිල්හානි ඒකනායක, තිසුරි යුවනිකා, කුමාර තිරිමාදුර, කුසුම් රේණු, වීනුම් වත්සදි වගේ ප්‍රවීණ හා නවක දක්ෂ රංගන ශිල්පීන්ගේ එකතුවක් ලෙස ධර්ම යුද්ධය දකින්න පුළුවන්. M-entertainment ඉදිරිපත් කරන දෙවන චිත්‍රපටය ධර්මයුද්ධය යි. මීට පෙර එම සමාගමෙන් ඩාන්සින් ස්ටාර් නමින් චිත්‍රපටයක් නිෂ්පාදනය කළා. කාමාතුරයකුගෙන් සිය දරුවන් හා පවුල බේරා ගැනීමට ගොස් සුන්දර කැදැල්ලකට ඇති වන ප්‍රශ්න මාලාවක් තමයි මේ චිත්‍රපටයේ කතා පුවත වන්නේ. මෑත කාලීනව ඉන්දිය හා බටහිර සිනමා නිර්මාණ කිහිපයක්ම සිංහල භාෂාවෙන් නිෂ්පාදනය කොට ඉදිරිපත් කරනු දක්නට ලැබුණා. ප්‍රවේගය, මයා, සරිගම, සූම්, ආදරණීය කතාවක් වැනි චිත්‍රපට ඒ අතර දක්නට ලැබුණා. ඉන්දිය චිත්‍රපට සිංහලයට

**“චිත්‍රපටයේ නළු නිළියන් ලංකාවේ ශිල්පීන් වුනාට චිත්‍රපටයේ අනෙක් බොහෝ අංශවල මුලිකත්වය ගත්තේ ඉන්දීය ශිල්පීන්. ඒ නිසා එක් අතකට ධර්මයුද්ධය චිත්‍රපටය ඉන්දීය නිෂ්පාදනයක් කිව්වත් වරදක් නෑ. ”**

නැගීම මුල් කාලීන සිංහල සිනමාවේ ජනප්‍රිය ප්‍රවණතාවක් ව පැවතුණා. වර්තමානයේ දීත් පිට පිට ම සාර්ථකත්වය ලැබූ සිංහල සිනමා නිර්මාණ බොහෝ විට ඉන්දීය හෝ බටහිර නිර්මාණවලට නෑකම් කියනවා. එක් අතකින් මෙය සිනමා ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවත් ලෙස හඳුන්වන්නත් පුළුවන්. විශේෂයෙන් ඉන්දිය සිනමා ක්ෂේත්‍රයේ ශිල්පීන්ගේ නිර්මාණ හා තාක්ෂණික දැනුම ලාංකික ශිල්පීන් ට උකහා ගැනීමට මෙමගින් අවස්ථාවක් නිර්මාණය වෙනවා. ඒ දැනුම නිර්මාණශීලී භාවිතාවක් ලෙස නැවත ලාංකීය සිනමා නිර්මාණ සඳහා උපයෝගී කර ගනිමින් ලංකාවේ නිර්මාණ වෙනත් රටවලට යන දවසක් එළැඹෙනවානම් සතුටට කරුණක්.

කෙසේ වෙතත් ධර්මයුද්ධය චිත්‍රපටය විවිධ භාෂාවලින් නැවත ප්‍රතිනිර්මාණය වුණේ එහි කතා තේමාවේ එන සුවිශේෂී ගුණයක් නිසායි. ඒ සුවිශේෂීත්වය මොකද්ද කියලා ඔබට ධර්ම යුද්ධය චිත්‍රපටය නරඹලාම දැක ගන්න පුළුවන්.

සුභාෂිනී පෙරේරා

# ජීවිතයට වැට බඳින ඩෙංගු

තිළාණි බණ්ඩාර

**දැනට මෙරට මදුරු වර්ග 140ක් පමණ සිටියත් ආසාඩිත ඊඩිස් ඊජිප්ටයි හා ඊඩිස් ඇල්බෝපික්ටස් යන මදුරු දෙවර්ගයේ ගැහැණු මදුරුවන් රෝග වාහකයන් ලෙස ක්‍රියා කරයි. වෛරසය ශරීර ගතවී සතියකින් පමණ තවත් පුද්ගලයෙකුට වෛරසය බෝ කළ හැකි මට්ටමට මදුරුවා ආසාඩිත තත්වයට පත්වේ. එවැනි මදුරුවෙක් නිරෝගී පුද්ගලයෙකුට දෂ්ට කළ විට ඩෙංගු වෛරසය ඔහුගේ හෝ ඇයගේ රුධිරයට එක් වේ. රෝගය බෝ වීමේදී ප්‍රධාන වශයෙන් DEN1" DEN2" DEN3" DEN4 ලෙස වෙනස් ආකාරයේ වෛරස් වර්ග හතරක් ලෙස ක්‍රියා කරයි. රෝග තත්වය පාලනය මේ තරම් සංකීර්ණ වී ඇත්තේ ද ඒ නිසා ය. නමුත් රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නේ මදුරු ගහණය වැඩි වීම හේතුවෙනි.**

ප්‍රජා විශේෂඥ වෛද්‍ය ප්‍රසිලා සමරවීර මහත්මිය පවසන ආකාරයට මේ වනවිට දිවයිනෙන් කොළඹ දිස්ත්‍රික්කය ඇතුළුව බස්නාහිර පළාත ආශ්‍රිතවත් පුත්තලම, ගාල්ල, මාතර, යාපනය, මහනුවර යන ප්‍රදේශවල ඩෙංගු රෝගීන් වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත. 2016 වසරේදී රෝගීන් 55000 ක් වාර්තා වී ඇත. මේ වසරේදී එම ප්‍රමාණය ද අභිබවමින් රෝගීන් 90,000 කට බලපෑම් කිරීමට තරම් ඩෙංගු මාරාන්තික වී ඇත.

දැනට ඇතිවී තිබෙන අවදානම් සහගත තත්වය මත ඩෙංගු මර්දනය කිරීමට විවිධ ක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ පිළිබඳ පූර්ණ වගකීම දරන්නේ ජාතික ඩෙංගු මර්දන ඒකකය වන අතර සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ මෙය ක්‍රියාත්මක වේ. ඩෙංගු රෝගියෙකු වාර්තා වූ වහාම තවත් රෝගීන් එම ප්‍රදේශයෙන් වාර්තා වී තිබේ නම් පැය විසිහතරක් ඇතුළත අදාළ ප්‍රදේශය දුමායනය කිරීම සිදුවේ. ජාතික ඩෙංගු මර්දන ඒකකය මගින් මේ සම්බන්ධයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. සෞඛ්‍ය අමාත්‍යංශයේ වෙබ් අඩවියට පිවිසෙන්නෙකුට රෝගය පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට ද හැකිය.

ඕස්ට්‍රේලියාව සහ සිංගප්පූරුව වැනි දියුණු රටවල නව ජීව පාලන ක්‍රමවේදයක් යොදාගෙන මදුරු ගහණය පාලනය කිරීම සිදු කරයි. මෙය BTI බැක්ටීරියාව මෙන් නොව ස්වභාවිකවම කෘමීන්ගේ ශරීරයේ අඩංගු බැක්ටීරියා විශේෂයක් වෙයි. ඊඩිස් ගණයේ මදුරුවෙකුට බැක්ටීරියාව ඇතුල් කිරීම මගින් ඩෙංගු වෛරසය මදුරුවා තුළ ක්‍රියාත්මක නොවන තත්වයකට පත්වේ. නමුත් මෙය දිගුකාලීන පාලන ක්‍රමවේදයකි. දැනට මෙරට ප්‍රධාන මදුරු මර්දන ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක වේ. ඒ යටතේ පරිසර කළමනාකරණය ප්‍රමුඛව භාවිත වේ. ජීව විද්‍යාත්මක ක්‍රම වඩාත් හිතකාමී වන්නේ ස්වාභාවිකවම කීටයන් පාලනය කළ හැකි බැවිනි.

මදුරු කීටයන් ආහාරයට ගන්නා සතුන් හෝ ඔවුන්ගේ ක්‍රියාවලිය අඩපණ කරන කීට භක්ෂක මසුන් ජල ටැංකිවලට යෙදීම බහුලව සිදුවේ. රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් මදුරුවන් පාලනය කිරීම අත්‍යවශ්‍යම අවස්ථාවකදී හැර නිතර භාවිත නොවේ. මේ ක්‍රම මඟින් විද්‍යාත්මකව මදුරුවන් පාලනය කිරීමට අවකාශය සලසා ගත හැකි වුව ද එය කොතෙක් දුරට රෝගය පාලනය කිරීමට සමත් වී තිබේ ද යන්න ගැටලුවකි.



# නුවරට එන සංචාරකයන්ට නව බස් සේවාවක්

සුලක්ෂි රත්නායක

මහනුවර නගරයේ සංචාරක ආකර්ෂණය දිනා ගත් ස්ථාන ගණනක් ආවරණය වන පරිදි දෙස් විදෙස් සංචාරකයන් සඳහා විශේෂ බස් සේවාවක් මෙමස 20 වන දින සිට ආරම්භ විය. මෙම බස් සේවාව සෑම දිනකම පෙරවරු 8.30 ට මහනුවර නගරයෙන් ආරම්භ කරන අතර මෙම බස් රථයෙන් මහනුවර සිට පේරාදෙණිය උද්භිත උද්‍යානය දක්වා ඇති ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථානවලට හා සාප්පු සංකීර්ණ වෙත ගමන් ගැනීමේ අවස්ථාව මගීන්ට ලැබේ.

මෙම නව ප්‍රවාහන සේවාව මධ්‍යම පළාත් සභාව, පළාත් සංචාරක දෙපාර්තමේන්තුව හා කලාපීය ආර්ථික සහයෝගීතා ආයතනය ඇතුළු ආයතන කිහිපයක මෙහෙයවීමෙන් ආරම්භ විය. මෙම බස් සේවාව මගින් නුවර නගරයේ ඓතිහාසික ස්ථාන නැරඹීමට පැමිණෙන සංචාරකයන් සඳහා පහසුවක් සැලසේයැයි අපේක්ෂා කෙරේ.

# මන්ත්‍රී බලයෙන් කසළ කුඹුරුවලට

නිලුපුල් විතානගේ

කුඹුරුවලට කසළ බැහැර කිරීම සම්බන්ධ පුවතක් පානදුර වේරගම ප්‍රදේශයෙන් වාර්තා වේ. මෙම බැහැර කරන කසළ ප්‍රාදේශීය සභාවෙන් රැගෙන එන කසළ නොවන බවත් පානදුර ප්‍රදේශයේ හෝටල් ආපනශාලා කර්මාන්තශාලාවලින් බැහැර කරන කසළ බවත් ප්‍රදේශවාසීහු පවසති. මෙම ක්‍රියාවලිය පානදුර ප්‍රදේශීය සභාවේ ප්‍රබල එජාපයේ මන්ත්‍රී වරයෙකු විසින් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නකි. මොහු විවිධ කර්මාන්ත ශාලා හිමිකරුවන් සමඟ සම්බන්ධතා පවත්වමින් ඔවුන්ගෙන් කසළ එකතු කොට ප්ලාස්ටික්, පොලිතින්, රබර්, යකඩ වැනි ඉවතලන ද්‍රව්‍ය ඉන්දියාව වෙත අපනයනය කරනු ලබන අතර සුන්බුන් ද්‍රව්‍ය කුඹුරුවලට බැහැර කර පුලුස්සනු ලබයි. මෙයින් නිකුත්වන විෂ දුම ආග්‍රහණය වීමෙන් කුඩා දරුවන්ගේ ජීවිත අනතුරේ හෙලන බවට ප්‍රදේශවාසීන් මැසිවිලි නගති. මේ සඳහා ප්‍රදේශීය සභාවට හෝ පොලීසියට කෙතරම් පැමිණිලි ඉදිරිපත් කළ ද ප්‍රතිපලයක් නොවන තැන ප්‍රදේශවාසීන් විසින් පරිසර අමාත්‍යංශයට පෙත්සම් ගණනාවක් ඉදිරිපත් කර ඇති බවට වාර්තා වෙයි.

# අනුරපුර ග්‍රාමීය ප්‍රදේශ රැසක උග්‍ර ජල හිඟයක්

## යල කන්නයත් අසාර්ථකයි

සානිකා දිසානායක

දිගින් දිගට ම බල පැවැත්වන නියංසාය නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශ ගණනාවක මේ වන විට පානීය ජල හිඟයක් ඇති වී තිබේ. ක්‍රම ක්‍රමයෙන් පානීය ජල හිඟය ඉහළ යමින් පවතින අතර තලාව, තඹුත්තේගම, මහවිලච්චිය, පදවිය, නොච්චියාගම, මැදවච්චිය, රඹෑව සහ තිරප්පනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස තුළ පවුල් විශාල සංඛ්‍යාවක ජනතාවට දිනපතා බවුසර් මගින් පානීය ජලය සපයා දීමට පියවර ගෙන තිබේ.

පවතින උග්‍ර ජල හිඟය හේතුවෙන් මෙවර යල කන්නයත් මුළුමනින් ම අකර්මණ්‍යව ඇත. ප්‍රධාන ජලාශ අතරින් තිසාවැව හා රාජංගනය වැව් යටතේ පමණක් යම් තාක් දුරකට වී වගාව සිදු කිරීමට ජලය ලබාදීමට මෙන් ම පදිවිය හා වාහල්කඩ වැව් යටතේ සුළු කුඹුරු ප්‍රමාණයක බිත්තර වී ලබා ගැනීම සඳහා පමණක් වී වගාව සිදුකරලයි. නියඟයෙන් පීඩා විඳින ගොවීන් තර්ක විතර්කයන් මගින් සැනසිය නොහැක. කිසිදු ආණ්ඩුවකට "මොනවා කරන්නද වැස්සේ නැත්නම් වතුර නෑ" කියමින් අතපිස ගැනීමට ද නොහැකිය. "රටට බත සපයන" ඔවුන් වෙනුවෙන් කළ යුතු දේ වෙනුවට ඔවුන්ගේ වරද දැක්වීම වගකීමෙන් පලා යාම ගැටලුවට විසඳුමක් නොවේ.

# මාතලේ දිසාපති මැඳුර ආශ්‍රිත පරිසර කලාපය විනාශ වන ලකුණු

තිළාණි බණ්ඩාර

මාතලේ මහනගර සභා බල සීමාවට අයත් මාතලේ දිසාපති මැඳුර ආශ්‍රිත පරිසර කලාපය විනාශ වීමේ අවධානමකට ලක්ව ඇත. මාර්ගයේ අලුත්වැඩියා කිරීමේ කටයුතු හේතුවෙන් මෙම ස්වාභාවික පරිසර කලාපයේ ඇති ගස් විශාල ප්‍රමාණයක් කපා දමා තිබේ. මේ පිළිබඳ අදහස් දක්වන ප්‍රදේශවාසීන් පවසනනේ මෙය අක්කර පහක ප්‍රමාණයක විහිදී පවතින බවයි. මෙම පරිසර කලාපයේ දුර්ලභ පැරණි ශාක දක්නට ඇති අතර නගරයේ වායු දූෂණය අවම කිරීමට ද මෙයින් පිටුබලයක් ලැබේ. 1848 කැරැල්ලට නායකත්වය දුන් වීර පුරන්අප්පු වෙඩි තබා ඝාතනය කර ඇත්තේ ද මෙහි ඇති සියඹලා ගසක් මුලදී ය. මාතලේ ප්‍රාදේශීය ලේකම් කේ.පී.එල්.කේ. මදුවන්ති මහත්මිය ප්‍රකාශ කළේ අදාළ කොන්ත්‍රාත් සමාගම අබලන් වී ඇති මාර්ගය පිළිසකර කිරීම සඳහා පමණක් අවසර ඉල්ලා ඇති නමුත් මේ වනවිට පස් කැපීම හා ගස් කපා දැමීම ද සිදුකර ඇති බවයි. මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමුවහොත් දැනට මුල් කපා ඇති ගස් දිසාපති නිල නිවසට වැටීමේ අවධානමක් ඇති බවත් ඉදිරියේ දී මෙම පරිසර විනාශය නතර කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් ඇය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියාය.

# හෝටල්කරුවෝ නුවර වැව වනසති.

පවනි කවිරත්න

**මහනුවර වැව ආශ්‍රිතව පිහිටි හෝටල් සහ නිවාඩු නිකේතන අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා මේ වන විට වැව සීඝ්‍රයෙන් විනාශයට පත් වෙමින් තිබේ. මීට මාස කිහිපයකට පෙර අසන්නට ලැබුණු වැවෙහි මත්ස්‍යයින් අධික ලෙස මිය යෑමේ සිදුවීමට ප්‍රබල ව බලපා ඇත්තේ වැව වටා පිහිටි හෝටල්, නිවාස, පෞද්ගලික ආරෝග්‍යශාලා සහ ඇතැම් පාසල්වලින් වැසිකිළි අපද්‍රව්‍ය සහ සෙසු අපද්‍රව්‍ය වැවට එක් කිරීම බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇත.**

වැවෙහි එක්වන රසායනික ද්‍රව්‍ය මුසු අපද්‍රව්‍ය ආහාරයට ගැනීම හේතුවෙන් වැව ආශ්‍රිත ව සිටින දියකාවා, පාත්තයා, පිළිහුඩුවා, කොකා, කබරයා සහ තලගොයා වැනි සත්ත්ව විශේෂ විශාල වශයෙන් අඩු වීමේ ප්‍රවණතාවක් ද පවතී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් මසකට කිහිප වරක් ම බෝගම්බර වැවෙහි ජල සාම්පල ගෙන එම ජලයෙහි ජෛව රසායනික ඔක්සිජන් ප්‍රමාණය, Ph අගය යනාදිය පරීක්ෂාවට ලක් කරයි.

දේශීය මෙන් ම විදේශීය සංචාරකයන් වෙනුවෙන් බෝගම්බර වැව ආශ්‍රිතව ක්‍රියාත්මක වන්නා වූ බෝට්ටු සේවය හේතුවෙන් ද වැව අවධානමට ලක් ව ඇත. මෙම බෝට්ටු සේවය ක්‍රියාත්මක වන්නේ වසර කිහිපයක සිට ය.

බෝට්ටු ගමන් කිරීම හේතුවෙන් ඇතිවන විශාල රැළි නිසා බෝගම්බර වැවෙහි ඉවුරු ඛාදනයට ලක් වී තිබෙන බව ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදුකරන ලද නිරීක්ෂණ මගින් හඳුනාගෙන ඇත.



# ඕස්ට්‍රේලියාව ආසියානුවන්ගෙන් පිරෙයි

පසුගිය වසරේ නිකුත් වූ සංගණනයේ ප්‍රතිඵල අනුව ඕස්ට්‍රේලියාවේ ජනගහණය යුරෝපීයන්ට වඩා ආසියානුවන්ගෙන් සමන්විත බව අනාවරණය විය. ඕස්ට්‍රේලියාවේ ජනගහනයෙන් 49% ක්ම විදේශයන්හි උපත ලැබූවන් හෝ විදේශයන්හි උපත ලැබූ දෙමව්පියෙකුගේ දරුවෙකි. විදේශයන්හි උපත ලැබූ ඕස්ට්‍රේලියුවන්ගෙන් 40%ක් ආසියාවේ උපත ලැබූ බව සංගණනයෙන් හෙළි වී තිබේ. 1979 ඕස්ට්‍රේලියාවේ පැමිණි සංක්‍රමණිකයන් බහුතරය යුරෝපාවැසියන් වුවත් වර්තමානයේ එම තත්ත්වය වෙනස් වී තිබේ. මෙම සංගණනය තුළින් හෙළි වූ තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ඕස්ට්‍රේලියානු ඉතිහාසයේ පළමුවතාවට වැඩිම පුරවැසියන් පිරිසක් තමන්ට ආගමක් නොමැති බව පවසා තිබීමයි.

# වඳවෙන මුහුදු ඌරන් රකින්න ඩොල්ෆින්ලා

මෙක්සිකෝ ආණ්ඩුව පවසන්නේ ලොවපුරා වඳ වී යාමේ තර්ජනයට මුහුණදී සිටින මත්ස්‍ය විශේෂයක් ආරක්ෂාකිරීම සඳහා ඇමරිකානු නාවික හමුදාව විසින් විශේෂයෙන් පුහුණු කරන ලද ඩොල්ෆින් මත්ස්‍යයන් යොදා ගැනීමට සැලසුම්කර ඇති බවයි.

මෙසේ තර්ජනයට ලක් වී ඇත්තේ මුහුදු ඌරන් විශේෂයකි. ඔවුන්ව මුහුදේ ආරක්ෂිත ස්ථාන වෙත ගෙන යාමට ඩොල්ෆින් මත්ස්‍යයන් යොදන බව මෙක්සිකෝවේ පරිසර කටයුතුභාර අමාත්‍ය රෆායෙල් පචියානෝ පැවසීය. එම මුහුදු ඌරන් වඳ වී යාමට ප්‍රධාන හේතුව වී ඇති ධීවර දැල් භාවිතය ද මෙක්සිකෝවේ සම්පූර්ණයෙන්ම තහනම් කර තිබේ.

මෙම මුහුදු ඌරන් විශේෂයෙන් මේ වන විට 40 දෙනෙකු පමණක් ඉතිරි වී ඇති බව විශ්වාස කෙරේ. එම ක්ෂීරපායි මත්ස්‍යයින් දැනට වාසය කරන්නේ කැලිෆෝනියා බොක්කේ ය.

# ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් ම තරබාරුයිලු

**ලොව ජනගහනයෙන් තුනෙන් එකක් සිය නියමිත බර ප්‍රමාණයට වඩා අධික බරකින් යුක්තව ස්ථූලතාවයෙන් පෙළෙන බව වසර 25ක් තිස්සේ කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලවලින් අනාවරණය වී තිබේ. මේ බව හෙළිකර ඇත්තේ එංගලන්තයේ නිකුත් කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ ජර්නලයක් මගිනි.**

පර්යේෂණයට ලක්ව ඇති කාලවකවානුව ලෙස ගෙන ඇත්තේ 1990 සිට 2015 දක්වාවූ වසර 25ක කාලයයි. ළමා වයසේ පසුවන පිරිසෙන් 5%ක් ද, වැඩිහිටි ජනගහනයෙන් 12%කට වැඩි පිරිසක් ද අධික තරබාරුව බවට පත්ව ඇති බව හෙළි වී ඇති අතර 1980න් පසු මේ තත්ත්වය උග්‍ර වී ඇති බව පර්යේෂණයෙන් අනාවරණය විය.

# කැනඩාවට 150 යි



**පසුගිය දා කැනඩාවේ ඔටවා නුවර ඇතුළු මුළු රටපුරා ම උත්සවශ්‍රීයෙන් ඇළලී ගියා. ඒ කැනඩාව රාජ්‍යයක් වශයෙන් ස්ථාපනය කර වසර 150 සපිරීම නිමිත්තෙනි.**

**මේ සැමරුම අතරට කැනේඩියානු කලාකරුවන්ගේ සහභාගීත්වයෙන් පැවති සංගීත සංදර්ශන, ගුවන් සංදර්ශන, අලුතින් පුරවැසිභාවය ලබා ගැනීමේ උත්සව, ගිණිකෙළි සංදර්ශන ද ඇතුළත් වුණා.**

කැනඩාවේ අගමැති ජස්ටින් ට්‍රූඩෝ විසින් සාම්ප්‍රදායිකව ඉංග්‍රීසි හා ප්‍රංශ බසින් සංවත්සර උළෙල අමතනු ලැබීය. ඉංග්‍රීසි හා ප්‍රංශ යන භාෂා දෙක ම කැනඩාව තුළ නිළ වශයෙන් පිළිගෙන තිබේ. ''ඔබ කොහේ සිට ද පැමිණියේ, ඔබ කුමන ආගමක් ද අදහන්නේ, ඔබ කාට ද ආදරේ කියන දේ අප තකන්නේ නැත.

ඔබ සියලු දෙනා ම කැනඩාවට සාදරෙන් පිළිගන්නවා'' යනුවෙන් සංවත්සර උළෙල අමතමින් අගමැති ජස්ටින් ට්‍රූඩෝ පැවසීය. 'සමාජයක් වශයෙන් අප අතීතයේ සිදුවූ වැරදි පිළිගත යුතුයි ' යනුවෙන් කී අගමැතිවරයා සංහිඳියාව දිනාගැනීම සඳහා තවත් විශාල වැඩ කොටසක් ඉටුකිරීමට ඇති බවත් සඳහන් කළේය.

මධූෂා ශෙහානි



# චීනයෙන් අලුත් යුද නැවක්

**පසුගියදා චීන රජය විසින් සිය යුද යාන්ත්‍රණය නවීකරණය කිරීමේ තවත් පියවරක් සනිටුහන් කළා. ඒ සිය රටේදීම නිෂ්පාදනය කරන ලද නව මාදිලියේ යුද නෞකාවක් දියත් කරමිනි. මීට පෙරදී ඔවුන් තැනූ ප්‍රථම ප්‍රහාරක ගුවන්යානා ප්‍රවාහන නෞකාව ද දියත් කළේය. පරීක්ෂණ මාලාවකට ලක්කිරීමට නියමිතව ඇති ටොන් 10000 පමණ බරකින් යුත් මෙම නව යුද නෞකාව නව ගුවන් ආරක්ෂණ පද්ධතියක් මෙන්ම මිසයිල නාශක, නෞකා නාශක හා සබ්මැරීන නාශක අවිවලින් සමන්විත බව ෂින්හුවා පුවත් ඒජන්සිය පවසයි.**

# කඩුල්ල......

9 වන පිටුවෙන්.

අප කතා කළ යුත්තේ එහි සර්වකාලික අගයත්, නිර්මාණශීලී රාමුවක සිට කෙරෙන හෙළිදරව්වත් පමණක් නිසා නොවේ.

**ජාතික රූපවාහිනියෙන් මෑතකදී කඩුල්ල ටෙලි නාට්‍ය පෙන්වූ හැම වතාවකම කඩුල්ල ටෙලි නාට්‍ය ප්‍රේක්ෂකයන්ගේ නොමද ප්‍රතිචාරයට පාත්‍රවිය.වර්තමාන ටෙලි නාට්‍ය ආකෘති තුළ කොටස් 100 කින් හෝ පෙන්වීමට නොහැකි කතාවක් කඩුල්ල ටෙලිකතාවේ තිර රචක තිලක් ජයරත්න විසින් කොටස් 18 ක් තුළ කැටිකොට පෙන්වයි.**
**කතාවේ මුල් විනාඩි කිහිපය ඇතුලත ප්‍රධාන චරිතවල අභ්‍යන්තරය දිගහැර පෙන්වීමට තරම් තිලක් ජයරත්නයන් සූක්ෂම හා දක්ෂ ලෙස අවස්ථා ගොඩනගා තිබිණි. වර්තමාන ටෙලි නාට්‍ය තිර රචකයන්ට බෙහෙවින් අතපසු වන්නේද එයයි. කඩුල්ල ටෙලි කතාවේ අධ්‍යක්ෂණය ධර්මසේන පතිරාජයන්ගෙනි.**

කඩුල්ල ටෙලි කතාව පරම්පරා තුනක කතා පුවතක් විදහා දක්වයි. යටත් විජිත සමයේ අග වකවානුවක තමාගේ සම්භවය පිළිබඳ නිශ්චිත නොමැති, කුරුතේරිස් (ජැක්සන් ඇන්තනී) නම් පතල් කම්කරුවා වටා මෙම කතා පුවත දිග හැරෙයි. සමාජයේ පහළම අඩියක සිටින කුරුතේරිස් අනෙකාගේ ගෙල මතින් නැගී තම සම්භවයට සරදම් කරන පැළැන්තිය අභිබවා යාමට කරන අරගලය ඊට ඇතුලත්ය. කඩුල්ල ටෙලි නාට්‍යයේ මතුපිටින් දිවෙන කතා පුවතට අමතරව බටහිරට නතුවීම, කලු සුද්දන් බිහිවීම, පිටරට අධ්‍යාපනය සමාජයේ ප්‍රමුඛ වීම, සමාජ සම්බන්ධතාවල හරය විමසිම මෙන්ම මුදල හා මනුෂ්‍යත්වය අතර සහසම්බන්ධතාවයද ඉන් මැනවින් ඉදිරිපත් කරයි.

එදා සමාජයට කඩුල්ල වඩාත් සමීප නිර්මාණයක් වූ නමුත් වත්මන් සමාජයටද එය නැරඹීමෙන් ලද හැකි රසය අඩුනොවන්නේ එහි අන්තර්ගත සමාජ, දේශපාලනික හා ඉතිහාසමය විග්‍රහය හේතුවෙනි. මේ කිසිවක් අවබෝධකරගත නොහැකි ප්‍රේක්ෂකයෙකු වෙයි නම් ඔහුට ද එය සෞන්දර්යාත්මක නිර්මාණයක් ලෙස රස විඳීමේ බාධාවක් ඇති නොවේ.

යටත් විජිත සමයේ නැගී ආ ව්‍යාපාරික ධනපති පන්තිය තුළ තාන්න මාන්න හා ගරු නම්බු වලට තිබුණු ලොල්කම හා ස්වදේශිකත්වයේ පුරුක් ඉසමතුවීම තුළින් ව්‍යාපාරික ධනපති පන්තියට එල්ල වන පහර මෙම ටෙලි නාට්‍ය තුළින් ඉස්මතු කරයි.

කුරුතේරිස් සිය ස්වාමියා වූ කංකානම් මහත්තයාගේ දුව වූ පොඩිනා සමඟ එක්වීමත්, මිනිරන්, අරක්කු රේන්ද හා රබර් වැනි සුද්දන් අත නොගැසූ කර්මාන්ත හරහා ධනවත් බවට පත්වීමත් එහි නිරූපිතය. ධන බලයෙන් නොනැවතුන කුරුතේරිස් තමාට උපතින්ම හිමි නොවූ පෙළපත් ගෞරවය මුදලින් ළඟා කර ගැනීමට වෙරදරයි. එහි තෙවන පෙළ පරම්පරාව වන කුරුතේරිස්ගේ දූ පුතුන් පිටරට අධ්‍යාපනය ලබා මෙරටට පැමිණ, බටහිර පන්නයෙන් වැසී ඇති සිංහල සංස්කෘතියේ අක්මුල් සොයා යාමට වෙහෙසේ.

**"ඉතිහාසයේ විවිධ යුගයන් නිර්මාණවලට පසුබිම් කරගැනීමේ නව ප්‍රවණතාවක් දැන් ඇතිව තිබෙන නමුත් එකම අච්චුවේ නිෂ්පාදන වල රැල්ලක් ඇතිවීමේ හරයක් නැත. ඉන් කියවෙන්නේ කඩුල්ල වැනි ආකෘතික නිර්මාණ ඇති කළයුතු බව නොවෙයි."**

අද බිහිවන නිර්මාණ වලට වඩා කඩුල්ල රූප ගුණයෙන් හා රංගන කෞශල්‍යයෙන් පරිපූර්ණය. එකම ගෙයකට කොටු වී, එකම කාමරයකට වී දෙබස් මුමුණන චරිත වත්මන් කතාවල බහුලය. ඉන් ඔබ්බට ගොස් සමාජය ස්පර්ශ කරන චරිත දැකගත හැකි නොවෙයි.

වර්තමානය පරිසරයත්, පරිසරය හා මිනිසුන් අතර ඇති සම්බන්ධයත් වෙනස් ව ඇත. පාලම් පාරු ඔරු, කරත්ත යුගය අවසන්ව ගොස් ඇතැයි ඇතෙමෙකු කියන්නට පුළුවන. වර්තමාන බහුතර මධ්‍යම ප්‍රාන්තික ප්‍රේක්ෂකයාට ධනපති ජීවිතය මෙය යැයි කියා හීන පෙන්වන ටෙලිනාට්‍ය බිහි වී තීබේ. පිටරටින් ගෙන්වා පෙන්වන නාට්‍යද එහි මුල් තැන ගනී.

ප්‍රේක්ෂකයාට හීන පෙන්වන අයුරින්ම යථාර්ථය ද පෙන්විය යුතුය. මේ කාර්යයට උරදිය යුත්තේ තිර පිටපත් රචකයින් විසිනි. අදටත් දක්ෂ තිර රචකයන්, අධ්‍යක්ෂක වරුන්, හා නළුනිළියන්ද ක්ෂේත්‍රය තුළ සිටී.

ඔවුන්ගෙන් වැඩක් ගැනීමට තරම් නිෂ්පාදකයන් හා රූපවාහිනී නාලිකා වලට උනන්දුවක් ද නොවේ. ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය තුළ නිරතරම ඇහෙන්නේ මුදල් පිළිබඳ ප්‍රශ්නය.

මුදල ද හරස් නොවන හොඳ මෙන්ම ජනප්‍රිය නිර්මාණයක් බිහිකිරීමට කතා තේමාවන් සොයා ගත යුත්තේ තිර රචකයාය. එවිට නිර්මාපකයාටත්, ප්‍රේක්ෂකයාටත් කඩුල්ලෙන් ඔබ්බට පැන බැලිය හැකිවනු ඇත.

# අක්ෂය





# චාලි ඔස්ටින්, සංගා සහ අර්ජුන පටලැවිල්ල

පසුගිය දා සූරියවැව ක්‍රීඩාංගණයේ දී නිමාවට පත් වූ සිම්බාබ්වේ සමඟ පැවති එක්දින තරඟවලිය පරාජයත් සමඟ මෙරට ක්‍රිකට් ක්‍රීඩාවට කණකොකා හැඬුවාක් වැනි විය. තරඟ පරාජය හේතු කියන්නට විවිධ පිරිස් ඉදිරිපත් විය. ඒ අතර ශ්‍රී ලංකා පිලේ නායකයා පරාජයේ වගකීම ඔවුන් බාර ගන්නා බව තරඟ පරාජයෙන් පසුපැවති මාධ්‍ය හමුවේදී පිළිගනු ලැබූ අතර පසුව ඔහු සිය නායකත්වයෙන් ද ඉවත් වීමට තීරණය කරනු ලැබීය.

ඒ අනුව ටෙස්ට් ක්‍රිකට් කණ්ඩායමේ නායකයා ලෙස දිනේෂ් චන්දිමාල් ද එක්දින හා 20-20 තරඟ නායකයා ලෙස උපුල් තරංග පත් කරනු ලැබී ය. ඒ අනුව සිම්බාබේ කණ්ඩායම සමඟ මේ දිනවල ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ පැවැත්වෙන ටෙස්ට් තරඟයේ නායකයා ලෙස කටයුතු කරන්නේ දිනේෂ් චන්දිමාල් ය.

**"ක්‍රීඩකයන් දස දෙනෙකුගේ පමණ කළමනාකරු ලෙසින් ක්‍රියාකරන චාලි ඔස්ටින් සමග එක් වී කණ්ඩායම තේරීමට "ඇඟිලි ගසන" බවට එල්ලවන චෝදනා ද සංගක්කාර තරයේ ප්‍රතික්ෂේප කර ඇත..**

ක්‍රිකට් තරඟය පරාජයට පත් වූ දිනයේදී එම දිනයේදී එහි සෙවකයින්ගේ ඇඳුම් ගැළවීමේ සිද්ධියක් නිසා උණුසුම් විය. ඉන් පසු ක්‍රිකට් සභාපතිවරයා විසින් එම ආසාධාරණයට පත් සේවකයන් සඳහා සාධාරණය ඉටු කරමින් එසේ ඇඳුම් ගැළවීමට අණ කරනු ලැබූ නිලධාරීන් වැටුප් කපා හරිනු ලැබීය. එම වැටුප සේවකයන්ට වන්දි මුදලක් ලෙස ලබා දෙන්නට තීරණය කරනු ලැබීය. සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ පැවති එක් දින තරගාවලියේ පරාජයත් සමඟ මෙරට ක්‍රිකට් බලධාරීන් සේම හිටපු ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ ද අවධානය මෙරට ක්‍රිකට් දෙසට යොමු විය.

ඒ අනුව මෙසේ දිගින් දිගටම ශ්‍රී ලංකා පිල තරඟ පරාජය වීමට හේතුව සොයන්නට පෙළඹුණු අතර ක්‍රීඩකයන්ගේ කළමණාකරුවන් කවුරුන් ද යන්න සෙවීම තෙක් පුලුල් විය. ඒ අනුව මෙරට ක්‍රීඩකයන් දස දෙනෙකුගේ පමණ කළමනාකරු ලෙසින් ක්‍රියාකරන චාලි ඔස්ටින් සහ ඔහුගේ ව්‍යාපාරික සහකරුවන් යැයි ඇතැම් මාධ්‍ය විසින් හඳුන්වා දෙන ලද රුවා තමාට වැඩ කරන බවත්ය ය. එමෙන්ම චාලි ඔස්ටින් 2004 වර්ෂයේ සිට ඔහුගේ කළමණාකරුවා ලෙස බඳවා ගත් බවත් ඒ ඔහුගේ ක්‍රීඩා දිවිය සාර්ථක කර ගැනීමට හා රාජකාරි කළමණාකරණය කර ගැනීම සඳහා බවත් ජාතික ක්‍රිකට් සමඟ සම්බන්ධයක් නැති බවත් ඔහුගේ ක්‍රීඩකයන් සෙල්ලම් කළා කියලා කළමණාකරුට කිසිදු වාසියක් නොලැබෙන බවත් පවසා ඇත. එමෙන්ම ඔහු ඊට පෙර මහේල ජයවර්ධනගේ කළමණාකරු ලෙස කටයුතු කර ඇති බවත් තමා හා මහේල ජයවර්ධන ඔහු සමග ව්‍යාපාර කටයුතු කරන බවත් පවසා ඇත. ඒවා ක්‍රිකට් වුණේ. මං හිතන්නේ ඒ ගැන පරීක්ෂණයක් පැවැත්විය යුතුයි," යනුවෙන් අමාත්‍ය අර්ජුන රණතුංග මාධ්‍යවේදීන් හමුවේ සඳහන් කළේය.

කෙසේවෙතත්, පාකිස්ථාන සංචාරය පිළිබඳව පරීක්ෂා කළ යුතු අතරම 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ අවසන් තරගයේදී සිදු වූයේ කුමක්ද යන්න සොයා බැලීම සඳහා විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස අර්ජුන රණතුංග අමාත්‍යවරයා ඉල්ලා සිටී. බී.බී.සී සිංහල සේවය සමඟ ෆේස්බුක් අඩවිය ඔස්සේ අදහස් දකවමින් සංගක්කාර 2011 ලෝක කුසලානයේදී ඔහුගේ නායකත්වයෙන් තරඟ වැදුණු ශ්‍රී ලංකා කණ්ඩායම අවසාන මහා තරඟය පරාජය වූයේ මන්ද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට අමාත්‍ය අර්ජුන රණතුංග කරන ප්‍රකාශය පිළිබඳව විමසූ අවස්ථාවේ සංගක්කාර ප්‍රකාශ කර ඇත්තේ, තමන් ද එය අනුමත කරන බව ය.

**"ආසියානු කුසලාන තරගාවලිය පාකිස්ථානයේ හොඳට තිබූ නිසා අයි. පී. එල් තරගාවලියට යවන්න ඕන කියලා චාලි ඔස්ටින් කිව්වා."**
**අර්ජුන**

**"අපි මැරෙන්න ම කියල වගේ යැව්වේ. තාම මගේ ඇගේ වෙඩි උණ්ඩ වැදුණු යකඩ කුඩු තියෙනවා"**
**සංගක්කාර**

ක්‍රීඩකයන් දස දෙනෙකුගේ පමණ කළමනාකරු ලෙසින් ක්‍රියාකරන චාලි ඔස්ටින් සමග එක් වී කණ්ඩායම තේරීමට "ඇඟිලි ගසන" බවට එල්ලවන චෝදනා ද සංගක්කාර තරයේ ප්‍රතික්ෂේප කර ඇත..

මෙසේ ක්‍රිකට් කැළඹීමට පත් කරන චාලි ඔස්ටින් යනු කවුරුන්දැයි සියල්ලන්ටම ගැටලුවකි. චාලි ඔස්ටින් යනු කවුරුන්ද මෙරට ක්‍රීඩා බලධාරීන්ද මෙරට ක්‍රිකට් තුළ ඔහුගේ භූමිකාව අධ්‍යයනය කරනු ලැබීය. එංගලන්තයේ සිට සංචාරකයෙකු ලෙස පැමිණෙන මොහු පසුව මෙරට ප්‍රධාන පෙළේ ක්‍රීඩකයින්ගේ කළමණාකරු බවට පත් වන අතර වර්තමානයේ ඇති වී තිබෙන අර්බුදවලට හේතු සොයන විට ද මොහුගේ නම ඉහළින් ම ඇත. ශ්‍රී ලංකා පිලේ සාමාන්‍ය ක්‍රීඩකයන් සේම නායකත්වය දරූ හා නායකත්වය දරන ක්‍රීඩකයන් ද මොහුගේ කළමණාකරණ රාමුවට හසු වී කටයුතු කර ඇති බව හෙළි වී ඇත. කෙසේ නමුත් වර්තමානයේ ඇති වී ඇති පසුබෑම්වලට හේතුව සොයා යන විට ඒ පිටුපස ප්‍රධාන සාධකයක් ලෙස චාලි ඔස්ටින් හඳුනා ගෙන ඇත.

මහේල ජයවර්ධන සහ කුමාර් සංගක්කාර කණ්ඩායම තේරීමට "ඇඟිලි ගසන" බවට චෝදනා එල්ල වුණි. පසුව බී.බී.සී සිංහල සේවයට අදහස් දක්වමින් එම චෝදනාව හිටපු නායක මහේල ජයවර්ධන හා සංගක්කාර ද ප්‍රතික්ෂේප කළේය. 1996 දී ශ්‍රී ලංකාවට ලෝක කුසලානය දිනා දුන් කණ්ඩායමේ නායක, අමාත්‍ය අර්ජුන රණතුංග සහ 2011 දී ලෝක කුසලාන අවසාන මහා තරඟය දක්වා කණ්ඩායම මෙහෙය වූ කුමාර් සංගක්කාර ඒ දෙදෙනා ය.

පසුගිය දිනක හිටපු සුපිරි පිතිකරු කුමාර් සංගක්කාර ප්‍රකාශ කරනු ලැබුවේ පකිස්ථානයේ ලාහෝර් නුවරදී එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණයක් අවශ්‍ය බව පවසා අත. ප්‍රහාරය එල්ල වී දැනට වසර අටක් ගත වී ඇති බවත් ඒ පිළිබඳ කිසිඳු පරීක්ෂණයක් මේ වනතෙක් සිදු කර නැති බවත් පරීක්ෂණයක් අවශ්‍ය බවත් ඔහු ප්‍රකාශ කර ඇත. "අපි මැරෙන්නම කියල වගේ යැව්වේ. තාම මගේ ඇගේ වෙඩි උණ්ඩ වැදුණු යකඩ කුඩු තියෙනවා" යැයි ප්‍රකාශ කර තිබුණි. එසේම චාලි ඔස්ටින් පිළිබඳ අදහස් දකවමින් ප්‍රකාශ කර ඇත්තේ තමා කළමණාකරුවාට වැඩ නොකරන බවත් කළමණාකරුවාට ක්‍රීඩාවට සම්බන්ධ නැති බවත් පවසන ලාහෝර් ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණය පැවැත්විය යුතු බව පවසයි. මේ ප්‍රකාශය පිළිබඳව ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ආමාත්‍ය අර්ජුන රණතුංග මහතා දැඩි ප්‍රතිචාරයක් දක්වා තිබුණි. ලාහොර් නුවර ප්‍රහාරය පිළබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතු බව පවසන ආමාත්‍යවරයා පවසනනේ ලාහොර් ප්‍රහාරය එල්ල වූ තරඟයේ දී ඔහු කිකට් පාලක මණ්ඩලයේ නොසිටි බවයි. " ආසියානු කුසලාන තරගාවලිය පකිස්ථානයේ හොඳට තිබූ නිසා අයි. පී. එල් තරගාවලියට යවන්න ඕන කියලා චාලි ඔස්ටින් කිව්වා. මම කිව්වා රට පාවා දෙන්න බෑ කියලා.

එතනදි තමයි මාව හිටපු ක්‍රීඩා ඇමති ගාමිණී ලොකුගේ මාව තනතුරෙන් ඉවත් කළේ. ඊට පස්සේ තමයි පකිස්ථාන සංචාරය තිබ්බේ. එහිදී තමයි ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම අනතුරට පත්

සටහන - තිළිණි සිරිවර්ධන

# ක්‍රිකට් ලොව නවමු පෙරළියක්.

## 20/20 ට පළමු 200



ක්‍රිකට් ලෝකයේ තවත් පෙරළිකාර සුපිරි පිතිකරුවෙකු විසින් විස්සයි විස්ස තරඟයකදී ද්විත්ව ශතකයක් වාර්තා කළ පුවතක් විදෙස් මාධ්‍ය පසුග ය දිනවල වාර්තා කරනු ලැබ වා. මෙසේ සුපිරි දස්කම් දක්වා ඇත්තේ ඇෆ්ගනිස්ථාන කණ්ඩායමේ ෂෆ්කුලාෆ් ෂෆාක් වේ. ඔහු මෙම දක්ෂතාව දක්වා ඇත්තේ එරට පැවති ෂ්ර්ටදබ භ්බට්රය්ර ශූරයන්ගේ කුසලාන තරගාවලියේදී බව වාර්තා වේ. කාටීස් ක්‍රිකට් ඇකඩමි කණ්ඩායම සහ කාබුල් ස්ටාර් ක්‍රිකට් සමාජ කණ්ඩායම අතර පැවති තරඟයේ දී ෂෆ්කුලාෆ් ෂෆාක් මෙම දක්ෂතාවය දක්වා ඇත.

මේ වනවිට ජාත්‍යන්තර විස්සයි විස්ස තරඟයකදී වැඩිම ලකුණු රැස්කරගෙන සිටින ක්‍රීඩකයා බවට පත් වී සිටින්නේ බටහිර ඉන්දීය සුපිරි පිතිකරු ක්‍රිස් ගේල් ය. ඔහු පන්දු 66කදී හතරේ පහර 13ක් සහ හයේ පහර 17 ක් සමඟින් ලකුණු 175 රැස් ගෙන ඇත. ෂෆ්කුලාෆ් මෙම ඉනිමේදී හතරේ පහර 16 ක් සහ හයේ පහර 21 ක් සමඟින් ලකුණු 214 ක් රැස්කරගෙන තිබෙනවා.

ඒ අනුව නව වාර්තාවකට හිමිකම් කියන්නට ෂෆ්කුලාෆ් හැකියාව ලැබෙනවා. කාණ්ඩය යටතේ ඕනෑම රටක තිබෙන විස්සයි විස්ස තරඟයකදී ලබාගත් වැඩිම ලකුණු ප්‍රමාණය ලෙසද මෙය වාර්තා පොත් අතරට එකතු වීම විශේෂයි.

මෙම තරඟයේදී සුපිරි ඉනිම ක්‍රීඩා කළ ෂෆ්කුලාෆ්ගේ කාටීස් ක්‍රිකට් ඇකඩමි කණ්ඩායම ලකුණු 351ක් ලබා ගෙන ඇත. කෙසේ වෙතත් පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ කාබුල් ස්ටාර් ක්‍රිකට් සමාජ කණ්ඩායමට රැස්කරගත හැකිවූයේ ලකුණු 107 ක් පමණයි.

(කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ විශේෂ උපාධි පාඨමාලාවේ මුද්‍රිත මාධ්‍ය අධ්‍යයන ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස සංස්කරණය කර ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික් හි මුද්‍රණය කර ප්‍රකාශ කරන ලදී.)